# <u>2022/05/23 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව</u>

2022/05/23 දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 24. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 1. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 2. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 3. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |

**01.** **ආගම සිහි කිරීම**

2022.05.23 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. අද දින අප රටේ පවතින අර්බුධකාරී තත්ත්වය මත වුවද, අද දින සභා රැස්වීමට සපැමිණි ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මෙම රැස්වීම පැවැත්වීමට නියමිතව තිබුනේ පසුගිය 10 වෙනිදා වුවත් පසුගිය 09 වෙනිදා ඇති වූ ගැටළුකාරී තත්වයත් සමඟ අද දිනට සභාව කල් දැමීමට සිදු වුණා. ඒ වගේම පසුගියදා හදිසියේ තම ජීවිතයට සමුදුන් ඉමදූව ගරු සරත් කුමාර මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2022.04.05 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

2022/04/05 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ ඉ(2) යටතේ 03 මිළ ගණන් ඉදිරිපත් කිරීම යටතේ,

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා උපකරණ ලබා දීම වෙනුවෙන් ලබා දී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කොට තිබූ කුමුදු නිශ්පාදන, පිලියන්දල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා උපකරණ ලබා ගැනීම සුදුසු යැයි ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කරන ලදී. යන යෝජනාව පහත පරිදි සංශෝධනය විය යුතුය.

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා උපකරණ ලබා දීම වෙනුවෙන් ලබා දී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කොට තිබූ කුමුදු නිශ්පාදන, පිලියන්දල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා උපකරණ ලබා ගැනීම සුදුසු යැයි ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කරන ලදුව **ඒකමතිකව සහා සම්මත විය.** යනුවෙන් නිවැරදි විය යුතුය.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022.04.05 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. කේ.ජී.සරත් චන්ද්‍ර මයා, සරත්චන්ද්‍ර පදනම, උඩුගම මධ්‍යම, ගා/උඩුගම විසින් නිකුත් කරන ලද සංගීත සංදර්ශනය සඳහා ක්‍රීඩාපිටිය ලබා ගැනීම සම්බන්ධව 2022.05.15 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. සයුර දිය ප්‍රජා ජල සමිතිය, උඩුගම දකුණ, උඩුගම විසින් විදුලිය ලබා ගැනීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද 2022.05.18 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මත වීමෙන් අනතුරුව තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ හා වෙන්දේසි කමිටුව සඳහා මන්ත්‍රීවරුන් 3 දෙනෙක් පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව **ගරු මන්ත්‍රී ගරු උප සභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරන ලදී.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව අනුව අපහරණ හා වෙන්දේසි කමිටුව සඳහා ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය, ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා සහ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා සුදුසු යැයි, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යොජනා කරනු ලදුව ගරු උප සභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. කටඹුරාව හා උඩුගම නැගෙනහිර රන් කැකුළු පෙර පාසලේ පාලිකාවන් දෙපලට දැනට ලබා දෙන රු. 10000.00 දීමනාවට අමතරව රු. 2000.00 ක දීමනාවක් ලබා දීමට යෝජනා කරමි.

**ඉහතසඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරන ලදී.**

**මෙම යෝජනාව සම්බන්ධයෙන් හුදෙක් මන්ත්‍රීවරුන්ගේ අදහස වූයේ කාලීන අවශ්‍යතාවය මත මෙම ඉල්ලීම සාධාරණ බවත්, නමුත් අප ප්‍රාදේශීය සභාවේ පවත්නා මූල්‍යමය තත්වය හේතු කොට ගෙන එම දීමනාව ගෙවීම සම්බන්ධව පසුවට තීරණයක් ගැනීම සුදුසු බව තීරණය වූ බැවින්, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත නොවුනි.**

03. තල්ගස්වල පෙර පාසලේ ප්‍රධාන පාලිකාව වන ඩබ්.එස්.අජන්තා දීපානි මහත්මිය කොන්ත්‍රාත් පදනමින් ප්‍රාදේශීය සභාවට බඳවා ගැනීමට හා රු. 10000.00 ක දීමනාවක් ලබාදීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරන ලදී.**

මේ කාල වකවානුව තුල සේවා අවශ්‍යතාවය මත නව පත්වීම් ලබා දිය නොහැකි බව චක්‍රලේඛ මගින් දැනුවත් කර ඇති බවත්, නීතිමය තත්වය පිළිබව සළකා බලා අදාළ කටයුතු සිදු කරන මෙන් ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා ප්‍රකාශ කරන ලදී.

**එමෙන්ම මෙම යෝජනාව සම්බන්ධයෙන්ද හුදෙක් මන්ත්‍රීවරුන්ගේ අදහස වූයේ කාලීන අවශ්‍යතාවය මත මෙම ඉල්ලීම සාධාරණ බවත්, නමුත් අප ප්‍රාදේශීය සභාවේ පවත්නා මූල්‍යමය තත්වය හේතු කොට ගෙන එම දීමනාව ගෙවීම සම්බන්ධව පසුවට තීරණයක් ගැනීම සුදුසු බව තීරණය වූ බැවින්, එම යෝජනාව ඒකමතිකව සහා සම්මත නොවුනි.**

04. 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ අලවි කිරීමට දිනයක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සම්බන්ධයෙන් 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ අලවි කිරීම සඳහා 2021/05/31 අගහරුවාදා දින පෙ.ව. 10.00 ට සුදුසු යැයි ගරු මන්ත්‍රී එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

05. උඩවැලිවිටිය සංගීත සංදර්ශනය සඳහා අය කල බලපත්‍ර ගාස්තු හා විනෝද බද්දෙන් කොටසක් වන රු. 26300.00 ක මුදල නිදහස් කිරීමට යෝජනා කරමි.
**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරන ලදී.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

06. ගම සමග පිලිසඳර වැඩසටහන යටතේ වෙන් කර ඇති ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතාගේ බල ප්‍රදේශයේ මාර්ග නාමකරණය හා වීථි පහන් සවි කිරීමට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය වන තෙක් එම අරමුදල සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිරකරන ලදී.**
නාම පුවරුවල සඳහන් නම් වැරදි සහගත බවත්, එක මාර්ගයක එක නමකින් යුත් නාම පුවරු 02 ක් සවි කර ඇති බවත්, නම්වල අඩුපාඩු සහිතව නාමපුවරු සවි කර ඇති බවත්, ඒවා නිවැරදි කර ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙසත්, ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මුදල් ප්‍රතිපූර්ණය වූ පසු ගෙවීම් කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී.
**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ඒකමතිකව සහා සම්මත නොවුනි.**

**07. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 26 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

<u>**2022.05.23** වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව</u>

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2022 අප්‍රේල් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 78,000.00

II. සභාපතිතුමාගේ රාජකාරී අවශ්‍යතාවයන් සඳහා SPPF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1,600.00

III. සභාව සතු SPLL 7366 හා SPLL 7650 දරන වාහන සඳහා රක්ෂණ වාරික හා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරමක් ලබා ගැනීම - රු.20,000.00

SPLL 7366 ට්‍රක් ජල බවුසරයේ රක්ෂණය ලබා ගැනීම සඳහා
SPLL 7366 ට්‍රක් ජල බවුසරයේ තත්ව සහතිකය ලබා ගැනීම සඳහා
SPLL 7366 ට්‍රක් ජල බවුසරයේ දුම් වාර්තාව ලබා ගැනීම සඳහා
SPLL 7366 ට්‍රක් ජල බවුසරයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා
SPLL 7650 කෘ කැබ් රථයේ රක්ෂණය ලබා ගැනීම සඳහා
SPLL 7650 කෘ කැබ් රථයේ දුම් වාර්තාව ලබා ගැනීම සඳහා
SPLL 7650 කෘ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා

**02. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10,451.20

**03. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය, ඇල්පිටිය**

මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීම සඳහා කාර්යාල දීමනා ගෙවීම - රු. 800.00
**(2022/01/06, 01/26,01/27 සහ 2022/02/05,02/26)**

**04. නීතිඥ හේමන්ත විතාරණ, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව**

L- 15888 නඩුවට අදාළව 2022/01/12 තීන්දුව ලබාදීමේ නීතිඥ ගාස්තු - රු. 2,500.00

**05. කේ. ටී. ආර්. ජී. උමාල් කිරිඇල්ල, ගෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

PF 7360 අංක දරණ කැබ් රථයේ රෝදවල ඇණ සවි කිරීමේ බිල්පත පියවීම - රු. 3,250.00

**06. ආර්.ඒ. දිල්ශාන් මයා, ශාන් මෝටර්ස්, මාපලගම මධ්‍යම**

SPLL 7650 කෘ කැබ් රථයේ ගැලවී ඇති ජියර් ලිවර් එක සවි කිරීමේ බිල්පත - රු. 1,600.00

**07. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, සමගිගම, උඩුගම දකුණ, ගා/උඩුගම**

2022 අප්‍රේල් මාසය තුළදී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම - රු. 4,430.00

**08. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2022 අප්‍රේල් - රු. 5,850.00

**09. බී.ජේ.කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2022 ජනවාරි | - රු. 5,520.00 |
| 2022 පෙබරවාරි | - රු. 4,840.00 |

**10. එම්.ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2022 ජනවාරි | - රු. 2,510.00 |
| 2022 පෙබරවාරි | - රු. 2,320.00 |
| 2022 මාර්තු | - රු. 2,540.00 |
| 2022 අප්‍රේල් | - රු. 2,060.00 |

**11. ඒ. කේ. නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත**

I. 2022 අප්‍රේල් මස සභා වාර්තාව පිටපත් 28 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා - රු. 2,366.00

II. 2022 අප්‍රේල් මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු. 27,500.00

**12. ජයන්ත ඉලේපෙරුම ආරච්චි, ජේ.පී. කමියුනිකේෂන් ඇන්ඩ් බුක්ෂොප්, නාගොඩ, ගාල්ල**

නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ ඇති පුස්තකාල 3 සඳහා පුස්තකාල ආකෘති පත්‍ර මිළදී ගැනීම - රු. 34,717.00

**13. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා මැයි මස බදු කුලිය ගෙවීම - රු. 6,000.00

**14. ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා

| විස්තරය | ලීටර් ප්‍රමාණය L | මුදල |
|---|---|---|
| PF 7360 කැබ්රථය | ඩීසල් 449 | 71,929.00 |
| LL 7650 කෘ කැබ් රථය | ඩීසල් 165 | 26,015.00 |
| LL 7366 ට්‍රක් ජල බවුසරය | ඩීසල් 150 | 20,900.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් 190 | 27,390.00 |
| RA 8570 ට්‍රැක්ටරය | ඩීසල් 40 | 7,040.00 |
| QL 7145 ත්‍රී රෝද රථය සඳහා ( ජලභීතිකා රෝග මර්ධනය සඳහා) | පෙට්‍රල් 39 | 8,828.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා | පෙට්‍රල් 25 | 4,425.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා | 2T ඔයිල් 1 | 750.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා | ඩීසල් 60 | 7,260.00 |
| සභා වාර්තාව බෙදා දීම සඳහා | පෙට්‍රල් 10 | 2,155.00 |
| **එකතුව** | | **176,692.00** |

**15. විජයසිරි ගිෆ්ට් සෙන්ටර්, යටලමත්ත**

ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය හීටර් ජග් එකක් මිළදී ගැනීමේ බිල්පත - රු. 1,900.00

**16. දයානි පුද්ගලික සමාගම,මාපලගම**

තණකොළ කපන මැෂින් 02 ක් ලබාගැනීම සඳහා බිල්පත - රු. 39,500.00
(02 × 19750.00)_

**17. සන්සේයා ස්ටුඩියෝ,යූ.ජී.චානක මයා, නාගොඩ**

කාර්යාල නිලධාරීන්ගේ රාජකාරි හැඳුනුම්පත් ලබාගැනීම සඳහා -රු.9,100.00

**18. සේවක ණය**

**දස මස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා ගැනීම**

පී.කේ. මදූශානි වාසනා -කළමණාකරණ සේවා නිලධාරී - රු. 250,000.00

**19. <u>2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4,000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6,200.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3,135.00 |
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3,959.00 |
| නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3,200.00 |
| අනූෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 1,340.00 |

**20. <u>2022 අප්‍රේල් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 3,000.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1,860.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 4,200.00 |

**21. <u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2022 අප්‍රේල් මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9,136.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 6,313.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 3,745.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.11,200.00 |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 3,434.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - රියදුරු | - රු. 8,453.00 |
| ජී.එල්.උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1,664.00 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 832.00 |
| අයි.කේ. ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3,150.00 |
| යූ.ජී.රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3,078.20 |
| ඩබ්.ජී. දයානන්ද මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 5,913.00 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 5,885.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7,491.00 |
| ඩී.සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 2,016.00 |
| හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1,212.00 |

**22. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2022 අප්‍රේල් ) - රු.1 4,500.00

<u>පොදු අරමුදල්</u>

**23. කේ. අසංක සංජීව, අසංක කන්ස්ට්‍රක්ෂන්, උඩවැලිවිටිතලාව, නාගොඩ**
මාපලගම ළමා උද්‍යානයේ උද්‍යාන බිම් සකස් කිරීමට අදාළව මිළදී ගත් ගල් කුඩු සඳහා ගෙවීම ගල් කුඩු කි. ½ - රු. 7,000.00

**24. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
මාපලගම ළමා උද්‍යානය හා මාපලගම මහජන ක්‍රීඩාංගනයේ නාමපුවරු සවි කිරීමට අදාළව මිළදී ගන්නා ලද උපකරණ සඳහා ගෙවීම - රු. 750.00

**25. මුරගල ඇඩ්වර්ටයිසින් ඇන්ඩ් ක්‍රියේෂන්, කරාපිටිය පාර,බෙලිගහ හංදිය**
මාපලගම ළමා උද්‍යානය හා මාපලගම මහජන ක්‍රීඩාංගනයේ නාමපුවරු සකස් කිරීමට අදාළව ගෙවීම - රු. 14,275.00

<u>රජයේ ආධාර</u>
**ගම සමග පිළිසඳර 2022**
**26. මුරගල ඇඩ්වර්ටයිසින් ඇන්ඩ් ක්‍රියේෂන්, කරාපිටිය පාර, බෙලිගහ හංදිය**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාමුව සහිත මාර්ග නාමපුවරු 24 ක් සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම (රු. 8300.00x 24) -රු.199,200.00

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් අංක 1 – 26 දක්වා ඇති ඉදිරි ගෙවීම් වලින් 26 වැනි බිල හැර ඉතිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ) 2. රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා .**

08. කොතලාවල නො.05 කොටසේ පිහිටා ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථානය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතාන මහතා විසින් ස්ථිරකරන ලදී**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සම්බන්ධයෙන් අදහස් වූයේ මෙය අයත් වටවල වැවිලි සමාගම සමග සාකච්ඡා කොට ඉදිරියේදී කටයුතු කරන බවට තීරණය වූ , වූ බැවින්, එම යෝජනාව ඒකමතිකව සහා සම්මත නොවුනි.**

09. රට තුල පවතින අර්බුදකාරී වාතාවරණය නිසා හදිසි අවස්ථාවලදී යන්ත්‍ර සූත්‍ර හා වාහනවල භාවිතයට ගැනීම සඳහා අමතරව පෙට්‍රල් ලීටර් 50 ක් හා ඩීසල් ලීටර් 100 ක් මිළදී ගැනීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරන ලදී**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

10. මුලන , නාගොඩ ලිපිනයේ පදිංචි එම්.ජී.ලක්ෂමන් මහතා විසින් ඔහුගේ නිවසට අනතුරුදායක ලෙසින් පැවති ඇල්බීසියා ගස් 04 ක් ඉවත් කිරීම සඳහා රු. 2000.00 ක මුදලක් 2022.05.04 දින ගෙවීම් කර ඇති බවත්, ගස් අයිති පුද්ගලයා විසින් එම ගස් 4 2022.05.06 දින කපා ඉවත් කර ගෙන ඇති බවත්, ගස් ඉවත් කිරීම සම්බන්ධයෙන් සභාව

සම්බන්ධ නොවූ බැවින් සභාව වෙත ගෙවීම් කල රු. 2000.00 ක මුදල නැවත ලබා දෙන ලෙස මා වෙතින් ඉල්ලීම් කර ඇති බැවින්, සභා අනුමැතියට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දුමහතා විසින් ස්ථිරකරනලදී.**

සභාව මගින් අයදුම්පත්‍ර පුරවලා, ලදු පත් නිකුත් කල පසු නැවත ඒ මුදල ගෙවීම් කරන්න කියලා ඉල්ලීම් කරන්න බැහැ. මොකද එසේ වුවහොත් මෙම ආයතන පවත්වා ගෙන යා නොහැකි බවත් ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා සහ ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

11. වළකුඹුර ආදාහනාගාරය ඉදි කිරීම ප්‍රගතිය පිළිබද සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සභා අනුමැතිය සදහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.
**ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිරකරනලදී.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

12. තල්ගස්වල වෙළද සංකීර්ණය ඉදිකිරීම අදියර 1 ප්‍රගතිය පිළිබද සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සභා අනුමැතිය සදහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.
**ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිරකරනලදී.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

13. නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ පවතින පෙර පාසල් 14 සදහා වර්තමානයේ පෙර පාසලේ නම සදහන් නාම පුවරු නොමැති බැවින් එම නාමපුවරු සකස් කර ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.
**ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රීනි නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිරකරනලදී.**

**සභාවේ පවතින මූල්‍ය තත්වය හේතුවෙන් නාමපුවරු සකස් කිරීම පසුවට කල් තබන බව සභාවේ තීරණය විය.**

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

14. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් දැනට බදු දී ඇති පහත කඩ කාමර දකුණු පළාත් කොමසාරිස් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක දපපා/පපාකො/210/01 ප්‍රකාරව බදු කරුගේ ලිඛිත ඉල්ලීම මත වෙනත් පාර්ශවකරුවකු වෙත බදු අයිතිය පැවරීම යන මාර්ගෝපදේශය යටතේ පවරා දීම සුදුසුයැයි ගරු සභාවට වෙනත් පාර්ශවයන්ට පවරා දීමට අදාළ යෝජනාව ගරු සභාවට යෝජනා කරමි.

| කඩ කාමරය | වර්තමාන බදු හිමිකාරීත්වය දරණ ව්‍යාපාරිකයා | ඉදිරියේදී පවරා දෙනලෙස ඉල්ලුම් කල පුද්ගලයා |
| --- | --- | --- |
| 01. තල්ගස්වල පැරණි කඩ කාමර අංක 1 හා 2 , | කේ.කේ.ජී.ගුණපාල මයා | එල්.ජී.දයානන්ද (ඥාති සහෝදරයා) |
| 02. තල්ගස්වල පැරණි කඩ කාමර අංක 05 | එන්.වී.පියසේන මයා | එන්.වී. ගුණපාල මයා (සහෝදරයා) |
| 03. මාපලගම වෙලද සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර අංක 02 | ඒ.කේ.රුක්මන් මයා | එච්.ජී.චමින්ද කුමාර මයා (ඥාති සහෝදරයා) |
| 04. මාපලගම පැරණි කඩ කාමර අංක 02 | විල්සන් කැටිපෙආරච්චි මයා | ඒ.කේ. උමේෂ් එරංග ජයසේක (මුණුබුරා) |

**ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිරකරනලදී.**

මෙ සම්බන්ධව අජිත් එඩේරආරච්චි මහතා අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ , එම කඩ කාමර සම්බන්ධව ගිවිසුමක් නොමැති බවත්, එම කඩ කාමර ගම් සභා කාලයේදී ලබා දී ඇති බවත්, සදහන් කරන ලදී.
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ, කඩ කාමර පවරා දීම සම්බන්ධව බලතල පිළිබද චක්‍රලේඛයක් පවතින බවත්, ඒ අනුව කටයුතු කරන ලෙසත්ය.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**15.** නාගොඩ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන අංශය තුල පවතින අධික අව් රශ්මිය හේතුකොට ගෙන නිලධාරීන්ට ඇති වන දැඩි අපහසුතාවය නිසා සිවිලිමක් සකස් කිරීම සදහා මා වෙතින් ඉල්ලුම් කර ඇති බැවින්, සිවිලිමක් සකස් කර දීමට යෝජනා කරමි.

**ඉහතසදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනලදී.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**02.ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. උඩුගම සතිපොළේ කඩ කාමර ප්‍රතිසංස්කරණය කිරීම - අදියර III -රු. 500,000.00
02. කොතේගොඩකන්ද මාර්ගයේ ඒ.කේ.කමලාවතී මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය හරහා සිලින්ඩර් යොදා සංවර්ධනය කිරීම - රු. 140,000.00

**ඉහත සදහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**03. මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**ටොෂිබා ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සදහා මිළ ගණන් කැඳවීම**

ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ් රු. 129441.24

**ටොෂිබා ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සදහා ලැබී තිබූ එකම මිළ ගණන වන ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ටොෂිබා ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කරනු ලදුව, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා වි◌ිසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.05.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

නැත.

**(ඌ) වෙනත් කරුණු**

**වෙනත් කරුණු**
**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. පළමුවෙන්ම මම පසුගිය 09 වෙනි දින අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරාල මැතිතුමාගේ අභාවය පිළිබඳව සහ ඒ ගැටුමත් සමඟ මියගිය සහ දේපල හානි වූ සියලු දෙනා සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වගේම දේපළ හානි වූ අපේ සහෝදර ලක්රුවන් මන්ත්‍රීතුමා හා සුභාෂි මන්ත්‍රීතුමිය ප්‍රධාන සියලු දෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරමින්, සභාවට අලුතින් මන්ත්‍රීවරියක් ඇවිල්ලා ඉන්නවා. එතුමිය පිළිගනිමින් එතුමියට සුභ පතනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම සභාවට ඇවිත් ලොකු දෙයක් ඉගෙන ගත්තා. සමාජයේ වටපිටාව පිළිබඳව හා දේශපාලනය පිළිබඳව අවබෝධයක් තිබුනෙ නැති කෙනෙක් මම යම් අවබෝධයක් ලබාගත්තා. ඒ පිළිබඳව මම සතුටට පත්වෙනවා. ඒ වගේම පහුගිය දවස්වල දී සිදුවුණු සිදුවීම් එක්ක ඉදිරියේ දී මේ දේශපාලනය කරන්න බැරි බව මට තේරුණා. නමුත් මීට පෙරත් නැවත දේශපාලනයට එන්නේ නැහැ කියන මතයේ මම හිටියේ. මට ඒක ගෞරවයක් ලෙස ස්ථිරවම ප්‍රකාශ කරන්න පුළුවන් වෙනවා. අද වන විට ඉල්ලීම් කිහිපයක් උඩ අපට මේ දේශපාලනය කරන්න බැහැ. මම තවම ගියේ සුභාෂි මන්ත්‍රීතුමියගේ නිවසට පමණයි. මම ඒ සිද්ධිය දැක්කම දුක් වෙනවා, මගේ නිවසට ගහන්න ආපු නැති එක සම්බන්ධව. මොකද එහෙම වුනානම් මට උගන්වන්න තිබුණා. ඒ කරපු අයට මොකක්ද කරන්න ඕන දඬුවම කියන එක. මම දැක්කා දේශපාලනයෙන් කිසිම දෙයක් හම්බ කරගත්තෙ නැති මිනිස්සුන්ගෙ දේපළ හානි කළා. මම මෙච්චර දවසක් ගිහිල්ලා, ප්‍රාදේශීය සභාවේ මුදල්, කොන්ත්‍රාත් කරන මුදල්වත් අරගෙන, ගේ දොර හදාගත්තෙ නැත්නම්, ඒ ගෙවල් දොරවල් කඩන්න මේ මිනිස්සුන්ට අයිතියක් තියනවනම්, මේ නීතිය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, අපි මොකටද දේශපාලනය කරලා, තවත් ඒ මිනිස්සුන්ට උදව් කරන්නේ මොකටද? මම තීරණය කළා මීට පස්සේ මේ දේශපාලනය හරහා කිසිම සමාජ සේවා කටයුත්තක් කරන්නේ නැහැ කියලා. එහෙම නම් හොරකම් කරන්න බලාගෙන තමයි අපිත් මේ සභාවට එන්න ඕන. හැබැයි සභාපතිතුමනි, ඔබතුමා මේ අවුරුදු 4 ම හොරකම් කළා. මම ඒක ප්‍රසිද්ධියේ කියනවා. මේ ඉදිරි ගෙවීම් වාර්තා වලට අනුමැතිය දුන්නේ ඔබතුමා ඉදිරිපත් කරපු නිසා. ඒ එකකටවත් අපට විරුද්ධ වෙන්න බැරි වුණා. මොකද පොදුජන

පෙරමුණේ මන්ත්‍රීවරයෙක් නිසා. ඒ ගෙවපු හැම මුදලක්ම අපි හොරකම් කරලා තියෙන්නෙ. ඉතින් අපි වංචා කරලා තියෙන්නේ. කිසි දෙයක් හොයන්නෙ බලන්නෙ නැතිව අපි ස්ථිර කළා. රාජ්‍ය නිලධාරීන්ගේ ඉඳලම වංචා සිදු වෙනවා. ප්‍රාදේශීය ලේකම් එකේ ඉඳළම වංචා වෙනවා. අපි ඕවා දැකලා තියෙනවා. මෙහෙන් අපි කිසිම දෙයක් වංචනිකව අරගෙන නැහැ. ඔබතුමාගෙන් මම බලාපොරොත්තු වුණා. සභාවට ඇවිල්ලා සභාපති වරු දෙන්නෙක් වශයෙන්, උප සභාපතිතුමා සහ ඔබතුමා ඉදිරිපත් වෙනකොට, අපි ඉල්ලීමක් කළා. සභාපතිතුමනි, ඔබතුමා පළවෙනි අවුරුදු දෙක ගන්න. ඉතිරි අවුරුදු දෙක උප සභාපතිතුමාට දෙමු කියලා. නමුත් ඔබතුමා බලය අත්හැර දැමීමේ ලෝභකම නිසා, ඔබතුමාට අත්හරින්න බැරි නිසා, ඔබතුමා සභාපතිධූරත්වයදුන්නෙ නැහැ. උප සභාපතිතුමනි, සමාවෙන්න. යම් හෙයකින් ඔබතුමාට බලය නොදීම නිසා අපි දුක් වෙනවා. එහෙම දීලා, බලය බෙදා ගෙන යන ගමනක් අපේ සභාවෙ තිබුණෙ නැහැ කියලා අපි කණගාටු වෙනවා. අපි තව දෙයක් කියන්න ඕන. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා රට විනාස කළා වගේම, ඔබතුමා මේ සභාව විනාශ කළා. ඔබතුමා පත්වුණාට පස්සේ තමයි මේකෙ නිසි පරිපාලනය නැති වුණේ. ඔබතුමාට පෙර කොමසාරිස් පාලන කාලේ ලේකම්වරියක් ඉතා හොඳින් කටයුතු කරගෙන ගියා. හැබැයි ඔබතුමා පත්වුන දවසේ ඉඳලා මේ සියල්ල අකර්මණ්‍ය වුණා. කිසිම නිලධාරියෙක් කියන දෙයක් අහන්නේ නැති වුණා. කිසිම මන්ත්‍රීවරයෙක් ගණන් ගන්නේ නැති තත්ත්වයට පත් වුණා. මම ආධුනික මන්ත්‍රීවරයෙක් මේවට අත ඉස්සුවෙ ඇත්තටම. මීට පස්සෙ ඔබතුමාට යම් නායකත්වයක් ලැබුන නම්, එවැනි දේවල් වෙන්න දෙන්න එපා. මේ සභාව ඉවරෙටම ඉවරයි. දැන් මේ සභාවෙන් සිදුවන සේවයකුත් නැහැ.  ලයිට් එකක් දානවා හැරෙන්න, මගේ ගමට වෙච්ච සේවයක් නැහැ.  සභාවේ කම්කරුවො ඉල්ලුවම, වැඩකට එවන්නේ නැහැ. පිට්ටනියෙ තණකොළ ටිකක් කපා දුන්නා. මම ඊට වඩා පෞද්ගලිකව, මගේ මුදල් වියදම් කරගෙන, මේ ශ්‍රමදාන කරලා තියෙනවා. සභාවේ කම්කරුවෝ වෙලාවට එනවද? ඒව බලන්න නිලධාරියෙක් යෙදෙව්වද? ඒ පිළිබඳ සියලුම දේවල් ක්‍රියාත්මක කළේ නැහැ. ඔබතුමා සභාව විනාශ කළා. ඔබතුමා ඒ වගකීම ගන්න කියලා ඉල්ලා සිටිමින්,  මේ මොහොත් මට විවාහ මංගල උත්සවයකට සහභාගි වීමට ඇති නිසා මම සභාවෙන් බැහැර වෙනවා. මේ මාසේ මගේ පඩිය ලක්රුවන් මන්ත්‍රීතුමාට දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද සුභාෂි මන්ත්‍රීතුමියට වඩා ලක්රුවන් මන්ත්‍රීතුමා තමයි මේ අවස්ථාවේ දැඩි ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන්නේ. මම මීට වඩා ඔහුට උදව් කරන්න ඕන. එතුමාගේ පුංචි දරුවන්ගේ රෙදි ටික පවා කපලා ගිහිපු අසික්කිත ජාතියක් තමයි ඉන්නෙ. එවැනි මිනිස්සුන්ට උදව් කරන්න මම මේ දේශපාලනයේ ඉන්නේ නැහැ. මේ සභාවෙන් සමුගනිද්දී, නැවතත් මගේ දීමනාව ආදරණීය ලක්රුවන් මන්ත්‍රීතුමාට දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ප්‍රාදේශීය සභාවක මහජන නියෝජිතයෙකු වශයෙන් පත් වෙන්න ලැබීම ගැන, මම අද දිනයේ ලැජ්ජාවට සහ කම්පාවට පත් වෙන දවසක්. මම දේශපාලනය පටන් ගත්තේ 1998 වර්ෂයේ එවිට මට අවුරුදු 18යි. අපි එදා ඉඳන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වමේ කණුව නියෝජනය කරමින්, වාමවාදී දේශපාලන කඳවුර නියෝජනය කරමින්, ඉදිරියට යන පවුලක් වශයෙන්, අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වය දෙමින්, අපි අපේ දේශපාලන කටයුතු ඉතාමත් සාමකාමී, සහ නිවැරදි දේ නිවැරදි ව දකිමින්, වැරදි දේ වැරදි ලෙස දකිමින්, අපි දේශපාලනය කළා. 2015 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපතිධූරය නැතිවීමත් සමඟ, අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපට යන්න බැරි තැනකදී, එදා හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඇවිල්ලා කටයුතු කරන කොට, එකල හිටපු සභාපති හේමචන්ද්‍ර විලේ ගේ මැතිතුමා, හිටපු සභාපති අජිත් එඩේරආරච්චි මැතිතුමා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙ අපට නායකත්වය දුන්  නායකයෝ වශයෙන් හඳුන්වන්නන පුළුවන්. මම

මේ ඒ දේශපාලනයේ මෙතන ඉන්නේ මගේ මේ සහෝදර අජිත් එඩේරආරච්චි මැතිතුමා මට දේශපාලනයට එන්න කියලා ආරාධනා කළ නිසා. මම සතුටු වුණා. අපි එදා ඉඳලා මිනිස්සුත් එක්ක එදා වගේම කටයුතු කරලා, මිනිස්සුන්ට උදව් කළේ, වාමවාදී කඳවුරු හදලා නියෝජනය කරන සියලු බලවේග එකතු කරමින්. අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුන 2008.02:10 ජයග්‍රහණය කරලා, ඔබතුමා මේ පුටුවෙ ඉන්දන කොට අපට කරන්න බැරි දෙයක් නැහැ කියලා අපි හිතුවා. මහා මානසිකත්වයක් අපේ හදවත් තුළ ඇති වුණා. කණගාටුවෙන් වුනත් කියන්න කැමතියි. අද වෙනකොට අසාර්ථක ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා ගේ භූමිකාව, ඒ වැරදි නාමය සභාපති වරු පෙළ ගැස්මේ පළවෙනියා වශයෙන් ඔබතුමාව දක්වන්න පුළුවන් කියන එක මම මේ අවස්ථාවේදීත් කියන්න කැමතියි.

අපි එතනින් නැවතුණේ නැහැ. මේ සභාව හොඳ මාවතකට ගේන්න අපි සටන් කලා. විධිමත් සභාවක් වශයෙන් පත් කරන්න අපට පුළුවන් වුණා. අපට තිබෙන දැනීමත් එක්ක, අපි මේ සභාවේ ආදායම් උත්පාදනය වෙනුවෙන් කතා කළා. අද වන විට එක රුපියලක්වත් සභාවට ආදායම් උත්පාදනය වශයෙන් ඔබතුමාට ගන්න නොහැකි වෙලා තියෙනවා. ඒ නොහැකියාව නිසා තමයි අද 27 දෙනෙක් ඇවිල්ලා, පඩි පැකට් එක විතරක් අරන් යන තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. ලැජ්ජ නැතුව රෙද්දක් ඇඳගෙන එන්න බැහැ. ඒ තැනට පත් කළේ ඔබතුමා. අපි එයින් නැවතුනේ නැහැ. කොහොමහරි 2019 වර්ෂයේ ගෝඨාභය රාජපක්ෂ මේ රටේ ජනාධිපතිවරයා කරන්න පාරක් පාරක් ගානේ, ගෙයක් ගෙයක් ගානේ ගිහිල්ලා, අපේ කඳවුර ශක්තිමත් කරන්න, අපි 69 ලක්ෂ ඡන්දයකින් ජනාධිපතිවරයෙක් බිහි කරන්න අපි කටයුතු කළා. කියන්න ලැජ්ජයි. සෞභාග්‍යයේ දැක්ම කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ගෙනැල්ලා, මේ රට මුලින්ම කාබාසිනියා කරන්න ගත්තේ, අසරණ ගොවි ජනතාවගේ පොහොර ටික දෙන්නෙ නැතිව. අපි කණ්ඩායම් රැස්වීම්වලදී කිව්වා. අපේ ලොකු උන්නැහේලට ගිහිල්ලා කියන්න කියලා. සත පහකට මායිම් කරන්නේ නැතුව ගොවියා අසරණතාවයකට පත් කරලා, තේ වගාව කරන මිනිස්සු අපහසුතාවයට පත් කළා. මේ රටේ ආර්ථිකය විනාශ කරලා, බදු ආදායම් අහිමි කරලා, මේ සියලූ ආදායම් නැතිවීමේ තත්වයට පත් කරලා, අද අපට ආණ්ඩුවක් නැතිවීමේ තත්වයට පත් කළේ, මේ ගෝඨාභය රාජපක්ෂ කියන ජනාධිපතිතුමා. අපට ලැජ්ජයි සභාපතිතුමා, මෙහෙම කතා කරන්න. නමුත් අද අපි ඇත්ත දකිනවා. මෙච්චර කාලයක් වචනයක්වත් කතා කරන්න, අපේ නායකයෝ ආවෙ නැහැ. ඒ කොහොම වුනත්, අද මේ රට පත්වූ තත්වය සම්බන්ධයෙන්, මිනිස්සු විඳිහට, මිනිස්සු විඳින දුක, මිනිස්සු මහපාරට දාලා, මේ ආණ්ඩුවක් වශයෙන් කනගාටුදායක හා ලැජ්ජාශීලී විය යුතුයි. අද අපට මහජන නියෝජිතයො විදිහට පාරක යන්න බැහැ. කඩපිලකට, සෙනඟක් ඉන්න තැනකට යන්න බැහැ. මම හිතන විදිහට මේ දේශපාලන ඉතිහාසයේ කවදාවත් මෙච්චර පීච්චං යුගයක් මන්ත්‍රීවරයෙක් නම් අත්වින්දේ නැහැ. කොරෝනා වසංගත තත්ත්වය අවස්ථාවේ ජනාධිපතිතුමා නිවැරදි තීන්දුවක් අරගෙන, එන්නත්කරණ කටයුතු කරවලා, රට වැසියන් ආරක්ෂා කළා. ඒ වෙනුවෙන් කෘතවේදීභාවය පුදකරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. රාජ්‍ය නායකයෙක් කියන්නෙ පවුලක් නෙවෙයි. මේ පවුල් පාලනයට විරුද්ධව මම හඬ නැගුවා. ඒ කිසිම දෙයක ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ. මේ නිර්පාක්ෂික අරගලයක් කියලා පටන් ගත්තා. ඇත්තටම ජනතාව එළියට ආපු එක සම්බන්ධව අපි සතුටු වෙනවා. මේ හදවතේ පැසව පැසව තිබ්ච්චි දේ තමයි අරගලයක් බවට පත් වුණේ. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න කැමතියි. දේශපාලන අරගලයක් බවට පත් කරන්න, ජනතා විමුක්ති පෙරමුණ, පෙරටුගාමී සමාජවාදී පක්ෂය මේ රටේ වෛරය, භීෂණය පතුරුවලා, 1988 යුගයට ගෙනිහිල්ලා, අද වන විට ජනතාව බියෙන් සැකෙන් ඉන්න යුගයක් බවට පත් කළේ මේ දෙපළ. එහෙමනම්, ගිය මාසේ 9 වැනිදා අරලියගහ මන්දිරයට අපි ගියේ නැහැ. අපට රෙද්දක් ඇඳගෙන යන්නත් පුලුවන් අපේ නම් එප්බී ගියත් නැහැ. අපට ඡන්දය දුන්න පුද්ගලයන්ට ආත්ම ගරුත්වයක් ඇති වන විදිහට කටයුතු කරන්න අපට පුළුවන් වුණා. ඒ අරගලයට පහරදීම මන්ත්‍රීවරයෙක් විදිහටත්, පුරවැසියෙක් විදිහටත් අපි අනුමත කරන්නේ නැහැ. ඒ සිදුවීම වලක්වා ගන්න තිබුණා. එම සිද්ධියේදී ගැහුවට ගැහුව කියන්නකො. ඒක එතනින් ඉවර වුණේ නැහැ. භීෂණය ඇති කරලා, ගෙවල් ගිනි තියලා, ඇදිවත ගිනිතියලා, ලමුන්ගෙ පොත් පත් විනාශ කරලා, මේ රට ඒ

තත්ත්වයට 88 89 යුගයට පත් කරන්නේ පෙරටුගාමී සමාජවාදී පක්ෂය කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමතියි. ඒ කෙසේ වුවත් මේ රටේ පෙරටුගාමී පක්ෂය හා අන්තරේ කියන මහ කාලකන්නි පිරිසකුයි, මේ රටේ හැම ආණ්ඩුවක්ම ඇදලා දාන්න, යන දුර කෙටි කරන්න කකුලෙන් අදින්න කටයුතු කරමින් ඉන්නවා. කණගාටුදායකයි. මේ වෙලාවේ ආණ්ඩුවක් අරගෙන රනිල් වික්‍රමසිංහ තනි මන්ත්‍රීවරයා විදිහට පත්වෙලා තියෙනවා. නායකයෝ බිහිවෙන්නේ අරබුදයත් එක්ක. නමුත් මේ වෙලාවේ අපි හිතන්න ඕන. අපි සහ අපේ රටේ පුරවැසියන් පිළිබඳ ප්‍රශ්නයක් මෙතන තියෙන්නේ. වර්තමාන බල අරගලයක් බවට පත් කරන්න වෙහෙසෙන්නේ ඇයි? මේ මිනිස්සු ඉස්සෙල්ලා රට ගැන හිතන්න. එවන් වටපිටාවක තමයි අපේ රට තියෙන්නේ දැන් අපට ව්‍යාපාර කරගන්න අපහසුයි. අපි, තරංග මන්ත්‍රීතුමාලා තෙල් ගන්න පෝලිමේ ඉන්නවා. අපි සමහරදාට බස් එකේ එනවා. තෙල් නැතුව. මම තෙල් සංස්ථාවේ, නමුත් මට තෙල් ලීටරයක් ගන්න විදිහක් නැහැ. අපිට අපේ ව්‍යාපාර කරගන්න බැරි තත්වයට පත්වෙලා තියෙනවා. ගොවිජනතාවට පොහොර ටික නැතුව, හාල් කිලෝ එකක් රුපියල් 200.00 යන තැනට පත් කලේ කවුද? ඉතින් මේ සියලු කාරණා එක්ක කතා කරන්න ඕන තත්වයට පත්වෙලා තියෙනවා. මෙතෙක් කල් අපි නිහඬව සිටියා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ සභාව ඓතිහාසික සභාවක් බවට පත් වෙනවා. ඊළඟ සභාවේ 27 දෙනෙක් එන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ පරිපාලනය බිංදුවට බැහැලා. මේක අසාර්ථක පාලනයකට, අසාර්ථක තත්ත්වයකට ගෙනියන්න නොදී ඔබතුමා මොනතරම් කටයුතු කළත්, ඔබතුමා එය නිවැරදිතාවයකට පත් කරන්න කටයුතු කළේ නැහැ. එක එක්කෙනාට ඕන විදිහට කටයුතු කරන්න ඉඩ හැරලා, ඔබතුමා බලාගෙන හිටියා. ඒක නෙවෙයි ඔබතුමාගේ භූමිකාව විය යුත්තේ, තෙල් ලීටර් 600ක් දීලා, කැබ් එකක් දීලා, ඔබතුමා නඩත්තු කරන්නේ, මේ ප්‍රාදේශීය සභාවෙ ග්‍රාම නිලධාරි වසම් 53 පොදු ජනතාවට මේ සභාවෙන් ගැබ්වෙලා තියෙන යථාර්ථය අර්ථවත් කරන්නට ඔබතුමාට අයිතියක් තියෙනවා. වගකීමක් තියෙනවා. ඒ වගකීම් සියල්ල මේ වර්ෂ 2 ½ ක් තුළ ඔබතුමාට ඉෂ්ට කරන්න බැරි වුණා. මේ සභාවේ මන්ත්‍රීවරු හැටියට අපි දුර්වලයි. මේ වැරදි අඩුපාඩු හදන්න කාලයක් නෙවෙයි. මම යෝජනාවක් හැටියට කරනවා. ආණ්ඩුකාරතුමා යටතට අරගෙන, ලබන මාසේ සිට කොමසාරිස් පාලනයකට යොමු කරලා, මේ අසාර්ථක සභාව, විධිමත් සභාවක් බවට පත් කරන්න කටයුුත්ත මම ඉල්ලා සිටිනවා. ඒ වගේම ආණ්ඩුකාරතුමාට පිටපතක් යන්නත් ඕන. අපි නිකං පඩි ගන්නවා වගේම කියන්න ලැජ්ජයි කනගාටුවෙන් වුණත්, අපි අපේ දේශපාලන භූමිකාව අත්හරින්න. වාමවාදී දේශපාලන කඳවුරේ අපි රැඳිලා ඉන්නවා. එය ශක්තිමත් කිරීම සඳහා මම හිතනවා ලබන මාසේ නම් එන්න නම් සිද්ද වෙන්න එපා කියලා. මේ සභාවට අනිවාර්යෙන්ම මම යෝජනා කරනවා මේ සභාව විසුරුවලා, කොමසාරිස් පාලනයකට යොමු කරලා, විධිමත්ව හා කාර්යක්ෂම වැඩදායි ප්‍රතිඵලදායි සභාවක් බවට පත් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මාව නාගොඩ ප්‍රාදේශීය සභාවට ගෙන්වන්නට කටයුතු කළ, හිටපු සභාපති අජිත් එඩේරආරච්චි මහතාට මගේ ගෞරවය මේ වෙලාවේ පුද කරන්න කැමතියි. ඒ වගේම අපට නායකත්වය දෙන, අප ගැන කවදත් සොයා බලා කටයුතු කරන, අපේ උඩුගම නායකත්වය අපට

දෙන, අපේ ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ඒ වගේම ධනංජය විලේගේ මහතා අපට බොහෝ සහයෝගය ලබා දුන්නා. අපේ වෙරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ කොහේ හිටියත් තරංග මන්ත්‍රිතුමා, විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් විදියට, කොට්ඨාස මන්ත්‍රීවරු විදිහට, අපට සහයෝගය ලබා දුන්නා. වෙරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ හරි සතුටින් අපි මෙතනින් වාඩිවෙලා, අපිට ගමට දෙයක් කරන්න පුලුවන් වෙයි කියලා හිතුවා. ඇත්තටම තරංග මන්ත්‍රීතුමා විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් විදිහට කටයුතු කළා. අද අපේ කොට්ඨාසයට එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රි කෙනෙක් නැති නිසා, මේ වෙලාවේ මම මතක් කරන්න ඕන. ගරු සභාපතිතුමනි, අපි මේ සභාවට ඇවිල්ලා වාඩිවෙලා අපි යෝජනා දාන්න කිව්වයින් පස්සේ, අපි වසම් වල පාරවල් ටික, සභාවට පවර

ගන්න කිව්වම, හැම පාරවල් ටිකක් ම සභාවට දැම්මා. පාරවල් ටික හදලා දෙනවා කිව්වා. සභාපතිතුමනි, කිසිම දෙයක් කළේ නැහැ. ඔබතුමාට කියන්න කැමතියි සභාපතිතුමනි, හේමචන්ද්‍ර විලේගේ හිටපු සභාපතිතුමා, සහබන්දු සභාපතිතුමා ඔවුන්ගේ නම්, උඩුගමත්, නාගොඩත් ගොඩක් කියවෙනවා. උඩුගම අපි, කොට්ඨාසවල වැඩ නොකරත්, සභාපති කෙනෙක්ගෙ යුතුකමක් තියෙනවා. ප්‍රධාන නගරවල මොනව හරි අඩුපාඩුවක් තියෙනවා නම්, ඒ අඩුපාඩුව සම්පූර්ණ කරන්න. මම සභාපති ලෙස ඔබතුමාට ගරු කරනවා. නමුත් පාලකයෙක් විදිහට, සභාව පාලනය කිරීමේ දී, ඔබතුමා දුර්වලයි. උඩුගම නගරයට ඔබතුමා කරපු කිසිම දෙයක් නැහැ. අපි මන්ත්‍රීවරු පස් දෙනෙක් ඉන්නවා. එක වීදි ලාම්පුවක් හරියට දාගන්න බැරි වුණා. වැඩ ටික හරියට කරගන්න බැරි වුණා. මාපලගමට වැඩක් කරගන්න බැරි වුණා. අපේ හිටපු සභාපති, අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමාට, සහබන්දු සභාපතිතුමාට අපි ගරු කරන්නේ ඒකයි. මම හිතන්නේ ඒ නම් ඉතිහාසගත වේවි. මේ සභාවේ අලුත් මන්ත්‍රීවරු විදිහට මෙතනට ආවට පස්සෙ වැදගත්ම කතා ටික, අපේ හිටපු සභාපති අජිත් එඩේරආරච්චි මහතාගෙන්, සහබන්දු හිටපු සභාපතිතුමාගෙන්, හිටපු මන්ත්‍රීවරුන් වන නන්දන මන්ත්‍රීතුමා, වනමල් මන්ත්‍රීතුමා, තරංග මන්ත්‍රීතුමාගෙන් අපට නායකත්වය දෙන උපසභාපතිතුමාගෙන් වැදගත් කතා ටිකක් අහලා ඒවායින් කතාවක් ඉගෙන ගත්තා ඇරෙන්න ඔබතුමාගෙන් යම්කිසි පුංචි දෙයක් වත් අපි අරගෙන නැහැ. අපි ඉගෙන ගත්තේ නැහැ. ගන්න දෙයක් ඔබතුමා ළඟ තිබ්බෙ නැහැ. අපි කතා කරනකොට අපට සද්දේ දාලා අපේ කට වැහුවා. සද්දේ දාලා මේ අහිංසක නිලධාරීන්ගේ පිට පැටෙව්වා. මම ඒ අයට කියනවා. ඒ අය කරන්නේ නැහැ කියලා ඔබතුමා තමයි මේ සභාවේ නායකයා විදිහට කියන්නේ. ප්‍රධාන පුරවැසියා විදිහට මන්ත්‍රීවරු 26 දෙනෙක් යෝජනා දැම්මනම්, යෝජනා 50 ක් පමණ තියේවි ඒ ටික ක්‍රියාත්මක වෙනවද සොයා බලන්න ඔබතුමාගේ යුතුකමක් තියෙනවා. නමුත් ඔබතුමා කිසිම දෙයක් සොයා බැලුවේ නැහැ. අපේ කණගාටුව, අපි කවුරුත් මේ වෙලාවේ ඒ සම්බන්ධව දුක් වෙනවා. අපි මේ වෙලාවේ කල්පනා කරන්න ඕන. අපි මෙච්චර කල් කඩේ ගියේ කාටද කියලා. පසුගිය 9 වෙනිදා අපට පුදුම සහයෝගයක් ලබා දුන්න, අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ, සුභාෂි මන්ත්‍රීතුමියගෙ ගෙවල් වලට හානි කළා. ඉතාමත් ජරා විදිහට කටයුතු කරන්න තරම් මිනිස්සු පෙළඹෙව්වා. මේ සම්බන්ධව ම අපහසුතාවයන්ට පත් වුන මන්ත්‍රී දෙපලට අපේ කනගාටුව පළ කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි ගිය සභාවාරය සඳහා සභාවට ආපු වෙලාවේ, අපි ගරු කරන්න ඕන සහබන්දු සභාපතිතුමාට. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට. මේ සභාව කුඩු කරන්න කිහිප දෙනෙක් ඇවිල්ලා එළියෙ දැඟලුවා. අපි ඒක දැක්කා. කවුද මේක හසුරුවන්නේ කියලා. ඊළඟ සභාවාරය වෙනකොට අපි එන එකක් නැහැ. නමුත් විපක්ෂයේ සභාපතිවරයෙක් පත් වේවි. ටික දෙනෙක් මන්ත්‍රීවරු බවට පත්වේවි. ඔබටත් ඒ ඉරණමට ගොදුරු වේවි. ලැජ්ජයි කියන්න. කවුරුහරි එකට අනුබල දුන්න නම්, සභාවේ වීදුරුවක් කුඩු කළා. අපි ගෞරවනීය මිනිස්සු. අපේ මන්ත්‍රීකමට ගරුත්වයක් විදිහට, ඒ පෙලඹවීම් වලට කටයුතු කරන්න එපා. ඒ වගේම 09 වෙනිදා සිදුවීමේදී, තරංග මන්ත්‍රීතුමා නිරන්තරයෙන්ම අපි ගැන සොයා බැලුවා. විපක්ෂයේ කෙනෙක් වෙලත්, ඒ වෙනුවෙන් මම ගෞරවනීය ස්තුතිය පුද කරන්න කැමතියි. ඒ වගේම උප සභාපතිතුමා ඒ ගැන සොයා බැලුවා. මහින්ද මහත්තයට මිනිස්සු මෙච්චර යන්න කියනවා නම්, ගරුත්වයක් වශයෙන් අපේ හදවතේ වෙන නායකයො නැහැ. ඇත්තටම කිව්වොත් ගෝඨාභය අපේ නායකයා නෙමෙයි. අපට විනය ක්‍රියාමාර්ගයක් ගත්තොත්, අපි අයින් වෙන්න හෙට වුනත් මම සූදානම්. මිනිස්සු තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල, අපේ කොට්ඨාශ වල කන්න නැතුව, වතුකරයේ දෙමළ මිනිස්සු කොස් ගැටයක් කාලා ඉන්නේ. මිනිස්සු මෙතරම් අගමැතිතුමාට අයින් වෙලා යන්න කියද්දී, අපි මොකටද මෙතන බස් අරගෙන ගිහිල්ලා, එතුමාට ඉන්න කියලා කියන්නේ.

අගමැතිතුමා දැනටත් හදවතේ නායකයා වෙලා ඉවරයි. ගෝඨාභය රාජපක්ෂ අපේ නායකයා නෙවෙයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇරෙන්න වෙන නායකයෙක් අපට නැහැ. මිනිස්සු ගෙන්නගෙන, ඉන්නද? යන්න ද? කියල අහන්න ඕන නැහැ. එතුමාට කියන්න තිබුණා. මම අයින් වෙන්නෙ නැහැ. ආපු අය කෝලාහලයක් නැතුව යන්න කියලා. මම අගමැතිකම තියා ගන්නම් කියලා. අපේ අය පිස්සු බල්ලො වගේ කොටසක් හිටියා. ඇත්තටම ගැටුමක් ඇතිවුණා. ඒ අය කෝලාහල කර ගන්නකොට අගමැතිතුමා ඉල්ලා අස් වුණා. ඒ මිනිස්සු ගමට එනකම් ඉන්නෙ නැතුව අගමැතිකමෙන් අයින් වුණා. අපේ සභාපතිවරු, මන්ත්‍රීවරු අර වැවේ පීනද්දි අපේ නායකයාට, ජනාධිපතිවරයට බැරි වුණා. නාවික හමුදාව හරි සම්බන්ධ කරලා, අර මිනිස්සු ටික බේරගන්න. තාත්තගේ, අම්මගේ සොහොන් කොත් ටිකත් බේරගන්න බැරි වුණා. ඇත්තටම එහෙම නායකයන්ගෙන් වැඩක් නැහැ. සභාපතිතුමනි, මම කතාකරන්නේ උඩුගම මිනිස්සු ටික ගැන. අපට තවම එක හුවක් කිව්වේ නැහැ. එක රතිඤ්ඤයක් දැම්මේ නැහැ. හැබැයි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාට මම ගරු කරනවා. එතුමා අපිට ගහන්න ආවා නම්, අපට ගහන්න දෙන එකක් නැහැ. නමුත් එක්තරා පුද්ගලයෙක්, ජනතා විමුක්ති පෙරමුණේ ජයන්ත ගුරුගේ කියන පුද්ගලයා, මෙය සභාගත කරන්න. උඩුගම නගරයේ බාර්හන්දියේ ඉඳගෙන, කවුද ගියේ ගහමු කියලා පෙළඹවීම් කළා. ඒ වගේ කාලකන්නින්ගෙන් අයින් කරන්න අපට වගකීමක්, යුතුකමක් තියෙනවා. මන්ත්‍රීකමට ලැබුනට පස්සෙ අපි ගිහිල්ලා පිස්සු බල්ලො වගේ වැඩ කරලා, අපිට ගමට එන්න බැරි නම්, මොකද්ද තත්ත්වය? වෙරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ, මේ මහජන මුදල්වලින් රුපියල් 18000.00 ක මුදලක් ලබා දෙනවා. කාඩ් ලබා දෙනවා. ඒ අහිංසක මිනිස්සුන්ගේ මුදල්වලින් සල්ලි අරගෙන, සභාවට එක දවසක් ඇවිල්ලා, පඩි පැකට් එක අරගෙන අපි යනවා. අපට කිසිම දෙයක් සභාවෙන් කියලා කෙරුණේ නැහැ. මම හිතන්නේ මම විපක්ෂයේ සියලු දෙනාගෙනුත්, මගේ ආදරණිය මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන්නේ, මේ සභාවේ දැන් ගන්න ඉතුරු වෙච්ච දෙයක් නැහැ. අපේ තියෙන හදවත් තමයි. ඉදිරියේදී අපට මෙතනින් යනකොට, නාගොඩ ප්‍රාදේශීය සභාව බලාගන්න, හොඳ සභාපති කෙනෙක් පත්වෙලා, හොඳ මන්ත්‍රී මණ්ඩලයක් පත් වෙලා, මේක දියුණු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. අපට කණගාටුයි උඩුගම මන්ත්‍රීවරු හැටියට අවුරුදු හතරක සභා කාලය කියනකොට මහලොකුවට අපේ නායකයෝ දෙන්න තුන්දෙනා ගිහිල්ලා අපෙන් ඇහුවා. කාටද සභාපතිකම දෙන්නෙ කියලා. අපට අපි ගැන සොයා බලපු නායකයෙක් උඩුගම හිටියා. ඒ අපේ උප සභාපතිතුමා. දැනටත් අපට ගහන්න යනවනම්, මරන්න යනවනම්, අපි වෙනුවෙන් ඉන්නේ එතුමා. ඔබතුමාගේ හැම ප්‍රශ්නෙදිම එතුමා තමයි පෙරමුණ ගත්තේ. අවුරුදු දෙකක් සභාපති ධූරය හොබවලා, ඉතිරි අවුරුදු දෙක උප සභාපතිතුමාට සභාපතිකම දුන්නේ නැහැ. ඔබතුමා නැවත අපි අවුරුදු දෙකෙන් කොළඹට ගෙන්නුවා. මට එහෙම දෙන්න බැහැ. අනිත් අය දෙනවා නම්, දෙන්නම් කිව්වා. මහින්ද මහත්තයා වගේම බලයට කෑදර සභාපති කෙනෙක් වුණා. අපේ උඩුගම ඡන්ද ටිකත් අරගෙන, මේකෙ සභාපතිකම අරගෙන ඔබතුමා කටයුතු කලා. සමාවෙන්න. මම මෙහෙම කිව්වට. මම මෙතනින් බැහැර යන විට, මම ඔබතුමාට ගෞරව කරනවා. නමුත් මට කියන්න ඕන වචන ටික කියන්න ඕන. උඩුගමට තිබිච්ච අවුරුදු දෙකේ අවස්ථාව ඔබතුමා නැති කළා. ඒ වුණත් කමක් නැහැ. ඔබතුමා නාගොඩට වැඩක් කරල තිබුණ නම්. ආදාහනාගාරය හදනකොට, කොට්ඨාසයේ ප්‍රියන්ති මන්ත්‍රීතුමිය මෙලෝ දෙයක් දන්නෙ නැහැ. එවැනි වැඩ කටයුතු මේකෙ සිද්ධ වුණේ. මට කියන්න කණගාටුයි. මම නිලධාරීන් ගෙන් සමාව ඉල්ලනවා. මොකද අද අපි මෙතනින් බැහැලා යයි. අපේ අතින් නිලධාරීන්ට යම් අඩුපාඩුවක් වුනානම්, හැබැයි මේ සම්බන්ධ වගකියන්න ඕන නිලධාරී නෙවෙයි. ඔබතුමා. ජනාධිපතිතුමා කියනවා නම්, නිලධාරීන් වගකියන්න ඕන කියලා. ඒ අය තමයි පොහොර ටික නැති කරලා, මේ රට පළමුවෙන්ම විනාස කලේ. එක කන්න වේලක් දෙන්න බැරිනම්, ආණ්ඩුවක් මොකටද? අපි ආණ්ඩුව ගන්න කඩේ ගියේ රනිල් මහත්තයා රජ කරවන්න නෙමෙයි. අපේ ආණ්ඩුවක් හදාගන්න. නමුත් ඒ වගේ රත්තරන් මනුස්සයෙකුට මම ගරු කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර මහත්තයත්, සජිත් මහත්තයත් කැගහනවා.

මේ වගේ අවදානම් වෙලාවක කවුරුත් එන්නේ නැහැ. නමුත් මෙය අවදානම් සහගත අවස්ථාවේදී මේරට බාර ගත්තා රනිල් වික්‍රමසිංහ මැතිතුමා

**ගරු මන්ත්‍රනී ප්‍රියංගිකා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් ද, උප සභාපතිතුමාගෙන් ද, ගරු මන්ත්‍රීවරුන්ගෙන් ද, ගරු මන්ත්‍රිතුමියන්ලාගෙන්ද, ලේකම්තුමියගෙන් ද, අනෙකුත් සියලුම දෙනාගෙන් අවසරයි. එක්සත් ජාතික නිදහස් පෙරමුණේ හිස් වූ සභික ධූරය වෙනුවෙන් මාව සභික ධූරයට තෝරා පත්කර ගැනීම සම්බන්ධව, පක්ෂයේ සභාපති උපාලි අමරසිරි මැතිතුමාටත්, පක්ෂයේ ලේකම් මෛත්‍රී ගුණරත්න මැතිතුමාටත් ස්තුතිවන්ත වන අතර, අප ප්‍රදේශයේ වැඩ කටයුතු සාර්ථකව කර ගැනීම සඳහා, සභාවේ සියලු දෙනා එකමුතු වී වැඩ කටයුතු කරමු යැයි මා යෝජනා කරන අතර, ඔබ සැමට ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. එක්සත් ජාතික නිදහස් පෙරමුණේ ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මන්ත්‍රීතුමියට සුබ පතනවා. ඇත්තටම මට මතකයි. දැන් සභා වාර හතර පහකට කලින් කිව්වා. දීකිරි කතාවක්. ඒකෙ දැන් මුට්ටිය බිඳුණු බව හැමෝටම වැටහෙනවා. ඒ කතාවත් එක්ක, මට කියන්න ඕනකම තමයි දැන් බැලුවට පස්සේ, අපේ විපක්ෂයේ ඉන්නෙ තුන් දෙනයි. අනෙක් සියලුම දෙනා එක පක්ෂයක. ඒ වගේම තමයි. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ, සුභාෂි මන්ත්‍රීතුමියගේ දේපළ හානි වෙලා තියෙනවා. ඒ සම්බන්ධව අපි කණගාටුව ප්‍රකාශ කරනවා. අපේ සහෝදර දෙපළක්. ඒ කටයුතුවලට කවුරුහරි අනුබල දීලා ඉන්නවනම්, ඒවා හෙළා දකිනවා. අපේ වෙරංග මන්ත්‍රීතුමාගේ සහ සමන් මන්ත්‍රීතුමාගේ කතා වලදි කියවුනා. ජනතා විමුක්ති පෙරමුණ මේවට සම්බන්ධයි කියලා. නමුත් මම ලිඛිතව ඔබතුමාගෙන් ඉල්ලනවා. මෙන්න මේ ජනතා විමුක්ති පෙරමුණේ පුද්ගලයා අපේ ගෙට ගැහුවා, ගිනි තිබ්බා, අපට හූ කිව්වා එහෙම කියලා තියෙනවානම්, කියන්න. අපිට මූලස්ථානයෙන් කියලා තියෙන්නේ, අපේ මූලස්ථානය දැනුවත් කරලා, පොලිස්පති හරහා තමයි පැමිණිල්ල කරන්නේ. මේ අසවලා මේ දේ කලා කියලා, අපට ලිඛිතව දෙන්න. වෙරංග සහෝදර මන්ත්‍රීතුමාටත්, සමන් මන්ත්‍රීතුමාටත් කියනවා. අපේ කිසිම භේදභින්නතාවයක් නැහැ. ඔය ජයන්ත ගුරුගේ කියන සහෝදරයා ඔබතුමාට කිව්ව නම් අපි ඒක හෙළා දකිනවා. ඔහු අපට ඡන්දයක් වත් දීපු පුද්ගලයෙක් නෙවෙයි. ඇත්තටම කණගාටුයි. අපට ඡන්දය දීපු මනුස්සයෙක් එහෙම කියනවා නම්, අපි ඒකෙ වගකීම ගන්නවා. ඒ නිසා වෙරංග මන්ත්‍රිතුමා සහ සමන් මන්ත්‍රිතුමා කිව්ව දේ මට පිළිගන්න බැහැ. ඒ වගේම පහුගිය 09 වෙනිදා මහින්ද මහත්තයා අරලියගහ මන්දිරයට අපේ සභාපතිවරු, මන්ත්‍රීවරු, සමෘද්ධි නියාමකවරු ගෙන්නුවා. ඒ වගේම සියලුම රජයේ වැඩ කරන පුද්ගලයන් යමු කියලා, කියලා තියෙනවා. ඒ මිනිස්සු මට පොළේදී හම්බවෙලා පැවසුවේ. එහෙම එක්කගෙන ගිහිල්ලා, අන්තිමේදී ඒ මිනිස්සු අසරණ කලා. බොන්න දීලා, කැති මුගුරු දීලා, සභාවෙ තියෙන කැබ් ටික ගෙනිහිල්ලා, මයිනගෝ ගමට ගිහිල්ලා, ඒ අහිංසක මිනිස්සුන්ට ගැහුවා. ගෝඨාගෝ ගමට ගැහුවා. ඒ ගම්වල හිටියෙ අපේ අහිංසක මිනිස්සු. සහෝදරවරු, අම්මා තාත්තාලා. ඔය අර්බුදකාරී තත්ත්වය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකියන්න ඕන මහින්ද මහත්තයා. ඒ වගේම රැස්වීම ඉවරවෙලා, දැන් නිවෙස් බලා යන්න කිව්ව නම්, අරලියගහ මන්දිරයේ ඉඳලා ගෝල්ෆේස් එකට කිලෝමීටර් දෙකක් තියෙනවා. STF එකට, පොලිස්පතිතුමාට කියලා ගෝල්ෆේස් එකට යන්න බැරි වෙන්න බැරියර් දාලා වහන්න කියලා. නමුත් එහෙම කළේ නැහැ. වන්ඩි දාලා, පාතාලේ දාලා අහිංසක කොල්ලෝ, කෙල්ලොන්ගෙ ඔළුවට වෙඩි තියලා මැරුවා. මේ අය තමයි මේ සියලුම දේ නිර්මාණය කළේ. වෙන කිසිම කෙනෙක් නෙවෙයි. අනෙක් සියලු දෙනා අත්අඩංගුවට ගන්නවා නම්, මේ අයත් අත්අඩංගුවට ගන්න ඕන. කටඋත්තරයක් වත් ගන්න බැරුව තමයි දැන් ඉන්නේ. ඇත්තටම කනගාටුයි. මේ අර්බුධය නිර්මාණය කළේ මේ අය.

කවදාවත් අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට ගහන්න ගිහිල්ලා නැහැ. අල්ලපු වැටේ ඉන්නේ පියල් මන්ත්‍රිතු.මා අහන්න මොනවහරි කිව්වද කියලා. අපේ ඥාති ඉන්නේ. අපි කාටද ගහන්නේ. අනවබෝධය නිසා එහෙම කිව්වට, අපේ සාමාජිකයෝ කිසිම කෙනෙක් මේවට සම්බන්ධ නැහැ. අපි සම්බන්ධ වෙනවා නම්, කොළඹට අපි පයින් යන්නේ නැහැ. අපේ පඩිය හරි දීලා නිකං ඉන්නේ නැහැ. ඉන්ධන ගාස්තු 3000.00 පවා මම පරිත්‍යාග කරල තියෙන්නෙ. මම ගන්නෙ රුපියල් 1000.00 dialog card එක පමණයි. අද දවසේ මම කනගාටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ මේකට සම්බන්ධ කර ගැනීම සම්බන්ධව. ඇත්තටම සැබෑ නායකයෝ දැන් නැහැ කියන එක අපට මේ කතා වල දී තේරුණා. සභාපතිවරයාගේ ඉටුවිය යුතු දේවල් ඉටු නොවන බව මෙතුමා දැන් කතා කලා. අවුරුදු දෙකක් ඔබතුමා සභාපතිත්වය දරලා, ඊළඟ අවුරුදු දෙක උප සභාපතිතුමා ට දෙනවා කියලා දුන්නේ නැතිලු. කාගේ වැරැද්ද ද? වීදි ලාම්පුවක්වත් දාගත්තෙ නැතිලු. මේ නිලධාරීන් හරියට වැඩ කලේ නැතිලු. නිලධාරීන් හරියට වැඩ කලේ නැතෙයි කියන්නේ කොහොමද? සභාපති කෙනෙක් සිටිද්දී කාගේද පරිපාලනයෙ වැරැද්ද? මෙතන නායකයෙක් නායක පුටුවෙ තිව්වෙ කවුද? ඒවා අපි හිතන්න ඕන. ගරු සභාපතිතුමනි.නම මතක නැහැ RO මහත්තයා හිටියා. මමත් උදෙන් යන නිසා. ඇත්තටම කරන්ට් එක සම්බන්ධව දැනීමෙන් කරපු වැඩක් නෙවෙයි. ලේකම්තුමියට මම කතා කරලා, එවෙලේම ක්ෂණිකවම කැබ් එක යවලා, විසන්ධි කරල දුන්නා. එතුමියට අපි ස්තුතිවන්ත වෙනවා. අපි කියන්නේ නැහැ. නිලධාරීන් වැඩ කරන්නේ නැහැ කියලා. නිලධාරීන් සම්බන්ධ කරන විදිහක් තියෙනවා. ධර්මසිරි මන්ත්‍රීතුමා කිව්වා. එතුමගේ පැත්තෙන් ඒක හරි ඇති. නමුත් වැඩ කරපු සේවකයන්ට මුදල් අඩු කරන්න කියලා අපට කියන්න බැහැ. මොකද දැන් ජීවත් වෙන්න හැකියාවක් නැහැ. මම වුණත් අද ආවෙ බයිසිකලේ අතර මග දාලා, බස් එකේ. බයිසිකලේ පෙට්‍රල් නැති නිසා. අපට විනෝද කරන්න හැමදේකටම දෙන්න පුළුවන් නම්, මොකද ඒ මිනිස්සුන්ට දෙන්න බැරි. සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම ඉල්ලා සිටින්නේ ඔබතුමා නිවැරදිව පරිපාලනය සිදු කරන්න. ඔබතුමා නිවැරදි වෙන්න පුළුවන්. දැන් මේ අවුරුදු පහ යන්නෙ. නමුත් කටයුතු හැමතැනම ඇනහිටියා. තල්ගස්වල පොල ගත්තම අන්තිමයි. p.h.i. මහත්තයෙක් දාලා පරික්ෂා කරන්න. හරක් වැටවල් කඩාගෙන ඇවිල්ලා, ගොම ගහලා ඒක උඩම තමයි වෙළඳාම් කරන්නෙත්. නිසි පිළිවෙළක් නැහැ. කුණු දාන්න හට් ගැහුවා. ඒ වලට කුණු දාලද? කෝ කළමනාකරණය? ඒවට වගකියන්න ඕන ඔබතුමා. සභාපති කෙනෙකුට මෙහි උපතේ සිට විපත දක්වා වගකියන්න ඕන. ඒ වගේම අපි සියලු දෙනාම එකතුවෙලා, මේ රටේ තියෙන ප්‍රශ්න විසඳගනිමු කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ නවක මන්ත්‍රීතුමිය මම මේ වෙලාවේ ගෞරවයෙන් යුතුව පිළිගන්නවා. පසුගිය 9 වෙනිදා සිදු වූ සිද්ධිය පිළිබඳව මෙතන කතා නොවුනු දෙයක් කියන්න ඕන. ඇත්ත කතාවක් මේ කතා කරන්නේ. අපි ගියේ අන්තරේට ගහන්නවත්, ගෝඨා ගෝ ගමට ගහන්නවත්, එහෙම චේතනාවකින් නෙවෙයි. ඡන්දය දිනුවේ මහින්ද මහත්තයාගේ නම විකුණලා. අපි දහ දෙනෙක් ගියා. අපේ තුන් හිතකවත් එහෙම දෙයක් තිබුණෙ නැහැ. අපි ගියේ මහින්ද මහත්තයා අස්වුනා. එතුමාට සුබපතලා එන්න ඕන කියලා. අපි ඇතුළු වෙනකොට කිසිම දෙයක් ගෙනිච්චෙ නැහැ. දැඩිසේ පරික්ෂා කරල ගත්තේ. බුලත් විටක්වත් ගෙනියන්න දුන්නේ නැහැ. අපි කිසි විටෙක කැරැල්ලකට ගියේ නැහැ. අගමැතිතුමා අස්වීමේ චේතනාවකට ආවෙ නැහැ. අපි ඒ වැඩසටහන ඉවර වෙලා එළියට එනකොට, එක්තරා පිරිසක් තමයි මේක ලීක් කෙරුවෙ. අපි දහය විතර නොවෙයි. මේ දේට ගොඩක් අය අකමැති වුණා. නමුත් යන්න තිබුණේ එක මාර්ගය යි. ඇතුළු වුණ ගේට්ටුව වහල තිබුනා. ඒක ඇරිලා තිබුණේ ගෝල්ෆේස් පැත්තට. මයින ගෝ ගමට යනකම් කිසිම කෙනෙක් අතේ ආයුධයක් තිබුණෙ නැහැ. අපි දහ දෙනාම කිසිම කෙනෙකුට පහර දුන්නේ නැහැ. නමුත් ගැටුම් ඇති වෙද්දී අපි නැවත අරලියගහ මන්දිරයට කොටුවෙලා ඉඳලා ආවා. නමුත් එක දෙයක් කියන්න ඕන. මේ

කිසිම දෙයකට ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධ වුණේ නැත්නම්, නැත්නම් කිසිම පක්ෂයක් සම්බන්ධ වුණේ නැත්නම්, කවුද මේවට ගැහුවෙ. ඒ වගේම සභාපතිතුමනි, මේ හැම කෙනාම සභාපතිතුමාට බැන්නා වෙලාවේ, මම එතුමගෙ හොඳක් දකිනවා. වීදි පහන් සවි කිරීමේදී, මගේ කොට්ඨාසයේ, මාපලගම, තල්ගස්වල හැම තැනකටම වීදි පහන් ලබා දීලා තියෙනවා. ඊට අමතරව මාපලගම ට පිට්ටනියක් සහ ළමා උද්‍යානයක් ලබා දුන්නා. වෙළෙඳ සංකීර්ණයක් හැදුවා. 51% ක් වැරදි ඇති. 49% ක් මට හොඳයි. මොකද මට වැඩ ටිකක් කරල දුන්නා. නොකරපු වැඩක් තියෙනවා. ඔබ සැමට ස්තුතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. දේශපාලන හිතවතෙක් වන දිනේෂ් ගොඩගමගේ බිරිඳ මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරියක් විදිහට අද අප සභාවට පැමිණිලා තියෙනවා. එතුමිය ගෞරවයෙන් පිළිගන්න ගමන්ම, සුභ පැතුම් එක්කරනවා. ඉදිරි දේශපාලන දිවිය, ගමට මොනවා හරි වැඩක් කරන්න හැකියාවක් ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමන්ලා කතා කරපුව වෙනත් අතකට යොමු කරන්න මම සූදානම් වෙනවා. මේ වෙලාවේ මම ස්තුතියක් කරනවා. අපේ සහෝදර වෙරංග මන්ත්‍රීවරයාට. ඛනිජ තෙල් සංස්ථාවේ නිලධාරියෙක් විදිහට, එතුමා උඩුගම ඉන්ධන සැපයුමට විශාල දායකත්වයක් දරලා, සොයා බැලීම් කරලා, එතුමාට කරන්න පුළුවන් උපරිම ආකාරයෙන්, එතුමාගේ සහෝදර නිලධාරීන්, උසස් නිලධාරීන්ගේ සහයෝගය ලබාගෙන, උඩුගමට අඛණ්ඩ තෙල් සැපයුමක් ලබා දුන්නා. තෙල් සැපයීමේදී එතුමා පුද්ගලිකව රාජකාරී හා හිතවත්කමට, දේශපාලන සම්බන්ධකම් මත හෝ පුළුවන් සහයෝගය ලබා දුන්නා. ඒවගේම විලේගේ මන්ත්‍රීතුමා, ගාල්ල ප්‍රදේශයේ වැඩ නොකලත්, එතුමගෙ සහෝදරයෙක් ඉන්නවා ඛනිජ තෙල් සංස්ථාවේ. එතුමත් හරහා ඒ සඳහා විශාල සහයෝගයක් ලබා දුන්නා. උපරිම ආකාරයෙන් උඩුගම අවට ප්‍රදේශයට ලබාදුන් සහයෝගය ගැන උඩුගම හා අවට ප්‍රදේශවල ප්‍රදේශවාසීන් වෙනුවෙන්, ඒ සියලු දෙනාගේ දක්වපු සහයෝගය ලබා දුන් අපි නොදන්න පිරිසක් වුණත් මේ සඳහා දායකත්වයක් දක්වලා ඇති. සහයෝගය ලබා දුන් කෙනෙක් ඉන්නවනම්, ස්තුතිවන්ත වෙනවා. මොකද ඉන්ධන අඛන්ඩ තෙල් සැපයුමක් සිද්ධ වුණා.

ඔබතුමාගේ පාලක පක්ෂයෙන් කතා ආරම්භ කරලා, එතුමන්ලා දැන් විසිරි ගිහිල්ලත් ඉවරයි. ඇත්තටම අපි ඔය කතා කිව්වේ අද ඊයෙක නෙවෙයි. සභාපතිතුමා අපට හිතවත් කම්, ඥාතිකම්, සබඳකම් තිබුණට, අපි සභාවේ සමහර අවස්ථාවලදී ඔබතුමාගේ කතා වලට විරුද්ධ වෙලා කෑගහගෙන, අපි සභාවෙන් නැගිටලා ගිහිපු අවස්ථා තියෙනවා. සභා වාර්තා අරන් බැලුවත්, එහි සටහන් නොවුවත්, ඔබතුමන්ලා අද කළ සියලු කතා අපි එතුමත් එක්ක කතා කළා. වෙරංග මන්ත්‍රිතුමා ඉදිරි ගෙවීම් වාර්තාවෙ ගෙවීමකට විරුද්ධ වෙනවා. ධර්මසිරි මන්ත්‍රීතුමා විරුද්ධ වෙනවා. ඒ වගේ නෙවෙයි. අපි හැමදාම නිලධාරින්ගේ නෙවෙයි. සභාපතිවරයාගේ සහ මේ සභාවේ කටයුතු නිසියාකාරයෙන් කරගෙන යන්නේ නැති හැම අවස්ථාවකම, අපි අපේ විරෝධතාවය දක්වලා, අපි ඒ නිවැරදි කිරීම් කරන්න කටයුතු කළා. මේ අවුරුදු හතර පුරාවටම ඒ කටයුතු කළා. අද දිනයේ ඔබතුමාට කවුරුහරි චෝදනා කරනවා නම්, කවුරුහරි මේක අන්තිම සභාවාරය කියලා හිතලා කතා කරනවා නම්, අපි ඒකත් හෙළා දකිනවා. මොකද මේ සභාපතිතුමාගෙන් සැහෙන්න වැඩ ගත්ත පිරිසක් මෙතන මේ ඉන්නේ. අපි එක්සත් ජාතික පක්ෂය කියලා, අපට කවදාවත් කිසිම දෙයක් කළේ නැහැ. ඔබතුමාලට ලයිට් තුනක් දුන්නලු. අපි රුපියල් පනස්දාහක් ගෙනත් දීපු සල්ලි වලින්වත් අපට ලැබුණේ නැහැ. ඔබතුමා ගෙදර ගෙනියන්නේ නැතුව ඇති. හැබැයි අපි සතුටු වෙනවා. කොහේට හරි ඒ මුදල්වලින් ලයිට් සවි කරන්න ඇති කියලා. ඒ කොහොම වුණත් මේක අවසාන සභාවාරය කියලා ඔබතුමාව අපහසුතාවයට ලක් කරන්නේ නැහැ. අපට මුදල් ලැබුණා. ඒක සම්පාදනය කළේ නැහැ. ඒ

ආකාරයට අවසානයේ හැමදේම ඔබතුමාගේ පිටින් තියලා, ඔබතුමා අපහසුතාවයට ලක්කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාගේ සැහෙන්න අඩුපාඩු ඇති. නිලධාරීන්ගේ අඩුපාඩු ඇති. මේ අවසාන මොහොතේ වැඩ කරලා, සියළු අඩුපාඩු ඔබතුමාගේ පිටින් තියලා, එදා කතා කරපු දේ නෙවෙයි. අද කතා කරන්නේ. අපි කිසිම මන්ත්‍රීවරයෙක් විපක්ෂයට දාන්න කටයුතු කරන්නේ නැහැ. අපි සියලු දෙනාම මන්ත්‍රීවරු වශයෙන් එකට එකතු වෙලා කටයුතු කරන්නේ.

පසුගිය 09 වැනිදා සිද්ධිය ගත්තම, මොනයම් හෝ කණ්ඩායමක් එතනට ඇතුල් වෙලා, ඒ සිදු කරපු සාමකාමී අරගලයට, දක්වපු ප්‍රහාරය මම පළමුව හෙළා දකිනවා. ඒ තුළින් බලාපොරොත්තු නොවූ ප්‍රතිප්‍රහාරයක් ආපු අවස්ථාවේ, ලංකාව පුරාම ඒ ඒ ආකාරයෙන් ඉතාමත් කෙටි කාලයක් ඇතුළත ප්‍රතිප්‍රහාරයක් ලැබුණා. ඉතින් ඒ ගැනත් අපේ කණගාටුව සහ ඒ කාරණා දෙකම හෙළා දකිනවා. ඒ දෙකම සිදු නොවිය යුතු දේවල් සිදු වුනේ. මෙතන කවුරුහරි කියනවා නම්, වැරදි ගෝඨාභය මහත්තයා, මහින්ද මහත්තයා කියලා නැත්නම් මේ සභාපති වරු කියලා, මේ හැම කෙනාම මේකට සම්බන්ධයි. පියල් මන්ත්‍රීතුමා ඔබතුමා කිසිම දෙයක් දන්නෙ නැහැ කියලා කියන්න බැහැ. ඔබතුමාගේ හැමදේටම එකඟ වෙනවා. නමුත් මේ කාරණාවේදී මම එකඟ වෙන්නේ නැහැ .මොකද අපි දැක්කා නාමල් මහත්තයත් එක්ක ගිහිපු කට්ටිය සෙල්පි ගහනවා. ඒ හැම අවස්ථාවෙම කියන්නේ ගෝල්ෆේස් යන් කියලා. ගෝල්ෆේස් යං කිව්වේ මේක බලන්න නෙවෙයි. සහයෝගය දක්වන්න නෙවෙයි. එතන වැඩසටහනක් ක්‍රියාත්මක වුණා. අපි දන්නේ නැහැ මොන සද්භාවයෙන් ගෙන්නුවද? මොන විෂබීජ දැම්මද කියලා. නමුත් ඒ ඔක්කොම ප්ලෑන් එකක්. අපි දැක්කා. ජොන්ස්ටන් ඇමතිතුමා, බෝතල් කොහොමද බෙදුවේ. වාහන කුඩු කරන කොට අපි දැක්කා. සනත් නිශාන්ත මහත්තයා, එම අවස්ථාවේම ප්‍රහාරයට ලක් වුණා. අපේ පිරිසත් ඔය පෙළපාලිවල ගියා. කවුරුවත් එහෙම දෙයක් බලාපොරොත්තුවෙන් යන්න නැතුව ඇති. නමුත් කූට උපක්‍රමයක් සිදුවුණා. ඉතාමත් ඉක්මනින් මයිනාගෝගම හා ගෝඨාගෝ ගමට ඇතුළුවෙලා, ඔබතුමාලා දන්නැතුව ඇති. නමුත් ඒ සිද්ධිය සුදුසු නැහැ. අපි අනුමත කරන්නෙත් නැහැ. අපේ ලක්රුවන් සහ සුභාෂි මන්ත්‍රීතුමිය එතැනදි මොනව හරි දැකලා නෙවෙයි. මේ සිද්ධිය කවුරු කළත් කරපු දේ හොඳ නැහැ. මොකද අපේ සහෝදර මන්ත්‍රීවරු මෙතන ඇවිල්ලා, ප්‍රාදේශීය සභාවෙ දීමනාව ගත්තට, මේ දේවල් වලින් හම්බ කරපුවා නෙවෙයි. අපටත් කටවචනයෙන් හරි යම් යම් ආරංචි ආවම, ඒවා වලක්වන්න පුළුවන් උපරිම උත්සාහයක් අපි දරුවා. කවුරුහරි ඒකට සම්බන්ධ වෙච්ච කෙනෙක් ඉන්නවනම්, නීත්‍යානුකූලව රාජකාරි කරයි. ගිය සභාවාරයෙ මෙතනට ඇවිල්ලා, උද්ඝෝෂණය කරලා, ගල් ගහලා, සහෝදර මන්ත්‍රීතුමියකුට කෑ ගහලා ගියා. ඒවගේම මේ සිද්ධි සිද්ධ වුණේ, ඔබතුමාලගේ ජනාධිපති, අගමැති කෙනෙක් යටතේ. ඇත්තටම මේවා වළක්වා ගන්න තිබුණා. ඒ වෙලාවෙම ඒක පාලනය කරගන්න බැරිවීම ඔබතුමාලගේ අසාර්ථකත්වය. අපේ සමන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, ජනාධිපතිතුමා ඉන්න කාලෙදිම එතුමගේ අම්මගේ තාත්තගේ සොහොන කඩන් යනවානම් ඊට වඩා දෙයක් තියෙනවද? එතුමන්ගේ බලය තිබෙද්දී, අර බේරේ වැවේ සභාපතිවරු, මන්ත්‍රීවරු බස්සවලා ඉන්නකොට, වාහන පෙල්ලනකොට, ඒක පාලනය කරගන්න බැරි නම්, දේශපාලනයේ තියෙන අපි දැකපු ලොකුම දුර්වලකම ඒක.රාජ්‍ය බලය තිබෙද්දී හමුදාවෙ නායකයෙක් වෙලා හිටපු කෙනෙක්, අනෙක් අයට ආරක්ෂාව සපයන්න පුළුවන් ද කියන එකත් ප්‍රශ්නයක්.

අපේ තවලම සභාපතිතුමා ගැන වාර්තා පළ වුණා. 100% ක් ඇත්තද කියන්න අපි දන්නේ නැහැ. නමුත් ඒ නිල රථය විනාශ වුණා. ඔබතුමාලා කොහොමහරි මොළය පාවිච්චි කරලා, සභාවෙ දේපළ වලට හානි නොකර, ඔබතුමාලට ආරක්ෂිතව ඒමට හැකි වීම සම්බන්ධව අපි සතුටු වෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයා පත්වෙච්ච එකත් සමග දැන් අපට කතා කරන්න පුළුවන් තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඔබතුමාලා මේ සභාවාරය මේ ආකාරයෙන් තියන්නෙත්, ඒ ආරක්ෂාව දුන්නු නිසා. ගෑස් පෝලිම්වලට, තෙල් පෝලිම්වලට යම්කිසි ක්‍රමවේදයක් හැදිලා තියෙනවා. නැත්නම් අද වන විට සභාවට ආරක්ෂාව දාගන්න වෙනවා. දැන් මිනිස්සුන්ට

විශ්වාසයක් ඇති වෙලා තියෙනවා. අපි ඒ කටයුත්ත ඒ විදියටම දේශපාලන භේදයකින් තොරව කටයුතු කරනවා. ගොඩක්ම සතුටුයි අපේ පක්ෂයේ හත්දෙනාගෙන් හය දෙනෙක්ම එක මග හිටියා. අපි නිවැරදි තැන හිටගත්තා කියලා අපි සතුටු වෙනවා. ඔබතුමාලගේ අය ඉස්සර අපට පින් මන්ත්‍රීවරු කිව්වා. ඒ කිව්වා වුනත් ව්‍යවස්ථානුකූලව ජනාධිපති පත් වෙනවා. පිනට ගත්ත දෙයක් නෙවෙයි හිමි දෙයක්.

අවසාන වශයෙන් එතුමා රටේ ජනාධිපති වෙලා, ඒ තත්ත්වයෙන්ම මේ ප්‍රශ්න විසඳන බව නියතයි. වර්තමාන අගමැතිතුමාට ස්තුතිය පුදකරමින්, අපේ දේපළ හානි වූ මන්ත්‍රී දෙපළට කනගාටුව පළ කරමින්, ඉදිරියේදී මොනම ආකාරයකින්වත් මෙවැනි දෙයක් වෙන්න ඉඩ නොතබාවි කියන විශ්වාසයක් තබමින් , ඒ වගේම පළවෙනි වීඩියෝ එක තත්පර ගානක් ඇතුලත මම දැක්කා. අපේ අසල්වැසි බද්දේගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාගොඩවිතාන මහතා එතුමා එක්තරා තැනක වාඩි කරලා පහර දීමක් කරනවා. මම එවෙලෙම අර්ථසාධක අරමුදල වැඩ කරපු මගේ මිත්‍රයෙකුට කතා කරලා, සොයා බැලුවා. අපට යම් කෙනෙකුට උදව්වක් කරන්න පුළුවන් නම්, අපේ සභාවේද, අවට සභාවක ද කියලා අදාල නැහැ. පක්ෂ පාට බැලුවේ නැහැ. හැම සොයාබැලීමක් ම කලා.

සමන් මන්ත්‍රීතුමාගේ කතාවෙදි කියවුනා. එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් කියලා එතුමාට චන්දය දෙන්න කිවුවා කියලා. ඇත්තටම එක්සත් ජාතික පක්ෂය කිව්වොත් වැරදි අදහසක් එනවා.මොකද මීට කලින් 2011 මට ඡන්දය දීපු මගේ පාර්ශිකයෙක් ඇහුවා. මන්ත්‍රිතුමා, මම සමන් මන්ත්‍රීතුමාට ඡන්දය කරනවා. ඔබතුමාගේ කොට්ඨාසෙ නෙවෙයි කියලා. මම කිව්වා. මට කමක් නැහැ කියලා. මම වළක්වන්න ගියේ නැහැ. ගමේ දේවල් වලට සම්බන්ධ වන හොඳ කෙනෙක්. ඔබතුමාට කැමති නම් කරන්න. මගේ පාක්ෂිකයෙකුත් ඇහුවා. ඔබතුමා සමන් මන්ත්‍රිතුමාට ඡන්දය කරන්න කියලා කිව්වද කියලා. ඇත්තටම වුනේ ඒක. වාර්තාගත වුණාම වෙනත් අදහසක් එන්න පුළුවන්. ඒ නිසයි මා ඒ දේ සිහිපත් කළේ.

ඉදිරියේදී පත් වන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මෙච්චර ඉන්න එකක් නැහැ .ඉදිරියේදී වෙනස් වෙයි. ඉදිරියේදී කවුරු වුනත්, මහජනතාවට යම් සේවාවක් ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. පසුගිය 09 වැනිදා ඇතිවූ සිද්ධියෙන් අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාට සහ සුභාෂි මන්ත්‍රීතුමියට සිදුවූ අලාභ හානි පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. විශේෂයෙන් නවක මන්ත්‍රීවරියක් මේ අවස්ථාවට සම්බන්ධ වෙනවා. එතුමියට අපි සුභ පතනවා. ඇත්තටම අපට දේශපාලනය කියන ගමන තිත්ත වෙච්ච අවස්ථාවක තමයි එතුමිය ඒ අවස්ථාවට සම්බන්ධ වෙන්නේ. එතුමියගෙ ගමන සුබවාදී වේවායි ප්‍රාර්ථනා කරනවා. කෙසේ වෙතත් පහුගිය දිනවල දී ඇතිවුණ කලහකාරී තත්වය පිළිබඳව සුභාෂි මන්ත්‍රීතුමියට හා ලක්රුවන් මන්ත්‍රීතුමාට පමණක් නෙවෙයි. අපගේ අනෙකුත් මන්ත්‍රීවරුන්ට වචනයකින් හරි වරදක් වුනානම්, ඇත්තටම අපි කනගාටු වෙන්න ඕන. අපි සියලු දෙනාම එකට ඉදලා, යම්කිසි වේදනාවක් ලැබුණ නම්, ඒ වේදනාව අපේ හදවතට දැනෙන මොහොතක් මේක. විශේෂයෙන්ම සෑම කොට්ඨාසයකටම, සෑම ප්‍රදේශයකටම මේ වෙනකොට මේ දේවල් සිදු වන විට, කැප්පිටියගොඩ ජනතාව වචනයකින්වත් මොනවත් කිව්වේ නැහැ. “මිනිසුන් අතරේ තිරිසන් නැති මුත් වටහාලන්නේ කඳුලින්” යන කියමන අර්ථවත් කරමින්, ඒ ගීතයේ යම්කිසි අර්ථයක් තියෙන සේ වටහා ගන්න. සමහර විටක අර වගේ අයත් නැතුව නෙමෙයි කියලා වටහාගන්න. මේ අවස්ථාවේදී තමන්ට තියෙන වෛරය පිරිමසා ගන්න කොටසක් උත්සාහ කළත්, සමාජයේ උගත් අය මේ දේවල් වලට ඇබ්බැහි වුණේ නැහැ. සමහරු හිතලා මතලා වැඩ කරන විට, අපේ කොට්ඨාසවලට, මේ කැප්පිටියගොඩ, නාගොඩ ප්‍රදේශයේ

ඉන්න ජනතාව ඉතාමත්ම බුද්ධිමත් ලෙස කටයුතු කළා. මේ අවස්ථාවේ දී ඒකත් අපි අගය කරන්න ඕන. හදිස්සියෙන් එක්කෙනෙක්, දෙන්නෙක් ඇවිල්ලා බලපෑම් කළාට, තවත් පිරිස එයට එක්රොක් වුණේ නැහැ. සුභාෂි මන්ත්‍රීතුමියට හා ලක්රුවන් මන්ත්‍රීතුමාට ඇත්තටම සිදුවුන මේ ප්‍රහාරය සම්බන්ධයෙන් හදවතින්ම අපි කණගාටු වෙනවා. විශේෂයෙන්ම මින් ඉදිරියට දේශපාලනය කළ යුතු ද නැද්ද කියන එක පිළිබඳව තීරණය කරන්න ඕන, මේ නාගොඩ ප්‍රාදේශීය සභාව විසුරුවට පස්සෙ තමයි. දේශපාලනයක් කරන්න ඕන නැහැ කියලා මට හිතුනා. ජීවිතයේ අපට ජනතා මෙහෙවරක් කරන්න, දේශපාලනය කරන්න, ඉස්සෙල්ලා අපි මිනිස්සුන්ට ගොඩක් උදව් කලා. ඒ නිසා ගමේ ඉන්න ජනතාව අපි මන්ත්‍රීවරු කරලා, මෙතෙන්ට එව්වා. ඒ අය ඡන්දය දුන්නේ අපිව විශ්වාස කරලා. ඒ අය ඒ විශ්වාසය පළුදුවක් නොවන විදිහටත්, ජනතාව කටයුතු කළා. ඒ පිළිබඳව මම නැවත වතාවක් අගය කරනවා. ජීවන ගමනකට දේශපාලනය කරන්න ඕන නැහැ. මම හිතනවා මින් ඉදිරියට කිසිදු දේශපාලන පක්ෂයක් පෙරදැරිව කටයුතු කරන්නේ නැහැ කියලා. ඒක මගේ ප්‍රතිපත්තිය. ඇත්තටම රට ගොඩගන්න අපි අත්වැල් බැඳගෙන කටයුතු කරන්න ඕන. දේශපාලන කටයුතුවලින් තොරව මේ කටයුත්ත කරන්න ඕන කියන එක මගේ අභිමතාර්ථය. මේ වෙච්ච සිද්ධිය පිළිබඳව නැවත වරක් කණගාටුව ප්‍රකාශ කරමින්, අපටත් දුරකථනයෙන් තමයි දැනුවත් කරලා තිබුණේ, ගහන්න එනවා කියන එක පිළිබඳව. අපේ ගෙදරටත් ගහන්න එන්න කියලා මමත් හිටියා. මොකද අපේ ගෙදර තියෙන්නෙ පරණ වීදුරු ජනෙල්. ඒක ඉතින් අලුත් කරගන්න පුළුවන්. ඒක නිසා ආවට කමක් නැහැ. ප්‍රශ්නයක් නැහැ. මොකද හවුලේ ගෙවල් දොරවල් හැදුවේ නැහැ. සභාවේ මුදල් අපි අරගෙන ආදායම් මාර්ග ගොඩනගා ගත්තේ නැහැ. එහෙම කාටවත් කියන්නත් බැහැ. කියන්නෙත් නැහැ. හදිසියෙන් එහෙම ආවා නම්, ඒක පුළුවන් විදිහට නිරාකරණය කර ගන්න බලනවා. අම්මලා තාත්තලා අපි වගේම දරුවෝ හදලා, අරගල වලට එන්න කියලා පොළඹවන්නේ නැහැ. සමාජ විෂමතාවයන් අනුව, දේවල් වලට පෙළඹිලා තමයි දරුවෝ එන්නේ. ඒ විෂමතාවන් අනුව තවදුරටත් පෙලඹිලා එනවනම්, ඒ දරුවන්ගේ අම්මලා තාත්තලාට දුක් විඳින්න සිද්ධ වෙනවා. මොකද ඒ දරුවන්ගෙ අවසානයක් දකින්න වෙනවා. ඉතා අමාරුවෙන් හදා වඩා ගත් දරුවා නොමඟට යන්නේ සමාජය නිසා. ඒ දෙමව්පියන්ට දුක් විදිල්ල පමණයි ඉතුරු වෙන්නේ. විශේෂයෙන්ම මම බලාපොරොත්තු වෙන එකම දේ තමයි. මේ ලබපු අත්දැකීම් වලින් නැවත කිසිදු දවසක දේශපාලනයක් කරන්නේ නැහැ කියන එක. පසුගිය කාලයේ ඇති වුන දේවල් වලින් මට මගේ දේශපාලන ගමන අපුල වෙලා තිබුණා. ඇත්තටම හැම කෙනාටම කියන්නේ සමාජ මෙහෙවරක් කරන්න, දේශපාලනයක් ඕනෙ නැහැ. අපි දේශපාලනයට එන්න කලියෙන් විශාල සමාජ මෙහෙවරක් කළා. හැබැයි සභාවෙ සල්ලි අරගෙන නෙවෙයි. මගේ කොට්ඨාසයේ ජනතාව අපිට වචනයකින් හරි උදවු කලා මිසක් අපට වචනයකින්වත් ගහන්න සැලසුම් සහගත දේවල් කලේ නැහැ. ඒ වගේ හොඳ පිරිස අතරෙ තමයි තිරිසන් පිරිසකුත් හිටියේ. මේක අප වටහා ගෙන ඉදිරි ගමන යා යුතුයි සඳහන් කරමින්, විශේෂයෙන් මේ අවස්ථාවට සම්බන්ධ වුණ අපේ මන්ත්‍රීතුමියටත් සුබ පතමින්, සියලු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

සභාවෙන් අවසරයි. කතා කරන්න හුඟක් කාලෙකින් කතා කරන්න හිතුනා. ලබන සභාව තියේවිද නැද්ද කියලා දන්නේ නැහැ. අනිවාර්යෙන් තියෙනවා. ඒ වගේම පසුගිය දිනවලදී ඇතිවු කලහාකාරී තත්ත්වයේදී අපේ සුභාෂි මන්ත්‍රීතුමියටත්, අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාටත් වූ අසාධාරණය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා. මම හිතන්නේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා ඒ දේට සහභාගි වුණේ ඉතාමත් සත්භාවයෙන්. බොහොම සාමකාමීව. අපේ දෙපැත්තෙම මන්ත්‍රීවරු එහෙම තමයි. පහරදීමකට වගේ දේකට පෙළඹිලා නොවෙයි ගියේ. කවදාවත් අපේ සභාපතිතුමා එහෙම කරන කෙනෙක් නෙවෙයි. නමුත් ෆේස්බුක් දාලා සමහරු

නින්දා අපහාස කළා. ඉතිං ඒ ගැන අපි කණගාටු වෙනවා. සමහරු අද වෛරයෙන් කතා කළා. නමුත් මම දන්නවා. මෛත්‍රී සහගතව කටයුතු කරන අපේ මන්ත්‍රීවරු, බොහොම අහිංසක පිරිසක්. කුමන හෝ දේවාශිර්වාදයකින් හරි ගිහිපු දහදෙනා බේරිලා ආවා. ඒක අපට සතුටක්. අපි දැක්කා. මේ අලාභහානි සිදු වෙච්ච මන්ත්‍රීතුමාගේ සහ මන්ත්‍රීතුමියගේ ගෙදරට යද්දි. ලක්රුවන් මන්ත්‍රී තුමාගේ දරුවන්ගේ සෙල්ලම් බඩුවක්වත් තියලා නැහැ. පොඩි ළමයින්ගේ දේවල් කඩලා බිඳලා දාල තිබුනා. ඒ මිනිස්සු හැසිරිලා තියෙන්නේ පුදුම වෛරයකින්. ගෙදර තියෙන පොල් බෑය, මැෂින්, දොර ජනෙල් වීදුරු ඔක්කොම කඩලා දාලා. මොන හිතකින් එහෙම කරනවද අනේ මම දන්නේ නැහැ. ලිග්ගල පවා පෙරලලා දාලා, හරිම අමානුෂික ලෙස තමයි මිනිස්සු හැසිරිලා තියෙන්නේ. මේ දේවල් මෙහෙම සිදුවීම සම්බන්ධයෙන් අපිට කණගාටුයි. සම්පත් අතුකෝරල මහතා, රමේෂ් පතිරණ මහතාගේ ගෙවල් ආදී ගිනි බත් කරලා, ඒ සියලුම නිවාස සම්බන්ධයෙන් කනගාටු වෙනවා.

අපේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා කතා කලා. දේශපාලනය එපා වෙලා. නමුත් එපා වෙනවා නම්, එපා වෙන්න තිබුනේ, 89 කාලේ. ඒ වගේ ගල් ගැහුවේ නැහැ. ජේවීපී එක විසින් ග්‍රාමෝදය සභාපතිතුමාලා මැරුවා. එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දීපු කට්ටිය, ඒ කාලේ මරලා දැම්මා. නමුත් ඒ කාලේ කවුරුත් අයින් වුණේ නැහැ. ඒවට මුහුණ දීලා, දේශපාලන කටයුතු ඒ තරමට කරන්න ගියෙත් නැහැ. පළිගන්න ගියෙත් නැහැ. ඒ පක්ෂයේ ඒ වගේ අයත් තවම ජීවත් වෙනවා. ශක්තිමත්ව අදටත් දේශපාලන කටයුතු කරනවා. ඒ නිසා මේ අය තැලිලා, පොඩිවෙලා පැත්තකට වෙන එක නෙවෙයි වෙන්න ඕන. ඉදිරියට එන එකයි කරන්න ඕන. ඒ නිසා නින්දා අපහාස විඳින්න වුවත් සිදු වෙනවා. මේ කලබල ටික කාලයයි. දැන් හොඳ අගමැති කෙනෙක් පත්වෙලා තියෙනවා. අපි කිව්වා එතුමා අගමැති වෙයි කියලා. ඒ වගේම මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි අදටත් ආදරෙයි. බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. අපි වෙනුවෙන් නියෝජනය කල ඒ සභිකයින් දහ දෙනාට, ඔවුන් අපහසුතාවයටත් පත් වුණා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාලා කරන ප්‍රකාශ, වෛරය වපුරන එක තමයි කරන්නේ. ඒ නිසා ඒක අපටත් හොඳ නැහැ. සමාජයටත් හොඳ නැහැ. අපි කවදාවත් සාධාරණ දේවල් යන මතයේ හිටියේ. මොන පක්ෂයේ වුණත් මනුෂ්‍යයෙකුට යම් අසාධාරණයක්, හිරිහැරයක් වෙනවා නම්, අපි ඒවා නැවැත්තුවා. අපහාස නින්දා කරන එක නෙවෙයි දේශපාලනය කියන්නේ. ඒවා විඳදරාගෙන යුතුකම් ඉෂ්ට කරන එකයි. සියලු දෙනාට හොඳ දේශපාලන ගමනක් යන්න ප්‍රාර්ථනා කරමින්, අපේ සභා කාලය තුළ අපේ සභාපතිතුමා, උප සභාපතිතුමා ඉතා ආදර්ශමත්ව කටයුතු කලා. යම් යම් අඩුපාඩු ඇති වෙන්න ඇති. ඒ නිසා එතුමන්ලාට ගරහන්නෙ නැතුව කටයුතු කරන්න දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම මේ අවස්ථාවේ නැගී සිටියේ, සුහාෂි මන්ත්‍රීතුමියටත්, ලක්රුවන් මන්ත්‍රීතුමාටත් සිදුවුන සිදුවීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන්න. පහුගිය නම වෙනිදා වූ සිදුවීම සම්බන්ධයෙන් දෙපැත්තෙන්ම වෙච්ච දේ වැරදියි. එතුමන්ලට නීතිය පැත්තෙන් ගන්න පුළුවන් දේවල් සොයා බලලා, සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔවුන් ගැන සොයා බලා කරන්න පුළුවන් දෙයක් නම් එය ඉටුකර දෙන්න කියලා. ඇත්තටම දේපල විනාශ කිරීම සම්බන්ධව බෙහෙවින් කණගාටු වෙනවා. ඒ වගේම අපේ කොට්ඨාසයේ හිටපු වෙරංග මන්ත්‍රිතුමා එම ස්ථානයට සහභාගි නොවුණ එක සම්බන්ධව සතුටු වෙනවා. ඒ වගේම අද අලුතින් අපේ සභාවට පැමිණි ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මන්ත්‍රීතුමිය මේ අවස්ථාවේ පිළිගනු ලබනවා. ඒ වගේම සභා කටයුතු සාර්ථකව කරගෙන යාමට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම දැන් තුන්වේල හම්බකරගෙන කන්න බැරි

තත්ත්වයක් උදාවෙලා තියෙනවා. නව අග්‍රාමාත්‍යතුමාට තව නොබෝ කාලයකින් යහපත් ආර්ථිකයක් ගොඩනගන්න අවශ්‍ය ශක්තිය, ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මං හිතන්නේ මේ වෙලාවේ දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු නොවුනත්, පසුගිය 09 වැනිදා මේ රටේ යුද්ධය නිම කරපු, ඒ වගේම රට එක්සේසත් කරපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට සමුදීම සඳහා, ආරාධනා කරන ලද රැස්වීමට සහභාගි වුවත්, කැරැල්ලකට සම්බන්ධ වෙන්නවත් මැදිහත් වෙන්නවත් අපි කොළඹ බලා පිටත් වුණේ නැහැ. අපි එතුමන්ට සුභාශිංෂණ එකතු කළේ. අපි අරගලයට නොගිය බව පැහැදිලියි. නිරුපද්‍රිතව ඒමෙන්ම, අපි දහදෙනාට කිසිම කරදරයක් වුනේ නැහැ. මොකද සද්භාවයෙන් අපි සහභාගි වුණේ. ඒක අපට විතරක් නෙවෙයි. ඔබතුමාලට ආරාධනාවක් ලැබුනත්, හැමදෙනාම දේශපාලනය කරන අය හැටියට සම්බන්ධ වෙනවා. අපි සම්බන්ධ වුනත්, නොවුනත් කඩාකප්පල්කාරීන් අතින් ඒ කටයුත්තක් සිද්ධ වුණා. දීර්ඝ වශයෙන් ඒ සම්බන්ධව කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. පසුගිය නම වෙනිද සිද්ධියෙන් සුභාෂි මන්ත්‍රී තුමියගේ නිවසටත් මගේ නිවසටත් බරපතළ ප්‍රහාරයක් එල්ල වුණා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මට සඳහන් කරන්න ඕනෑ මම උඩවැලිවිටිය කොට්ඨාශයේ කොයි වෙලාවක වත් දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව සියලු දෙනාට ලබා දෙන සියලු දේවල් ලබා දෙන්න පසුගිය වකවානුව තුළදී කටයුතුකළා. මම කවරකවදාවකවත් බලාපොරොත්තු වුණේ නැහැ මට මෙවැනි ප්‍රහාරයක් එල්ල කරාවි කියලා. අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය ඕනනම් මේ වෙලාවේ සාක්ෂි දරාවි මම හැම වෙලාවෙම උඩවැලිවිටිය ප්‍රදේශයට අලුත් දේශපාලන සංස්කෘතියක් ලබාදුන්නා කියන මතයෙන් මම සෑහෙන්න සතුටු වෙවී හිටියේ. කවදාවත් දේශපාලන වශයෙන් කිසිදු පුද්ගලයෙකුට බලපෑම් කරල නැහැ. ඒ වගේම දෙන දෙයක් පක්ෂ පාට කියලා බලලා බෙදල නැහැ. දවස් ගත්තොත් පොදුජන පෙරමුණේ පස්දෙනෙකුට යම් දෙයක් ලබා දුන්නොත් අනෙකුත් පක්ෂවල අයටත් ඒ වගේම ලබාදීලා තියනවා. උඩ වැලිවිටිය කොට්ඨාශයෙන්, මැතිවරණයට ඉදිරිපත් වුණා. අපේ රෝහණ රාලහාමිගේ නෝනා ඇය තමයි වැඩිම මනාප ගත්තේ එහෙම අරගෙන තිබෙද්දීත් ග්‍රාම නිලධාරී වසමේ රෝහණ රාළහාමිට වැඩ කරන්න අවස්ථාව සලසා දුන්නේ මම, අපි මන්ත්‍රී වරයකුට වැඩිය මේ දිනවල ප්‍රබලත්වය තියෙනවා ග්‍රාම නිළධාරි වරයට යමක් කරන්න පුළුවන් හැකියාව තියෙනවා. නමුත් ඔහුට වැඩ බලන්න එක ග්‍රාම නිලධාරී වසමක් වගේම ස්ථිර ග්‍රාම නිලධාරී වසම් දෙකක් එතුමාටත් ඒ අවස්ථාව සලසා දුන්න. කිසිම දේශපාලන පක්ෂයකින් තොරව. ඉතිං ඒ නිසා මම පැහැදිලිව අවංකවම ආරවුලක් නැතිව මේ දේශපාලන කටයුතු ටික කරගෙන ගියා. කාටහරි යම් අවස්ථාවකදී වුමනාවක් තිබුන මේක අවුල් කරන්න. එහි ප්‍රතිඵල දැන් ලැබිලා තියෙනවා. ඔය ප්‍රහාරය දියත් වන අවස්ථාවේ අපේ බිරිඳවත් දරුවන් වත් කවුරුවත් හිටියේ නැහැ. අපට කියන්න බැහැ මේ ප්‍රහාරය කවුද? දියත් කළේ කියල. කාටවත් ඇඟිල්ල දික් කරන්නෙත් නැහැ. පොලිසිය අහපු වෙලාවෙත් සුභාෂි මන්ත්‍රීතුමියත් අපි දෙන්නම හිටියේ නැහැ. මේ ප්‍රහාරය වන අවස්ථාවෙ පොලීසියට ඊට පසුව ගිහිල්ලා උත්තර දුන්නේ. මම දන්නෑ මොන බලවේගයකින් ක්‍රියාත්මක උනාද කියෙලා. මට විතරක් කළ ප්‍රහාරයක් නෙවෙයි. කොට්ඨාශය බෙරව ගොඩින් පටන් ගත්තම මට උදව් කරන ගුරුන්නාන්සේ ගේ නිවසට ගැහුවා. ඊට පස්සේ මගේ කාර්යාලය දාන හැමදාම මගේ අජිත් බෙන්තොට මහත්තයගෙ ගෙදරට ගැහුවා. ජාතික ලැයිස්තුවේ නියෝජනය කරන නිලූකා වික්‍රමනායකගේ නිවසට ගැහුවා. එතනින් ගියහම අපේ අම්මගේ බාප්පගෙ ගෙදරට ගැහුව. ඒවගේම මා සමඟ ඉතා සමීපව කටයුතු කරන සරත් කුමාරගේ සම්පූර්ණයෙන්ම කඩේ විනාශ කළා. මේ වගේ භය පළකට මගේ කොට්ඨාශයේ ප්‍රහාරයක් දියත් කලා. දේශපාලන ගමන්මග යම් අවුලක් නැතිව යන ගමන අවුලක් හදාගන්න මේ දේ කලා කියලා මම විශ්වාස කරනවා. ඇත්තටම මගේ දරුවන් කොළඹ ප්‍රදේශයෙ ස්කෝලේ

ගිහිල්ලා ඒ දරුවන් කොළඹින් අරගෙන මම ඔය නිවසට ඇවිල්ලා බොහොම කෙටි කාලයක් ,ඒක යථා තත්ත්වයට පත් කරගන්න බැරි වුණා. කොහොමහරි අපේ ගරු නන්දන මන්ත්‍රීතුමාත් විජිත් සහබන්දු මන්ත්‍රීතුමාත් වගේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් දැක්කා ඒ වගේම මගේ දරුවන්ගේ පාසල් අච්චු පොත් පවා නැති කළා. පොත් පත් ඇඳුම් කපල දාල තිබුණා. සපත්තු විනාශ කරල ගිහිල්ලා තිබුණා. ඒ වගේම කණ වළඳක් වත් ඉතුරු කරල නැහැ. මොන චේතනාවකින් මොන පරමාර්ථයකින් මේ දේ කලා ද කියල මම දන්නෙ නැහැ. හැබැයි මම සතුටු වෙනවා මම මිනිස්සුන්ට උදව් කරලා තියෙනවා. ඒ වගේම ලක්ෂ හයගානෙ ගෙවල් පහළොවක් මම මගේ කොට්ඨාශෙ ඉදිකළා. නිවාස ඉදිකල සමහර අයට මුදල් දෙන්න තියෙනවා. සමහර අය ලින්ටන් එක දාල තියෙනවා. සම්පූර්ණයෙන් ගෙවල් දහයක් විතර වැඩ අවසන් කරලා තියෙනවා. රුපියල් පනස් දාහෙ වැසිකිලි පහලවක් විතර තියෙනවා. මේ පහුගිය වකවානුව තුළ ඒ වගේම පවුල් එකසිය පනහක් විතර කුරුඳු පැල පවුල් ගානකට දුන්නා. නුදුන්න තැනක් නැහැ. කුකුළු පැටව් පක්ෂ පාඨයෙන් තොරව අන් හැම තැන්වලටම වැඩිය ලබලා දුන්නා. මගේ ගෙට ගහපු එක මගේ වළඳ ඇතිලියට වෙච්ච හානිය නෙවෙයි දැන් ස්මතු වෙලා පෙනෙන්නේ, පොලීසිය විසින් යම් කණ්ඩායමක් අත්අඩංගුවට අරගෙන තියෙනවා. ඒ කණ්ඩායමත් අඩංගුවට ගැනීම තමයි ප්‍රශ්නය වෙලා තියෙන්නේ. මම දන්නෙ නැහැ ඒ අය සම්බන්ධයෙන් කාගෙවත් නම් ගම් මම කියන්නෙත් නැහැ. මට උසාවියේ නඩුවක් අවශ්‍යාත් නැහැ.

මේ සම්බන්ධයෙන් මම කියන්නේ මම ඇස් දෙකට දැක්කේ නැහැ. කවුද මේ සඳහා ආවෙ කියලා. අපේ දරුවො දැක්කෙත් නැහැ. ඒ නිසා අද වුණත් මම සදහන් කරන්නෙ මට ඒක අදාල නැහැ. පොලිසිය යම් අදාල රාජකාරියක් කරාය කියන එක විශ්වාස කරනවා. ආගමානුකූලව මම යම්කිසි වැඩකටයුතු ප්‍රමාණයක් සිද්ද කරනවා. ඒක මම දන්නෙ නැහැ මොන වගේ සිදුවීම් වෙච්ද කියලා. ඒ වගේම මේ වන විට මට මරණ තර්ජන ඇවිල්ලා තියෙනවා. යම් යම් පුද්ගලයන් ගෙන් ඒ වගේ ප්‍රශ්න අද ඇතිවෙලා තියෙනවා. ඒක මට විතරක් නෙවෙයි සුභාෂි මන්ත්‍රීතුමිය ටත් ඇතිවෙලා තියෙනවා. ඇයට බොහෝ තර්ජන ගර්ජන කරලා තියෙනවා. අපි මෙතන මොන විදිහට ඇවිල්ල තිබුණත් මුහුණ දීගෙන සිටියත් අපිට ලොකු ගින්දරක් දීලා තියෙනවා. අපි මොන දේවල් කළත් වපුරන දේ තමයි අරන් යන්නෙ. මම කිසිම දෙයක් නොකළොත් නොකල මට මගේ ඉන්න ලොකු අක්කා ඇවිල්ලා මගේ දරුවො ටික අයින් කර ගත්තෙ නැත්නම් මට ඒ අයත් නැති වෙන්න තිබුණා. ඒ කොහොම උනත් මට අද මුල ඉඳල පටන් ගන්න වෙලා තියෙන්නෙ. කිසිම දෙයක් මට නැති වෙලා තියෙන්නෙ. මට අඳින්න තියෙන්නෙ මේ ඇඳුම විතරයි. ඒකත් ඇඳන් හිටපු නිසා. සියලුම ඇඳුම් පැළඳුම් කබඩ්වලින් ඇදලා දාලා වීදුරු පොඩි කරල දාලා තියෙන්නේ ඒක උඩ තමයි. ඒවා මොන විදිහටවත් පාවිච්චි කරන්න බැහැ. වීදුරු කටු නිසා, ගිණි තියල හානි කරල නෙවෙයි. මෙම නිවසෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම තමයි අරමුණ වෙලා තියෙන්නෙ. ජනතාවම කියනවනම් ඔයා ඔය යන ගමන වැරදියි ඔයා ඔහොම නෙවෙයි යන්න ඕන එක එක මිනිස්සු කියනවා. ඒ කොහොම වුණත් මගේ දේශපාලන ක්‍රියාවලිය මම නතර කරන්නේ නැහැ. සක්‍රීයව ඉදිරියේදී නිරත වෙලා ඉන්නවා. මම හම්බකරගෙන නැහැ. අපේ ඕනම මන්ත්‍රීවරයකුට ගිහිල්ලා බලන්න පුළුවන් පොලිස් නිලධාරීන් පවා මට දොස් කිව්වේ. මම මගේ දරුවන්ට කොන්ත්‍රාත්කාරයෙක්ගෙන්වත් කවදාවත් රුපියලක් අරගෙන කන්න දීලා නැහැ. මම සාධාරණ විදිහට මගේ වැටුපෙන් හම්බ වෙන විදිහට පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් කටයුතු කලා. අපේ නන්දන මන්ත්‍රීතුමා අපේ අල්ලපු ගෙදරට ගිහිල්ලා අපි ගැන විස්තර සොයා බලා තිබුණා දුරකතනයෙන් පවා කතා කළා.

එතුමන්ලා දන්නවා මම ජීවත් වෙන්නේ කොහොමද කියලා. අපි දේශපාලනය කළේ ගමට වැඩක් කරන්න ගම ශක්තිමත් කරන්න. 2002 පළමුව ප්‍රාදේශීය සභාවට පත් වන්නේ සක්‍රීය දේශපාලන කටයුතු කළා. මම කවදාවත් මුදල් ගහගන්න වත් ඒ ජරා වැඩ කළේ නැහැ. කොහොම හරි කාට හරි වුවමනාවක් තිබුණා යම් ව්‍යාකූලත්වයක් හදන්න. මේ තත්ත්වය ඇති

කරන්න මොනවා හරි සිදුවීම් සිදු වෙන්නැති. ඉතින් ඒ නිසා ඒ පිළිබඳව මම සැලෙන්නේ නැහැ. ශක්තිමත් වෙනවා හැම වෙලාවෙම, මොකද අදටත් දූකක් නැහැ. කිසි කෙනෙකුට ඇඟිල්ල දික් කරන්න බැහැ. මේ විදියට සිද්ධ වුණා කියලා. කණගාටු වෙන්නෙත් නැහැ. අපේ සියලු මන්ත්‍රීවරුන් මට කතා කළා අපේ දරුවන් පවා රාත්‍රියෙදි තවමත් බය වෙනවා. දකිනවා

ඊළඟට අපේ සභාව පිළිබඳව දීර්ඝ වශයෙන් කතාබහ වුණත් ඊට මත්තෙන් අපේ නාගොඩ රාජකීය විද්‍යාලයේ කීර්තිමත් විදුහල්පතිවරයෙක් වෙලා හිටපු ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා, එතුමාත් මේ ලංකාවට දකුණු පළාතට බිහිවෙච්ච ශ්‍රේෂ්ඨ දේශපාලඥයෙක් එතුමන්ගෙ නිවසත් කඩා බිඳලා දාලා ඒ ආදරණීය පුත්‍ර රත්නයට ප්‍රහාරයක් දියත්කර ගේ ගිණි බත් කළා. ඒවත් අනුමත කරන්න බැරි ක්‍රියාවන් යම් යම් අඩුපාඩු තිබුණත් හිනිදූම ආසනේට දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයක් දී ඇති සම්පත් අතුකෝරල මැතිතුමාගේ නිවසට ප්‍රහාරයක් දියත් කළා. දැඩි පිළිකුල් ප්‍රහාරයක් එල්ල වුනා. ඒ සම්බන්ධයෙන් බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වගේම නැවතත් සඳහන් කරන්න ඕන සුභාෂි මන්ත්‍රී තුමියගේ කෙළිලොල් වයස තමයි මේ මන්ත්‍රීවරියක් වශයෙන් පත් වෙලා මේ ගත කරන්නේ. ඇයගේ ඒ කාලවකවානුව තරුණියකට මීට වඩා ලොකු ගමනක් යන්න හැකිව තිබුණා. නමුත් මේ අවංක දේශපාලනය නිසා ඇය කාන්තාවක් වුවත් පසුගියදා තිබ්ච්ච මැතිවරණවලදී පුදුම කැපකිරීමක් සෑම මැතිවරණයක් සඳහා ම එක වගේ එතුමියගෙ ගෙදර සියලු කටයුතු සිදුකළා.නමුත් ඇයට දැඩි ප්‍රහාරයක් දියත් වුණා. මේ දේවල් ගොඩනැගුවෙ එතුමියගෙ දෙමව්පියන් ඒ පිළිබඳව දැඩිව හෙළා දකිනවා.

දැන් අපට ඉතිරි වෙලා තියෙන්නේ මේ කුමන පක්ෂයකට වුවත් මැතිවරණය ජයග්‍රහණය කරලා වැඩ කරන්න බැරි පසුබිමක්, අද නීතියක් නැහැ. පොලිසිය ඉස්සරහ මිනිස්සුන්ට ගහලා මරණ තත්ත්වයක් ඇතිවෙලා තියෙන්නේ, මේ රටේ නීතිය පසිඳලන ස්ථානය මේ රට මේ තත්ත්වයට පත් වෙන්න ප්‍රථම කාරණය තමයි රටේ බදු මුදල් නොලැබීම නමුත් බදු මුදල් වලින් මිනිස්සු ඉදිරිපත් කළත් නීතිපතිවරු නොමිලේ ඔවුන් වෙනුවෙන් කතා කරනවා. පේ රටේ නීති ආධිපත්‍යය ඉස්සරහට ගෙන යන්නෙ. මේ සභාවට අදාල නොවුනත් සඳහන් කරන්නම ඕන රටේ නීතිය නැති උනොත් අපි කාටවත් පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් උදා වෙනවා. ඒ නිසා මේ රටේ වැඩිම මුදල් ප්‍රමාණයක් හම්බකරන මේ රටේ ඉන්න ඔය නීතිඥ ප්‍රජාව මොන ආණ්ඩු ආවත් නීතිඥයින් සඳහා නඩුවකට නිශ්චිත ගානක් නියම කිරීම තමයි කරල නැත්තෙ. අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ගේ සිට පාර්ලිමේන්තුවේ 225 දෙනාටම මහජනතාව ඇඟිල්ල දික් කරනවා බලන්න රටේ පොදු මහජනතාව ගෙන් ඉටු වෙන්න ඕන යුතුකම් ඉෂ්ට වෙලා තියෙනවද කියලා. ගමේ කවුද පාරේ වතුර වලක් වහගත්තෙ, පොදු පාර වල් වල තණකොළ ගහක් කැඩුවෙ කව්ද? අද ඔය අරගල වල ඉන්න අයට කියන්න තියෙන්නෙත් සියලු දෙනාම තමන්ගේ යුතුකම ඉටු නොකිරීමේ ප්‍රතිවිපාක තමයි ඔය විඳින්න වෙලා තියෙන්නෙ. 89 ට එහා ගිය වැඩපිළිවෙළක් ජනතා විමුක්ති පෙරමුණ ලෑස්ති කරගෙන තියෙනවා. ඒකට මේ රටේ මහජනතාව මොන විදිහට ප්‍රතිචාර දක්වයිද දන්නේ නැහැ. අද පාර්ලිමේන්තුවේ 225 දෙනාම බලලෝභීත්වයෙන් යුක්ත අය ඉන්නේ, තනිපුද්ගලයෙක් වෙලා රනිල් වික්‍රමසිංහ මහතා මේ බැරෑරුම් අවස්ථාවේ රට බාර ගන්න කලින් ඉඳලා කිව්වා රජයට උපදෙස් දුන්නා මේ දේවල් කරන්න කියලා. ඔය අරගල කරපු අය දැන් ආණ්ඩුව වෙනස්වෙලා, දැන් අරගලය ඉවර වෙලා ,සමාජය සමග බැහැල වැඩ කරන්න ඕන. එහෙම නොකලොත් මේ රට හදන්න නම් කම්කරුවගෙ ඉඳල ඉහළ කෙනා දක්වා කැපකිරීමක් කරන්න ඕන. මං දන්නෙ නැහැ පෝලිං හැමදාම පෙට්‍රල් පෝලිං ,ගෑස් පෝලිං කණ්ඩායමක් වොයිස්කට් දෙන්න බලන් ඉන්නවා. මොන දේ කළත් හොඳ නැහැ වෙරංග මන්ත්‍රීතුමාගේ කතාවට මම එකඟයි.ඒ අපට වැරදුනු තැන් දැන් ප්‍රාදේශී සභා මන්ත්‍රීවරු හැටියට අද දවසෙ කිසි කෙනෙක් ගණන් ගන්නෙ නෑ. මේ සභාපති වරයාගේ බලතල ටික ප්‍රාදේශීය ලේකම් ක්‍රියාත්මක කරනවා. පනත් වල ඒවත් එහෙමමයි. හෙට දවසේ ප්‍රාදේශීය සභාව තිබුනොත් මේ වෙනුවෙන්

හෙට දවසේ අනිවාර්යෙන් අරගලයක් කරනවා .පොලීසිය දන්නෙ නැහැ අද ඉන්න රාජ්‍ය සේවකය දන්නෙ නැහැ

මහජන නියෝජිතය කියන්නේ කවුද කියලා. අපි පොදු මහජනතාව වෙනුවෙන් පෙනී ඉන්න ඇවිල්ලා ඉන්නේ, ඒත් සමහරු හිතන් ඉන්නේ අපි හොර වැඩ කරන්න හම්බ කරන්න කියලා. කිසිම හොරෙක් ආරක්ෂා කරන්න මේ සභාව අනුබල දීලා නැහැ. මේ ගෞරවණීය සාධාරණ සභාවක් ආදර්ශමත් සභාවක් ලෙස සඳහන් කරන්න ඕන. සභාව කරගෙන යද්දි සභාපතිතුමාට විශාල චෝදනා ආවා. ඒත් ඒවට වගකියන්න ඕන ඔබතුමා. අපේ සභාපතිතුමා ඇහුම්කන් දෙනවා. නමුත් අපේ සභාපතිතුමාට මේ කිසිදු සේවකයෙක්, මන්ත්‍රීවරයෙක්වත් කවුරුත් විශ්වාස නැහැ. පොඩි සැකයක් තියෙනවා එතුමට. ඒක හදා නොගත්තොත්, එතුමා වගේ සංවේදී සභාපතිවරයෙක් මේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ බිහිවෙන්නේ නැහැ. සංවේදී හදවතක් තියෙන, යමක් කරන්න උත්සාහ ගන්න පුද්ගලයෙක්. ඒ වගේම ඔහුට සභාපතිකම දරන්න වාසනාව තිබුනට, කිසිම කෙනෙක් විස්වාස නැහැ. මම ඔබතුමාට අදත් හෙටත් ආදරෙයි. ඔබතුමත් එක්ක මෙතුමාට ලැබුණු දෙයින් ඵල නෙලා ගන්න බැරි වුණා. මේ වාසනාව ටික කාලෙටයි. ඉදිරි කාලවකවානුවේදීවත් ඔබතුමා යම් වැඩක් පිළිවෙලට කරලා, සියලුම නිලධාරීන් නිවැරදි මාවතකට අරගෙන, කල යුතු දේවල් හැමදාම මම කිව්වා මාර්ග කම්කරුවන් යොදවන හැටි මම කිව්වා. මාර්ග නඩත්තු හදන විදිහ මම කිව්වා. පාරක් තණකොළ ගහන්න හරි තියෙනවා නම්, ඇස්තමේන්තු හදලා, ඇස්තමේන්තු අනුව, කම්කරුවෝ ටික යොදවන්න කියලා මම කිව්වා. හැම කොට්ඨාසයකටම ශ්‍රමදානයක් දාලා, මේ සියලු සම්පත් අරගෙන අපි ගොඩනැගෙමු කියලා කිව්වා. වහල තියෙන ආයුර්වේදයේ තියෙන බෙහෙත් ටික අපේ උඩවැලිවිටිය කොට්ඨාසට ගෙනිහිල්ල හරි, මාපලගමට හරි ,උනන්විටියට හරි කොහේ හරි ගෙනිහිල්ලා මිනිස්සුන්ට ලබා දෙන්න කියලා මම කිව්වා

යම් යම් කාර්යයන් කරද්දී අපේ අතින් අතපසු වීම් සිදු වුණා. ඒ සියලු දේවල් අපේ මන්ත්‍රීවරුන් අමතක කරමින්, විශේෂයෙන්ම අපේ උප සභාපතිතුමා සහයෝගය දුන්නා. අපි සභාවෙ ඉන්න කාලේ, සභාපතිට උප සභාපති වැඩක් කරන්න දුන්නේ නෑ. නමුත් අපේ උප සභාපතිතුමා ඒ සියලු දේ සායා බලලා උදව් උපකාර කළා. ඒ සම්බන්ධව මම ගෞරවයෙන් සිහිපත් කරනවා. මම හෙට දවසේත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බව පවසමින්, නවක මන්ත්‍රී තුමිය වන ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මියට සුබ පතන ගමන්ම, සියලු දෙනා එකතුවෙලා, මේ රට ගොඩනගන්න සහය දක්වමුයි ආරාධනා කරමින්, මම නිහඬ වෙනවා, ස්තුතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේ ගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඉතා කනගාටුදායක සිද්ධි කිහිපයක් සිදු වුණා. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා, ඒ වගේම සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමිය ඔවුන්ගේ හිතවතුන් කිහිප තැනකට, මේ ප්‍රහාරය දියත් වුණා. ඒ අවාසනාවන්ත සිද්ධිය පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වගේම පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කැබිනට් අමාත්‍ය, රමේෂ් පතිරණ මහතාගේ නිවස ගිනිබත් කළා. අපේ හිනිදුම් ආසන සංවිධායක ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතාගේ නිවස කුඩු කළා. මොහාන් ප්‍රියදර්ශන මහතාගේ නිවස ගිණිබත් කළා. චන්දිම වීරක්කොඩි මහතාගේ, ඒ වගේම අපේ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක් වන විජේපාල හෙට්ටිආරච්චි මහතාගේ නිවෙසද ගිනිබත් කළා. ඉමදූව සභාපතිතුමා ජීවිතයෙන් සමුගත්තා. ගාල්ල දිස්ත්‍රික්කය නිවාස තිස් ගානක් විනාශ කරන්න මේ ත්‍රස්තවාදීන් කටයුතු කළා. (මම ඔවුන් හඳුන්වන්නේ තස්තවාදීන් කියලා) පිළිබඳව මගේ කණගාටුව හා පිළිකුල මේ අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරනවා. පොදු දේපල විශාල ප්‍රමාණයක් ගිනිබත් කරලා, විනාශයට පත් කළා. මොරටුව නගර සභාවේ සියලු රථවාහන, නගර සභාව සම්පූර්ණයෙන් විනාශ කළා. ඒ සම්බන්ධව අපි කතා කරනවා නම්, සභාවෙන් අපි පිටත් වුනේ,

මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගෞරවනීය සමුගැනීමක් දෙන්න හිතාගෙන. සභාපතිතුමාට මම අද චෝදනා කරන්නේ නැහැ. මම ඔය සියලු චෝදනා සම්බන්ධව කලින් ඉදිරිපත් කළා. ඊට වඩා මම කතාකරන්නේ නැහැ. ඒව පුළුවන්නම් නිවැරදි කරගන්න කියලා තමයි ඉල්ලන්නේ. අපි මෙතනින් පිටත් වුනේ හිටපු ජනාධිපති වසර 30 ක පූර්ණ යුද්ධයක් ඉවර කරලා, මේ හැමෝටම නිදහසේ ජීවත් වෙන වටපිටාව හදලා දීපු, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගෞරවණීය සමුගැනීමක් දෙන්න. ඇත්තටම බලාපොරොත්තු වුණේ. ගෝඨාභය මහත්තයා ජනාධිපති වීමත් සමග මහින්ද මහත්තයා දේශපාලනයෙන් ඉවත් වෙයි කියලා. එහෙම වුණා නම් මොකද අපි ඒ නායකයෙක් හැටියට, අපි එයත් එක්ක හිට ගන්න එක ඇත්ත. අධ්‍යාත්මික වශයෙන් විශාල සේවාවක් කරන්න තිබුණා. මාධ්‍ය මගින් ඇතම් පිරිස් මේක සම්පූර්ණ විකෘති කරලා, එතුමාගේ ප්‍රතිරූපය හා ඒ සියල්ල විනාශ කලා. මට හිතෙන්නෙ එදා රමේෂ් පතිරණ මහතා ඒ දේ බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා. එම ස්ථානයට අපි ගියේ ගෞරවනීය සමුගැනීමක් දෙන්න. පාර්ලිමේන්තු මන්ත්‍රී කිහිපදෙනෙක් මේ පිරිස වැරදි විදිහට යොදාගත්තා. මම හිතන්නේ, ඒ පිරිස ගිහිල්ලා රැල්ලත් එක්ක ආපු ඒ පිරිසගේ ආවේගයත් එක්ක, අනිවාර්යයෙන්ම ගැටුමක් ඇතිවෙනවා. ඒ ගැටුම මම කිසිම වෙලාවක සාධාරණීකරණය කරන්න සූදානම් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, කියන්න කණගාටුයි මේ රටේ පොලිසිය, නීතියේ කන්‍යාවියගේ ඇස් වහලා, තිබුනට දැන් වහලා නැහැ. මුලින්ම තෙල් බවුසරයක් අරගෙන එන විට, තෙල් බවුසරයක් ගිනි තියන්න උත්සාහ ගනිමින් ඉන්නකොට, වෙඩි තිබ්බ නම් එතන සිදුවන විනාශය අති මහත්. ඒ ගිනි තියන්න හදපු පිරිස වැළැක්වූ පොලිස් නිලධාරීන් අල්ලලා හිරේ දැම්මා. ඒ මිනිස්සුන්ට කන්නත් නැහැ. ඊට පස්සේ මොන පොලිස් නිලධාරියාද තුවක්කුව අතට ගත්තේවත්. එතනම දුන්න වැරදි ආදර්ශය. ඊට පස්සේ මිරිහානෙ ජනාධිපතිතුමාගේ නිවස ඉදිරිපිට ගිනි තිබ්බා. ඊට පස්සේ උසාවියට නීතිඥවරු පන්සියයක් ඉදිරිපත් වුණා. අත්පුඩි ගහලා තමයි අර වැරදි කරපු මිනිස්සු ටික බේර ගත්තේ. ඉතින් ගරු සභාපතිතුමනි, සියලු දෙනාට නීතිය ඉදිරිපත් විය යුත්තේ එක හා සමානව. උඹලා ඕන ජරාවක් කරපල්ලා. අපි බේර ගන්නවා. අපි නොමිලෙ ඉදිරිපත් වෙනවා කියලා නීතිඥවරු කිව්වා. නීතිය කුණු පිරිච්ච තැනක් කියලා මම කියනවා. නීති ආධිපත්‍ය විනාශ දමපු ඒවායේ ප්‍රතිඵල තමයි අපි විශේෂයෙන්ම භුක්ති විදින්නේ කියන එකත් මතක් කරනවා.

අපි බලමු මේ ප්‍රශ්න ඇති වෙන්න හේතුව. ඩොලර් නැහැ. අපි දැක්කා පහුගිය දවස් වල කොරෝනා වසංගතය නිසා සංචාරකයො විදේශ ආයෝජන සදහා ලංකාවට ආවේ නැහැ. විදේශ ආධාර, ණය දෙන්න විදිහක් නැහැ. එම රටවලුත් අසරණයි. රට වහන්න කියපු මිනිස්සු දැන් වීරයෝ වෙලා. ආර්ථික අඩුපාඩු තිබුණා. ඩොලරය ඉහල යාමත් සමඟ, ඩොලර් ටික රුපියල් කරලා, ඒ වාසිය ගන්න මතයක් හැදුවා. ඒ එවන ඩොලර් හොරකම් කරනවා කියලා කිව්වා. ගරු සභාපතිතුමනි, පිටරටින් ලංකාවට විදේශ විනිමය හරහා එවන ශ්‍රමිකයන්ගේ මුදල්, කිසිම දේශපාලන පක්ෂයකටවත්, ජනාධිපතිටවත් හොරකම් කරන්න බැහැ. මොකද ඒව මහ බැංකුව හරහා එන්නේ. ඒ ඩොලර් ටික වැරදි මග යැව්වා. මේක සම්පූර්ණ තමන්ගේ දේශපාලනය කරන්න, 225 ම එපා කිව්වා. හැබැයි අනුර විතරක් ඕන කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා බොහෝම ආදරය වපුරමින්, ශුද්ධවන්ත වෙන්න හදනවා. සමගි ජන බලවේගය නියෝජනය කරමින් කටයුතු කරන විජේපාල හෙට්ටිආරච්චි මහත්තයාගේ ගෙට ගැහුවා. නමුත් ජනතා විමුක්ති පෙරමුණේ එකතැනකට ගිනි තියලා තියෙනවද? ඒක තමයි එකම සාක්ෂිය. සජිත් මහත්තයා එනකොට ගහලා එලෙව්වා. ගහපන්, ගිනි තියපන්, මරපන් කියපු ප්‍රසිද්ධ නළු නිළියො ඉන්නේ අනුර කුමාර ලත් සමග. ගිනි තැබීමේ සම්පූර්ණ මෙහෙයුම ජනතා විමුක්ති පෙරමුණ බව මන්ත්‍රීතුමා, ඉතාමත් කණගාටුවෙන් වුවත් කියන්න ඕන. මේ ගැටලුව ඇති වෙන්න හේතුව, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ප්‍රතිපත්තියක් ගෙනාවා. අපේ දේවල් අපිම හදා ගන්න එක. අපේ වී ටික, ඇඳුම් ටික, ඛනිජ තෙල් සංස්ථාව ගත්තම, පළමුව බොරතෙල් ගෙනාවම, පළමුවම ගුවන්යානා තෙල්, සුප් ඩීසල්, සුපර් පෙට්‍රල්, ඉටිපන්දම් දක්වා, කෘෂි රසායනික නයිලෝන් මේ විශාල සම්පත් තොගයක් ගන්න පුළුවන් ආකාරයකට පෙට්‍රෝලියම්

එක ජනසතු කරලා, අපේ රටේ දේශීය ආර්ථිකයක් හදන්න කටයුතු කළා. නමුත් 1977 ජේ ආර් මැතිතුමා ජනපති වීමත් සමඟ, මේ රට විවෘත ආර්ථිකයක් බවට පත්වුණා. මේ ගැටළුවට ප්‍රධාන හේතුව, ජේ. ආර් ජයවර්ධන මහතා විවෘත ආර්ථිකය ඇති කිරීම. ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා වලෙන් නැගිටලා ආවත් මම හිතන්නේ නැහැ. මේ රට මේ වළෙන් ගොඩ ගන්න හැකි වේවි කියලා. වැරදි, නිවැරදි කරන්න පුළුවන් වේවි කියලා. ඇඟලුම් කර්මාන්ත ඇති කළා. ඒ වගේම ඔය අරගල කරපු අය කවුද කියලා මම හොඳට දන්නවා. මමත් අරගල කරලා තියෙනවා. බාහිර උපාධි අරගලයක්. අපිත් නිර්පාක්ෂිකව තමයි ඒ දේ කලේ. නිර්පාක්ෂික අරගලය කරන්න පෙරටුගාමී පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ ඉඩදෙන්නේ නැහැ. මොවුන් ගිහිල්ලා නිර්පාක්ෂික අරගලයන් විනාශ කරල තියෙන්නෙ. මිනිස්සු ගේ දුක විකුණගෙන කන, මේ වගේ තුප්පහි දේශපාලන පක්ෂ මේ රට ගිනි තිබ්බා. නීතියේ ආධිපත්‍යයට අභියෝග කළ නීතිඥවරු, මේ සියල්ලම වගකියන්න ඕන. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මොකද ප්‍රජාතන්ත්‍රවාදය කියන එක අනෙක් කෙනාගේ නහය ගාවින් අවසන් වෙනවා. අද පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය විකෘති වෙලා තියෙන්නේ. එදා රනිල් වික්‍රමසිංහ මහතා ව්‍යවස්ථාවට අනුකූල නොවන පරිදි, ජනාධිපතිවරයා අයින් කලා කියලා, උසාවි ගිහිපු ජනතා විමුක්ති පෙරමුණ, අද එක පාර්ලිමේන්තු ධූරයක් තියෙන රනිල් වික්‍රමසිංහ මහතා අගමැති වුණා කියලා සද්දයක් නැහැ. දැන් ව්‍යවස්ථාව කඩලා තියෙන්නේ. මට බොහොම කණගාටුයි. මේ ආණ්ඩුවට ජනතාව 2/3 බලයක් දීලා තියෙනවා. ඒක අවුරුදු 1-2 නෙවෙයි අවුරුදු 5කට. නමුත් අද ජනාධිපතිවරයා පැත්තකට වෙලා, 2/3 තිබ්බ පොහොට්ටුව එක් පැත්තක. ඊළඟට වැඩි බලයක් තිබූ සමගි ජන බලවේගය එක් පැත්තක. 3% ක් තිබූ ජනතා විමුක්ති පෙරමුණ එකපැත්තක. එක පාර්ලිමේන්තු ධූරයක් තියෙන රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැති වෙලා තියෙනවා. හැබැයි මම මේදේට කැමතියි. මම බලාපොරොත්තු වෙච්ච දෙයක්. තැල්ල බඳින්න බෙල්ල තියෙන්න ඕන. හැබැයි මොහු කරන්නේ ආණ්ඩුව රකින එකාකාරී රාජපක්ෂවරු රකින ඒක හරි, තමන්ගෙ පිල රකින එක නම්, ඒක අපට පිළිගන්න බැහැ. රනිල් අගමැති වෙනකොට, මුදල් ඇමැති අනුර කුමාර දිසානායක වුනානම්, මම බොහොම කැමතියි. සර්වපාක්ෂික සමුළුවක් හදලා, පළමුවෙන් රට ගොඩගන්නවා නම්, කමක් නැහැ. හැමදාම ණයට ගන්නවා. තෙල් ගෑස් ගේනවා. මේක කවදද ඉවර වෙන්නෙ. බලන්න ගමේ කිරි ගවයෝ ටික එකතු කරලා, ඒ කිරි අරගෙන ආදායමක් ගන්න වැඩපිළිවෙළක් නැහැ. ගෝඨාභය මහත්තයාගේ ගම සමග පිළිසඳරක් වැඩසටහන අසාර්ථකයි. පොහොර ටික නතර කළා. දැන්වත් කිසිම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පක්ෂ විපක්ෂ දේශපාලනය අමතක කරලා, හැමදෙනාම එකතු වෙන්න ඕන. සමහර පිල්ලි, දේශපාලනයට මේවට එකතු වෙන්න දෙන්නෙ නැහැ. අපේ සභාපතිතුමාට මම යෝජනා කරනවා. එහෙන් නෙවෙයි ගමෙන් පටන් ගන්න. මිනිස්සුන්ට හාල් ටික පිටරටින් ගේන්නේ නැතුව, මෙහෙ කරන ක්‍රමයක් පටන් ගන්න. අපි අරයට බැන බැන, මෙයාට බැන බැන විවේචනය කර ගනිමින් ඉන්න එක නෙවෙයි වෙන්න ඕන. මෙතන ඉන්න 27 දෙනා එකතුවෙලා, යම්කිසි වැඩ පිළිවෙලක් හදන්න. හැමදාම කතා වෙනවා. අයාලේ යන හරක් සම්බන්ධව. මේ ටික එකතු කරලා, එක ගෙදරකට ගවයෙක් දෙන වැඩපිළිවෙළක් සකස් කරන්න. සභාපතිතුමනි, කිරි ටික මෙතැනට සම්බන්ධ කරගන්න. අපට පුද්ගලිකව කරන්න බැහැ. සභාපතිතුමනි, කුඹුරු ටික කරද්දි, මිනිස්සුන්ට අවශ්‍ය ද්‍රව්‍ය මේ සභාව හරහා දෙන්න. ඒ වගේ වැඩපිළිවෙළක් ප්‍රාදේශීය සභාව හරහා හරි, යම් ක්‍රමවේදයක් නොයොදා, අඳුරට ශාප කරලා, කිසිම දෙයක් කරන්න බැහැ. ඒ වගේම මම කොච්චර අකමැති උනත් , ජනතාව 225 ප්‍රතික්ෂේප කරද්දී, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධූරය බාර ගත යුතු පුද්ගලයෙක් හැටියට දකිනවා. මොකද එතුමගේ තිබෙන විදේශ සබඳතා නිසා, ලෝකෙ 6 පාරක් හිටපු එකම අග්‍රාමාත්‍යවරයා, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ට සුබපතන ගමන්ම, ජනාධිපති පොහොට්ටුවෙන්, අගමැති එක්සත් ජාතික පක්ෂයෙන් අනාගතයේදීත් තේරී පත් වෙයි කියලා මගේ විශ්වාසයක් තියෙනවා. නමුත් ජනතා විමුක්ති පෙරමුණට එන්න බැහැ. මගෙත් කැමැත්තක් තිබුණා ජනතා විමුක්ති පෙරමුණේ කතා

අහද්දි. නමුත් පසුගිය දා වුණ සිද්ධියෙන් 88/ 89 කාලේ නැවත ඇස් පනාපිට අපට පසක් කර දුන්න නිසා ඇති වූ හිරිකිත හා පිළිකුල මගේ ජීවිතෙන් මැරෙන තුරාවට යවන්න බැහැ. එක පුද්ගලයෙක් කියලා තියෙනවා. ජීවිතයේ තීරණ ගනිද්දී, ඉතා දුකින් ඉන්න වෙලාවකදිවත්, සතුටින් ඉන්න වෙලාවකදිවත් තීරණ ගන්න එපා කියලා. මම කලින් දේශපාලනයෙන් සමුගන්න මතයක හිටියත්, දැන් මම මගේ දේශපාලන ගමන අඛණ්ඩව ඉදිරියට ගෙන යන බව මතක් කරනවා. සභාපතිතුමා, මම නැවත ඔබතුමාට කියන්නේ, සභාවෙන් මිනිස්සුන්ට යමක් වෙන විදිහේ වැඩපිළිවෙළක් ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යන්න. මෙතනින් අපි බැහැර යන අවස්ථාවකදී වුවත්, ගෞරවාන්විත ලෙස ආඩම්බරයෙන් ගෙදර යා හැකි පරිදි වැඩපිළිවෙළක් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම දෙනාගෙන් අවසරයි. ප්‍රථමයෙන්ම අද නවක මන්ත්‍රීතුමියක් පත්වෙලා, ඔබතුමියට ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට හැකියාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම පසුගිය 09 වෙනිදා ඉතා කණගාටුදායක සිද්ධියක් සිද්ධ වුණා. ඒ පිළිබඳව නිරන්තරයෙන් සොයා බලපු මන්ත්‍රීවරුන්ට මම ස්තූතිවන්ත වෙනවා. සභාපතිතුමාට කියන්න ඕන. එම 9 වෙනිදා සිද්ධියෙන් මගේ නිවසට ප්‍රහාරයක් එල්ල කරලා, කඩලා බිඳලා දැම්මා. ඒ මගේ දේවල් නෙවෙයි. මගේ තාත්තාගේ දේවල්. මොකද දේශපාලනයෙන්වත් ඔය දේවල් හදන්න, මගේ රුපියලක්වත් වියදම් කරලා නැහැ. මමත් තවම ගෙදරින් යැපෙන කෙනෙක්. ඒකෙදි අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාට ඇත්තටම කණගාටුදායක තත්ත්වයක් තමයි තියෙන්නේ. පවුලක් නඩත්තු කරන පියෙක් වශයෙන්, නඩත්තු කරන්න දරුවන් තිදෙනෙක් ඉන්නවා. ඒ තත්ත්වය මත එතුමාට සිදු වෙච්ච දේ ඇත්තටම කණගාටුදායකයි. මට කියල ප්‍රහාරයක් එල්ල කලා ට, ඒ දේ කළේ මගේ පියාගේ නිවසට. මම ගෙදරින් යැපෙන නිසා ලක්රුවන් මන්ත්‍රීතුමාට තරම් මට ලොකු බරපතළ බවක් දැනෙන්නේ නැහැ. 09 වෙනිදා අපි අරලියගහ මන්දිරයට ගියා. ඒ ගියේ හදවතේ නායකයා වෙනුවෙන්. එතුමා අස්වෙනවා. අපි දැනගෙන හිටියා. එතුමට ගෞරවාන්විත සමුදීමකට ගියේ. එහෙම නැතුව කැරැල්ලකට සම්බන්ධ වෙන්න හිතාගෙන නෙවෙයි. ඒ වුණාට එතන යම් කිසි සිද්ධියක් වුණා. ඉන්පසු ගම් වල ඇතිවෙච්ච තත්ත්වය ඉතා කණගාටුදායකයි. මම හිතන්නේ නැහැ. මම ඒ රැස්වීමට ගිහිපු නිසා මගේ නිවසට ගැහුවා කියලා. මම ඒ දේවල් ඒ ආකාරයෙන් ම පිළිගන්නේ නැහැ. ගිය සභාව දවසේ බරපතළ විදියට ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයක් කරන්න ඇවිල්ලා, විනාඩි 10 ක් ගියේ නැහැ. තනි මට විරුද්ධව ඒ අය උද්ඝොෂණය කළේ. ඒක සිදුවුණේ FB දැම්ම නිසා කියලා ගයන්ති කුමාරි මන්ත්‍රීතුමිය, ඔබතුමිය කතාවක් කරලා තිබුණා. මම ඒක වාර්තාවෙන් දැක්කේ. එලියෙ ඉන්න අයට නරි කිව්ව එක වැරදියි. ඒ අය බඩගින්නට තමයි එළියට බැහැලා තියෙන්නේ කියලා. ඔබතුමියට කියන්න ඕන. සමාජ මාධ්‍ය ජාලය ගැන මගේ ලොකු අවබෝධයක් නැහැ. එදා මම එතන ඉන්න කට්ටියට කියලා ඒක දැම්මේ නැහැ. එදා එහෙම අවදානමක් තියෙනවා නම්, අද මගේ ගෙදරට ගහන්න ප්‍රචාරය කරපු පුද්ගලයන්ගේ විස්තර ඒ සියලු දේ දැනටත් මං ගාව තියෙනවා. මං දන්නේ නැහැ මොන මන්දමානසික මට්ටමින් සුළු පිරිසක් කටයුතු කළාද කියලා. සමහරු මගේ රෙදි ගලවන්න එෆ්බී එකේ කතා කරල තියෙනවා. ඒ මන්ද මානසික මට්ටම මට නම් තේරුම් ගන්න බැහැ. නරක වචන දාලා, ඕකිගේ ගේත් ගිනි තියන්න ඕනි කියලා දාලා තියෙනවා. මේ මගේ කොට්ඨාසයේ ජනතාව නෙවෙයි. ඒව බැලුවම මම ගැන, මගේ කොට්ඨාසයේ ජනතාවට වඩා පිට මිනිස්සු හිතුවේ. අපි අරලියගහ මන්දිරයට ගිහිල්ලා එද්දී, සුළු පිරිසක් අපිව දකින්න කැමති වුනේ විකෘති අන්දමින්. ඒ නිසා බොරු ප්‍රචාර යවලා, ගුටිකාලා, කොන්ඩෙ කපලා, ආව විදියට. මන්ද මානසික රෝගයක් වෙන්න ඕන. සාමාන්‍ය මනුස්සයෙකුට එහෙම හිතන්නවත් බැහැ. 2018 දි මම මගේ

කොට්ඨාශය දිනලා ආවට පස්සේ, ලොකු ගැටලුවක් තිබුණා. කට්ටිය කිව්වේ ඔය පොඩි කෙල්ලෙක් ගිහිල්ලා, සභාවට මොනවා කරන්නද කියලා. ඇත්තටම මම මොනවද කරන්න ඕන කියලා. මට අවබෝධයක් තිබුණේ නැහැ. මගේ පවුල් පසුබිමේ දේශපාලන කටයුතු වුනා. මම පොඩි කාලේ ඉඳලම දැක්කා. සමිති තියාගෙන ඒ කටයුතු කරන ආකාරය. ඊට අමතරව මම කටයුතු කරන්නේ කොහොමද කියලා දැනුමක් තිබුණෙ නැහැ. මගේ සහෝදර මන්ත්‍රී මණ්ඩලය මට උපදෙස් දෙමින්, ඒ වගේම විපක්ෂයේ සිටින සියළු මන්ත්‍රීවරුන් උපදෙස් දෙමින්, යම් තැනකදී දෙයක් වෙනවා නම්, දුරකථනයෙන් හෝ මුණගැහිලා හෝ මට උපදෙස් දුන්නා. මම ඒ පිළිබඳව ඇත්තටම ගෞරව කරනවා. ඔබතුමාලා වගේ දේශපාලනයෙන් පරිනත දේශපාලනය කරන මිනිස්සු කොටසක් නෙවෙයි සම්බන්ධ වුණේ. මේකට මගේ ජනතාව මට ඇවිල්ල ගැහුවෙත් නැහැ. පිටින් ගෙනල්ලා මට ගහන්න තරම් ගමේ සම්බන්ධතාවයක් තියෙන නිසා වෙන්න ඇති. මට ඇවිල්ලා ගහන්න ඇත්තේ. ඒ පිළිබඳව කණගාටුවකට වඩා ඇත්තටම ජීවිතයේ ලොකු අත්දැකීමක් ලැබුවා. ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රීතුමා සඳහන් කළා. මේ අරගලයට කිසිදු සාමාජිකයෙක් සම්බන්ධ වුණේ නැහැ කියලා. ඔබතුමා එහෙම කිව්වට, මුලින්ම හාරසියයක් අත්අඩංගුවට ගන්න කොට 150ක් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් හිටියේ. ඔබතුමා මෙතන කිව්වට අපට පාට පක්ෂ භේදයක් මේ අවස්ථාවේ බලන්නවත්, කතා කරන්නවත් බැහැ. මොකද වැරදි කළ පිරිසක් හඳුනගෙන තියෙනවා. ඒ පිරිසෙන් තමයි බලන්න වෙන්නේ. අන්තරේ කියලා පිරිසක් ගෝල්ෆේස් එකේ එකතුවෙලා, දැනටත් රට හදන්න කියලා ඉන්නවා. නමුත් එහි තේරුම ඒ පිරිස වත් තවම දන්නේ නැහැ. අන්තරේ කැඳවුම්කරු ගෙන්වල ඇහුවම, 225ම යන්න කිව්වට, ඊ ලඟට කරන්නේ මොකක්ද කියලා දන්නේ නැහැ. එහෙම පිරිසක් තමයි රට හදන්න කියලා පාරට බහින්නේ. මේ තියෙන රටේ අර්බුදවලට මිනිස්සු පාරට බහින එක සාධාරණයි. ගෝඨා ගෝ හෝම් කියන තැන මමත් ඉන්නවා. ඒ වුනාට ඔහු ගියාට පස්සේ කවුද මේ රට බාර ගෙන ඉදිරියට කරගෙන යන්නේ. ඒ කිසිදු තීරණයක් නැතුව තමයි මිනිස්සු පාරට බැහැලා කෑ ගහන්නේ. ඒ වගේම ජනාධිපති ලෙස එතුමා කෙලින් තීරණ නොගත් නිසා තමයි, මෙහෙම දෙයක් මේ තරම් දුරට සිද්ද වුනේ. පවුලක් නඩත්තු කරන ගෘහමූලිකයෙක් දන්නවා. මම එතනින් එහාට කරන්නේ මොකක්ද? එතකොට රට පාලනය කරන නායකයෙක්, පස්සේ මාධ්‍යට ඇවිල්ලා ඒක පිළිගන්න තරම් රටේ ඩොලර් හිඟ වෙනකම් නොදැන හිටියේ නැහැ. අවුරුදු දහයක් රට කරපු නායකයෝ වෙනුවෙන් අදටත් ගෞරවයක් තියෙන නිසා තමයි එදත් අපි ඒකට සහභාගි වුණේ. ඒ වගේම කලහකාරී සිද්ධිය වන විට, මගේ අම්මා, තාත්තා අවුරුදු අනුවක් වන මගේ ආච්චි මේ නිවසෙ හිටියා. ආච්චි කොහේටවත් අරගෙන යන්නවත් බැහැ. මොන ආකාරයෙන් පහරදීම් කලාද කියලා දන්නෙ නැහැ. මේ වගේ ඒකට හේතුව තමයි, කෙල්ලෙක් ගිහිල්ලා, මගේ කොට්ටාශයේ වැඩක් කෙරෙන එකක් නැහැ කියලා. දේශපාලනයෙන් තොරව මම හැම දෙනාටම ලබා දුන්නේ. ඒ වගේම මම මේ වන විට කොට්ඨාශය ඇතුළත මැටි ගෙවල් වල හිටපු නිවාස අහිමි පිරිසට ගෙවල් 12 ක් හදලා දුන්නා. එක දේශපාලනයෙන් තොරව හදලා දුන්නේ. මම හිතන්නේ එතන තමයි මට වැරදුනේ. මම දේශපාලනය බලන්නේ නැතුව මිනිස්සුන්ට උදව් කරන්න ගිය නිසා තමයි මට වැරදුනේ. මොකද මගේ පාක්ෂිකයන්ට පමණක් ඒ දේවල් කළා නම් ඔය රිදෙන පිරිසට රිදෙන්න හේතුවක් නැහැ. ඇත්තටම කණගාටු වෙනවා. මේ දේශපාලනය අත හරින්න මට හිතුණු තැන් තිබුණා. කතාවක් අහපු නැති මට, කතා හදනකොට රිදුනා. නමුත් සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මට ශක්තියක්ව හිටියා. ඒ නිසා මම දේශපාලන ගමන ඉස්සරහටත් කරගෙන යනවා. මොන කතාව කිව්වත්, මම වැටෙන්නෙ නැහැ. අදාළ නැහැ. මොකද මම කරපු දේවල් නොවෙන නිසා, දේශපාලන ගමන් මගක් නැති කුරිරු මිනිස්සුත් එක්ක වැඩ කරනකොට, අපි ඇත්තටම ඔය දේවල් වලට මුහුණ දෙන්න වෙලා තියෙනවා. දේශපාලනය කරන මිනිස්සු ගාව ඔය වගේ තරහ වෛරයක් තියෙන්න විදිහක් නැහැ. ඇත්තටම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ, දිස්ත්‍රික් නායක රමේෂ් පතිරණ මැතිතුමාගෙ, මොහාන් සිල්වා

මැතිතුමාගේ, නිවෙස් වලට වුන හානිය සම්බන්ධයෙන් ඇත්තටම මම කනගාටු වෙනවා. මම වැඩිපුර කතා කරන්නේ නැහැ. මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, දීර්ඝ වශයෙන් විශේෂ වූ කතා ටිකක් අහලා, දැන් හැමදෙනාටම අමාරු අවස්ථාවක බණ කියන්න ඕන, අහන්න පුළුවන් පරිසරයක ඉන්න වෙලාවක විතරයි. නමුත් කිව යුතු කාරණා කිහිපයක් තියෙනවා. පළමුකොටම නව මන්ත්‍රීතුමිය, කාලයක් එක්සත් ජාතික පක්ෂයේ හිටියා. සමගි ජන බලවේගයේ මහත්මයා හිටියේ. වර්තමානය වන විට එක්සත් ජාතික පොදුජන පෙරමුණේ ඉන්නවා. එතුමිය නවක මන්ත්‍රීවරියක් ලෙස ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. ඉගෙන ගන්න කාලයක් තිබේ ද කියලා මට කියන්න බැහැ. සමස්තයක් ලෙස ලක්රුවන් මන්ත්‍රිතුමා, සුභාෂි මන්ත්‍රීතුමිය, දිසානායක මන්ත්‍රිතුමාට සිදු වූ හානි, සමස්තයක් ලෙස මම හෙළා දකිනවා. අපේ රටේ ඒ සියලුම විනාශකාරී දේවල් අපි හෙළා දකිනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයා අග්‍රාමාත්‍යවරයා වුණා. රතිඤ්ඤා ටිකක් පත්තු කලා. මල්වෙඩි ටිකක් ගැහුවා. කිසි කෙනෙකුට උපදෙස් දුන්නේ නැහැ. ගල්කැටයක් විසි කරන්න එපා කියලා අපට සතුටුයි. අපි දන්නවා සන්තෝෂය භුක්තිවිඳින විදිහ. මොනව කිව්වත් රට ගොඩ දාන්න ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහතා විතරයි කියන එක ප්‍රකාශ කරනවා. නමුත් තමුන්නාන්සේලා විතරක් නෙවෙයි. අනෙක් අයත් වාහන අරගෙන අරලියගහ මන්දිරයට ගිහිල්ලා, ආදරණීය සමුගැනීමක් කරන්න තිබුණා. ආදරනීය සමුගැනීම මෙතන සිද්ධ වුණා නම්, මම හිතනවා එක ගල්කැටයක් විසි වෙන එකක් නැහැ කියලා. එය එසේ සිද්ධ වුණේ අපි මාධ්‍යවලින් දැක්කා. ප්‍රමාද වැඩියි. යමල්ල ගෝල්ෆේස් කියලා තියෙනවා. තමුන්නාන්සේලා 10 යන්න ඇත්තේ මිනිස්සුන්ට ගහන්න නෙවෙයි. එතනට ගහන්න පිරිසක් ආවා. බන්ධනාගාරයේ දෙසීයක් හිරකරුවෝ. ඔවුන් අහුවුණා. සාමකාමීව තිබුනු අරගලයට දේශපාලනය කඩාගෙන වැදුනා. අරලියගහ මන්දිරයෙ හිටපු පිරිස අතරෙ, සමහරු අතේ පොලු තිබුණා. එතැනට ගියේ අරගලයට. ඔබතුමාලගේ නායකයා, දැන් ඔබතුමාලා කුරා කූඹියෙකුටවත් හිරිහැර නොකර, දැන් ගෙවල් වලට යන්න කිව්වා නම්, මේ දේවල් මේ ආකාරයට සිද්ධ වෙන්න දෙන්නේ නැහැ. එතනින් තමයි ප්‍රශ්නය ඇති වුණේ. පළවෙනි මරණය ගෝල්පේස් එකේ කුමන පුද්ගලයින් ද කියන්න මට බැහැ. නමුත් මුළු ගමම කැළඹුනා. පෙරටුගාමී එකටත්, ජනතා විමුක්ති පෙරමුණටත්, ඕක තමයි අවශ්‍ය වෙලා තිබුණේ. අඬන්න හිටිය ඇහැට ඇඟිල්ලෙන් ඇන්නා වගේ. ඉතිහාසය ගත්තම මේ පක්ෂ දෙකේ බලය රැඳිලා තියෙන්නේ, සිල් සමාදන් වීමෙන් නෙවෙයි. ලේ සෙලවීමෙන් කියන එක. ඉතිහාසය මතක් කර දෙන්නේ. මෙතනින් පටන් ගත්ත දේ ගමට ඇවිල්ලා තියෙන්නෙ. ගෙවල් ගිණි තියන එකට මම කවදාවත් එකඟ නැහැ. අලුත් ගෙයක් හදලා පදිංචි වන සතුට අපි දන්නවා. හැබැයි මේක එසේ මෙසේ ගිනි තිවීමක් නෙවෙයි. සැලසුම් සහගත ගිණි තැබීමක්. බලන්න තත්පර ගාණක් යනකොට මුළු ලංකාවම ගිනි අරගෙන ඉවරයි. තත්පරෙන් තත්පරේ පෙන්වනවා. මේ ගිනි තියලා කියලා. සැලසුම් සහගතව. ඉතින් කවුරු මොනව කිව්වත්, මම දන්නෙ නැහැ. දිග්ගස්සන්න යන්නේ නැහැ. අරලියගහ මන්දිරයේ එදා රැස්වීම කරලා, සාමකාමීව එන්න තිබුණා. නමුත් ඔබ කොටු වෙලා හිටියෙ. පවතින ආණ්ඩුවට ඇඟිල්ල දික් කරන්න ඕන. ඇතිවෙච්ච ව්‍යසනය පිළිබඳව අපේ බලවත් කණගාටුව මම මේ සභාවේ ප්‍රකාශ කරනවා. ගෝල්ෆේස් එකේ සමහරු කතා කරනවා. 225ම ගෙදර යවන්න. ජනාධිපති ගෙදර යවන්න. සමහර වෙලාවට මම හිතන්නේ මරණාධාර සමිතියකටවත් එහෙම යන්න බැහැ. ව්‍යවස්ථාවක් තියෙනවා ඒකට. ඒ අනුව කටයුතු කරන්නේ. මේ හැමෝම ගෙදර ගියොත්, මේක කාටද බාර දෙන්නේ? ගෝල්ෆේස් එකේ සහෝදරයින්ගෙන් ඇහුවා මේකට විකල්පයක් කියන්න කියලා. මේකට විකල්පයක් නැහැ. 225 එක දවසට ගෙදර යන්න බැහැ. ජනාධිපතිට ගෙදර යන්න සැළැස්මක් තියෙනවා. අගමැතිට සැළැස්මක් තියෙනවා. ඒ අනුව තමයි මේ කටයුතු කරන්න වෙන්නේ. මේක නිකම්ම පත්තු නේ

නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයාට කිව්වා. එයාගෙ කයිය විතරයි. එයා බාරගත්තේ නැහැ. රටම ප්‍රතික්ෂේප කරලා, දෙලක්ෂ හැට නම ලක්ෂ තිබිලා අප කිහිප දෙනෙකුට නායකත්වය දීපු රනිල් වික්‍රමසිංහගේ වටිනාකම දැනගත්තා. රනිල් මහත්තයා ලෝකෙ ධනේශ්වර රටවල් ආධාර ලබාදෙන බලාපොරොත්තුවෙන් ඉන්නවා. ජී 7 සමුළුව සාකච්ඡා කරලා, ආධාර ගලාගෙන එන්න පටන් ගත්තා. පොහොර ටික එනවා. තෙල් ටික එනවා. බෙහෙත් එනවා. මේක එකපාරටම කරන්න බැහැ. ක්‍රමානුකූලව කරගෙන යන විට, යන්තරේ නොහොත් මන්තරේ එළියට බහිනවා. එපාර කියනවා ගෝඨත් එල, රනිලුත් එල. ඔයි සේරම එල කියලා. විශ්ව විද්‍යාලයේ ඉන්න අන්තරේට පුළුවන්ද, මේ රට පාලනය කරන්න. බුද්ධිමත් තරුණයන්ටත්, පුංචිකාල සීමාවක් දෙන්න ඕන. ඔවුන්ට මාස තුනක් දෙනවා වැඩ පෙන්නන්න. එහෙමත් නෑ. මාධ්‍යයෙන් පෙන්නන්නෙත් බෙහෙත් පෝලිමට පාර හරස් කරලා, වියරු වැටිච්ච ජනතාව මාධ්‍යයට කියන්න ආසයි. කොල්ලො කෙල්ලොත් එක්ක එකතු වෙනවා. අපේ රාමුව දෙන්න පුළුවන් කියලා. මාධ්‍ය තුළින් රට නිවෙන්නේ නැහැ. කොයි වෙලෙත් ටීවී එක බැලුවත් මනස විකෘති කරන ප්‍රවෘත්ති තමයි පෙන්නන්නෙ. මිනිස්සු ගෙවල් වල බඩගින්නේ ඉන්නේ. මාසේ පඩිය රාජ්‍ය සේවකයාට මදි. රටේ කම්කරුවට පඩි මදි. එහෙම ගිනි ඇවිස්සිලා ඉන්න කොට, දරුවා හඬනවා අම්මගෙ කිරි ටික නැහැ දෙන්න. කුසගින්න වැඩිවෙනකොට පෙරටුගාමී වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්, කන්න බොනකොට දෙනකොට නිර්පාක්ෂික සමග එකතු වෙන්න පටන් ගත්තා. මෙතනින් තමයි රැල්ල හැදුනේ. ඕක තමයි සත්‍ය කතාව. මේ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහතා 2002 රට වැටිච්ච වෙලාවේ, ගොඩගන්න අවුරුදු දෙකක් යන විට, ජනතා විමුක්ති පෙරමුණට බලාගෙන ඉන්න බැරි වුණා. රනිල් මේ ගමන හොඳට යනවා කියලා. මෙන්න චන්ද්‍රිකා මැතිනියත් එක්ක එකතුවෙලා ආසන 28ක් අරගෙන, ඇමැතිකම් අරගෙන, මේ රටට කරපු දෙයක් නැහැ. 89 කාලේ අපි නිදා ගත්තෙ නැහැ. මහා සභා රැස්කරලා, නාගොඩ, යටලමත්ත සමූපකාර මහා සභා සමිතියට පත් කරන්න මට ලිපියක් ආවා. මම ගමේ කාරක සභාව රැස් කළා. මුළු ප්‍රදේශයේම ඕඅයිසී විජේසිංහ මහත්මයා අද ජීවතුන් අතර නැහැ. මට ලිපියක් එනවා. උඹ මැතිවරණයට තරග කරන්න එපා. නුඹට මරණය කියලා. මේ සත්‍ය කතා මම කියන්නේ. මම නිදාගත්තෙ, පිටිපස්සෙ දොරෙන් ඉක්මනින් ඉවත් වෙන්න පුළුවන් විදිහට පොල්ලක් හරස් කරල තියෙන්නෙ. මොකද මරණ බිය නිසා. නිදා ගන්නකොට රෑ 12.15 ට විතර බයිසිකලයක් මම සොයාගෙන මගේ ගෙදරට එනවා. පිටිපස්සේ දොර ඇරගෙන මම පැන්නා. සොහොනක් තිබුනා. දවස් හතයි වෙන්නේ. මම සොහොන උඩ හිටියේ. බයිසිකලේ තුන් වටයක් ගහලා, ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයෝ එදා යන්න ගියා. සමූපකාර සමිතියේ මහා සභා රැස්වීමට මම ඡන්දය ඉල්ලුවා. මම බය වුනේ නැහැ. එදා ලැබිච්ච ශක්තිය තමයි අද දක්වා අවුරුදු ගාණක් තවම තියෙන්නේ. එදා මාව සභාපති කළේ. වෙන කවුරුවත් නෙවෙයි ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරු. මම නිහැඩියාවෙන් හිටිය නම් යන්නේ නැහැ. මට මොරාල් එකක් දුන්නා. ඒ පිළිබඳව මම තමුන්නාන්සේලාට මතක් කරනවා.

ඊළඟට මම මතක් කරන්නේ, කලබල නැතිව ඉන්න. රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවෙන් මාසයක් දෙකක් යනවිට කුසගින්න නිවේවී. බඩගින්නට යමක් ලැබේවි. හදිසියේ මේ දේ කරන්න බැහැ. පොඩ්ඩක් ඉවසන්න කියන එක මතක් කරනවා.

ඒවගේම බලන්න අද සභාවේ අවශ්‍ය දේවල් කතා වුණේ නැහැ. සභාවෙන් කුරුඳු පැල වගාවක් කරනවා කියලා, සුද්ද කලා. අන්න වල් පැළෑටි වැවිලා තියෙනවා. ඒ මුදල් කාබාසිනියාවක්. මම විශේෂයෙන්ම ඒකයි මතක් කරන්නේ. මෙම මුදලක් යට කරන්න ඉස්සෙල්ලා මේකට තිබුන උද්යෝගය අද නැහැ. ඉක්මනට පියවරක් ගන්න, නැත්නම් ඒ සල්ලි අපරාදයක් වේවි. ඒ වගේම තමුන්නාන්සේලා දන්නැති වුනාට, 2018 තමුන්නාන්සේලා ආණ්ඩුව පිහිටෙව්වෙ. 2017 විතර ඌරල නැහිණිගල පාර තාර දාලා හැදුවා. මෙන්න කාපට් කරන්න කියලා, j.c.b. එකක් දාලා පාර උලුප්පලා දාලා ගිහිල්ලා. මම ඒ අවස්ථාවේදී සතුටු වුණා. කාපට් කරනවා නම් හොඳයි කියලා.

කොටසක් කරලා ඉතුරු ටික අවසන් වුණේ නැහැ. ජාතික අපරාධයක්. පාරට මොනම හානියක්වත් වෙලා තිබුනෙ නැහැ. කලේ සැලැස්මක් නැති වැඩ. ඒ වගේ වැඩ වලට තමුන්නාන්සේලා මීට පස්සෙ අත ගහන්න යන්න එපා. මේ වැඩ පටන්ගන්නකොට කොච්චර උනන්දුවක් තිබුණ ද? ආදාහනාගාරය, වෙළෙඳ සංකීර්ණයට කොච්චර උනන්දුවක් තිබුණ ද? ඒ වැඩ දෙකම දැන් අතරමග නතර වෙලා. එදා රනිල් වික්‍රමසිංහ මහතා ඒ ආණ්ඩුවට උපදෙස් දුන්නා. එය පිළිගත්තේ නැති නිසා තමයි, මේ දේවල් වුනේ. තමුන්නාන්සෙගෙ මේ සේරම මන්ත්‍රීවරු ඒ සම්බන්ධව කතා කළා. අපි මීට පෙර අවුරුදු හතරකට ඉස්සෙල්ල කිව්වා. එදා ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයින් කිව්වා. අවුරුදු හතරකට ඉස්සෙල්ල කතා කරපු දේ, අද තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ම කියනවා. වැරදියි කියලා. මම ඒව කතා කරන්නේ නැහැ. දැන් වැඩකුත් නැහැ. ඒ පිළිබඳව මතක් කරමින්, තමුන්නාන්සේලා අපි සේරම බෞද්ධයෝ. ගෝඨාභය රාජපක්ෂ මහතා ඡන්ද හැට නම ලක්ෂයක් අරගෙන දිනලා, රුවන්වැලිසෑය ඉදිරිපිටට යනවා. එදා ගිහිල්ලා රුවන්වැලි මහා සෑය ඉදිරිපිට දිවුරුම් දෙනවා. එවකට අගමැති රනිල් මැතිතුමා. ස්වදේශ කටයුතු වජිර අබේවර්ධන මැතිතුමා ඇතුළු පිරිස ලංකා ඉතිහාසයේ කවදාවත් රුවන්වැලිසෑය බුදුන්ගේ ගුණ වර්ණනා කරලා, දෙවියන්ගෙන් සාමය ඉල්ලනවා. සතුට ඉල්ලනවා. අපේ බලාපොරොත්තුවක් ඉෂ්ඨ වෙන්න කියලා. සාදු හඬ වෙනුවට හූ හඬක් ආවෙ. රනිල්ට හූ කිව්වා. වජිරට හූ කිව්වා. එදා සිද්ධ වුණු දේ ඒක රුවන්වැලිසෑය ගාවදි තමයි හූ කිව්වේ. ගෞරවනීය පිළිගැනීමකට එතුමා ගිය වෙලාවේ, ඔය හැට නම ලක්ෂය හූ කියලා පිළිගත්තෙ. ඒ හඬ තමයි රටේ අගමැති ආපහු රුවන්වැලිසෑය ගාවට ගෙන්වනවා. ස්වභාව ධර්මය දිට්ඨධම්මවේදනීය කර්මය පල දෙන්නේ කියලා. එලවපු රනිල් වික්‍රමසිංහට ආරාධනා කරනවා. අපිව බේරලා දෙන්න. රට භාරගන්න කියලා. ඊළඟ නාඩගම තමයි කැලණි ගිහිල්ලා, කරඬුවත් වඩම්මලා, හාමුදුරු කෙනෙක් පොහොට්ටු දෙනවා ධාතු වඩින්න යන්න කියලා. නාගයෙක් සම්බන්ධ කරගෙන, මුළු රටටම, මුළු ජාතියටම කරපු අපහාසය කැලණි විහාරයේදී සිද්ධ වෙනවා. මෙන්න සාපය. වෙනත් කතා කරන්න දෙයක් නෑ. මෙම වෙන දේවල් කතා කරන්නේ නැහැ. රාජපක්ෂවරුන්ට වුණ ඒ සාපය ඔවුන්ට විඳින්න සිද්ධ වුණා. ලංකාව ගොඩදාගන්න, රටවැසියා ගොඩදාන්න අවශ්‍ය චරිතය තමයි රනිල් වික්‍රමසිංහ. ඒක නිසාම අපි වැටිච්ච රට නඟා සිටුවන්න දේශපාලන පක්ෂ, පාට නෙවෙයි දැන් බැලිය යුත්තේ. කුසගින්න අපේ ආර්ථිකය ගොඩ දාන්න පුළුවන් නම්, වෙන දෙයක් අපිට ඕන නැහැ. මේ රටේ තරුණ කැරලි ගහන අයට මම කියන්නේ, පොඩ්ඩක් ඉවසන්න. ඒ ඉවසීම තුළ සතුට ලැබේවි. වැඩක් කරන්න ඉඩ දෙන්න කියලා තමයි ඉල්ලා සිටින්නේ. මගේ දේශපාලනයේදී මට අනවශ්‍ය ලෙස කාටවත් කඬේ යන්නේ නැහැ. මම සත්‍ය කතා කරන්නේ. ඒක මගේ පුරුද්දක්. මට ප්‍රශ්නයක් නැහැ. අපි ඒ ගමන යමු තමුන්නාන්සේලාගේ වේදනාව මම දන්නවා. රටේ සාමයත්, රටේ සමගියත්, සෞභාග්‍යය ඇතිවේවායි ක්‍රියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද දවසේ අපේ සභාවට අලුතින් පැමිණි ප්‍රියංගිකා දිල්රුක්ෂි මන්ත්‍රීතුමියට සුබ පතනවා. ඔබතුමිය මෙතනට එන්න තිබුණේ ගිය මාසේ. එහෙමනම් ඔබතුමියගේ මහත්තයාත් මෙතන හිටියේ අරගලයේ. රටේ එහෙම තියෙන්න ඕන. ඕනම කෙනෙකුට යමක් ප්‍රකාශ කරන්න අයිතියක් තියෙන්න ඕන. ඒවට විරුද්ධ වෙන්න කාටත් අයිතියක් නැහැ. මීට පෙර ඉතිහාසයට ගියොත්, ජයවීර මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවද දන්නේ නැහැ. 1994 වර්ෂයේ ආවෙ එක මන්ත්‍රීවරයයි. නිහාල් ගලප්පත්ති මහත්තයා. එතුමා ආවෙත් මල් පෝච්චියෙන් ඡන්දය ඉල්ලලා, ඒ වෙලාවේ ගහලා එළවපු ජනතා විමුක්ති පෙරමුණේ අය තමයි මහින්ද මහත්තයා කරේ තියාගෙන යන්නේ. නැවත සැරයක් මේ දේශපාලන පක්ෂ වල ක්‍රියාකාරිත්වය තමන්ට සිදුවුන වාසිය මත තමයි ලියවිලා යන්නෙ. හැබැයි එසේ කරන විට සිතන්න. අපි කවුරු වෙනුවෙන්ද පෙනී ඉන්නේ? කඬේ යන්නේ කියලා. මේ පක්ෂ

නායකයෙක්ගෙන් මට කරන්නේ මොනවද? එය පොඩ්ඩක් කියවගත්තොත් අපට තේරෙයි. අපි ඉන්න තැන කොතැනද කියලා. ජයවීර මන්ත්‍රීතුමනි, ඔබේ නායකයොත් මේ සමාජය නොමඟ යවනවා. එක්සත් ජාතික පක්ෂය තමයි මේ සමාජය නොමඟ යැව්වෙ කියලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි මේ සමාජය නොමඟ යැව්වේ කියලා, නැහැ. මේ දැන් වුනත් කට්ටිය මේ සමාජය නොමග යවමින්, ඔවුන් ගේ වැඩ ටික කරගන්නවා. අපට කියනවා එපා කියලා. ඔය ඩීල් කියන ඒවා හැම පක්ෂයකම තිබුණා. මහින්ද මහත්තයට වැඩකරන ඩීල් එකක් තිබ්බෙ නැද්ද? තිබ්බා. ජනතා විමුක්ති පෙරමුණේ ඩීල් එකක් තිබ්බා. රටට ආදරේටද? නෑ. පක්ෂයේ පැවැත්මට. ඔය සුනාමි පාලන මණ්ඩලය අයින් වුණා. ඒ දේශපාලන ඩීල් අපි කියවන්නෙ. එෆ්බී තිබුණට, පත්තරේ ගියාට, අපි කැමති අයගේ දේවල් පමණයි අපි කියවන්නෙ. අපි අකැමැති නම් කියවන්නෙ නැහැ. මම මීට කලිනුත් කිව්වා. මේ දේශපාලනය කියවගන්න කියලා. අපේ නායකයා වෙනුවෙන් අපි කතා කරනවා. ඔබේ නායකයා හරිද කියලා ඔබ කියවගන්න. අද ඔබේ නායකයො හරි නෑ කියල ඔබලා පිළිගන්නවා. ගෝඨාභය මහත්තයා අසාර්ථක නායකයෙක් කියලා කිව්වා. හරියට හරි. එයා බේරේ වැවේ තමන්ගේ පාක්ෂිකයෙක් පැය 10, 12 වැටිලා ඉන්නකොට බේරගන්න බැරි වුණා. හැමෝම හිතුවා, පාරේ ගල් ටිකක් අල්ලලා, මල් වවලා, ඉන්ටර්ලොක් එකක් කරහම, ලොකු වැඩ්ඩෙක් කියලා. රට බින්දුවට දැම්මා. අද උදේ FB එකෙන් දැක්කා. ඉන්දියාවේ ටින්කිරි එකක් බීලා, පඩුරු දානවා කැටයකට. ලංකාවට එවන්න කියලා. ලැජ්ජයි. අපේ දරුවෙක් ඉන්දියාවේ ඉගෙන ගන්නවනම්, ඒ දරුවෝ ගැන කල්පනා කරලා බලන්න. මේ තත්වෙට පත් කළේ ඔය කියන බැසිල් රාජපක්ෂ ඇවිල්ලා. අපි දැනගත්තා. එයා එහෙම කරයි කියලා. ආසියාවේ සිටින මුදල් ඇමතිලාගේ විස්තර බලන්න. මොන මුදල් ඇමතිටද උපාධියක් නැත්තෙ කියලා. භූතානයේ මුදල් ඇමතිට විතරයි. අපේ මුදල් ඇමති සුදුසුකම්වලට පාසල් දෙකක නම් දාලා තිබුණා. මේ වගේ කෙනෙකුට පුලුවන්ද ආර ථිකය කළමනාකරණය කරන්න? එහෙම කරලා, අද මේ රට හිඟන්නන්ගේ ආධාර උපකාර ගන්න තත්ත්වයට බිමට දැම්මා. හොරකන් කරන්න ඇති අපි ඒ පක්ෂ වල වැඩ කරන්න ඇති. එයාලා වෙනුවෙන් කඩේ යන්න ඇති. නමුත් ඒ නායකයෝ රට වලපල්ලට දැම්මා. සමන් මන්ත්‍රීතුමා, වෙරංග මන්ත්‍රීතුමා, ඔබ දෙපළම කිව්වා. අජිත් එඩේර ආරච්චි මහතා තමයි අපි දේශපාලනයට ගෙනාවෙ කියලා. හැබැයි මීට අවුරුදු තුනකට එහා ඔබ කල්පනා කරන්න. අජිත් එඩේරආරච්චි මහතාට සලකපු විදිහ. බලය ලැබුනම මිනිස්සු වෙනස් වෙනවා. නිකන් ඉන්න කොට දේශපාලඥයන් ගැන කියවන්න. එයාගේ තාත්තා, සීයා මේ රටේ මොනවද කළේ කියලා කියවන්න. මේ සියලුම මන්ත්‍රීවරු කල්පනා කරන්නේ, ඊළඟ මැතිවරණයේ දී අපි කොහොමද දිනන්නෙ කියලා. දැන් පියල් මන්ත්‍රීතුමා කිව්වා. අපි මහින්ද නිසා මෙතැනට ආවා කියලා. එහෙම වෙන්න එපා. මන්ත්‍රීතුමා ඔබටත් ආත්ම ගරුත්වයක් තියෙන්න ඕන. ඔයා මළ ගෙදරට ගියේ මහින්ද නිසාද? එහෙම වෙන්න ඇති. නමුත් ඒ තත්ත්වයට පත් වෙන්න එපා. සමෘද්ධි කාඩ් එකක් හදලා දෙන්න ඇති. ඔබතුමා හොඳ සමාජ සේවකයෙක්. රනිල් හැදුවේ අපි, ගම් වල මිනිස්සු. මහින්ද හැදුවෙත් මේ මිනිස්සු. එයාලා නිසා ඔයාලා හැදුනා කියන්න එපා. හැබැයි මහින්ද හිතුවේ ඔබතුමාලා හැදුවේ එයාලා කියලා. ඒකයි මේ තත්වයට රට පත් වෙලා තියෙන්නේ. මේ රට ගන්න තිබ්බේ අනුර කුමාර. මාස තුනෙන් මේ රට ඉවරයි. ආර්ථිකයත් එක්ක තමයි දේශපාලන ජීවිතය ගැට ගැහිලා තියෙන්නේ. මේ ඔක්කොම ගියත් වනමල් මන්ත්‍රීතුමා ඉතුරු වෙයි කිව්වා. මන්ත්‍රීවරුනි, මේ රටේ දේශපාලන පුරෝකතන දෙන්න එපා. ඒක වෙනස්වන සුළු දෙයක්. මාධ්‍ය හදන දේවල් ආර්ථික ප්‍රශ්න එක්ක වෙනස් වෙනවා. හැබැයි ඔබ හඳුනා ගන්න ඕන. මේ සමාජයේ හෙට සුභාෂි මන්ත්‍රීතුමියගේ නිවසට සම්පත් ඇවිත් ගියොත් ආපහු හූ කියයි. ඒ තරම් නායකයින් පිරිහිලා. වෙනදා නායකයෙක් ගෙදරට ආවම, පොලිසියත් එක්ක ගමේ මිනිස්සු ඒ ගෙදරට සලකනවා. රාජ්‍ය සේවකයන්ට සලකනවා. මතක තියාගන්න. ඔබ සියලු දෙනාටම නායකත්ව ලක්ෂණ තියෙනවා. ඒ නිසයි මෙතන නියෝජනය කරල තියෙන්නෙ. ඒ නිසා කඩේ යන එකේ සීමාවක් තියාගන්න. නායකයො වැරදි නම්, වැරදියි කියන්න ඕන. කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රශ්න වලට

නම් පාරට බැස්ස නම්, අර ගෙවල් ගිනි තියෙනවද? අද ගිනි තියපු අය අල්ලනවා. නමුත් එතනට ගේන්න කටයුතු කලේ කවුද? ඒවා කළේ මහින්ද? ඔබට මළ ගෙදරකට යන්න බැරිවෙන්න, පාරේ බැහැලා යන්න බැරි වෙන්න වැඩ කළේ ඔබේ නායකයෝ. මහ බැංකුව කැඩුවම අපට කොහෙවත් යන්න බැරි වුණා. හොරු කිව්වා. මේ සභාපතිතුමා හිතුවෙත්, පොහොට්ටුවේ 15 හිටිය ම අපට ඇති කියලා. අනිත් මන්ත්‍රීවරුන්ට වීදි ලාම්පු වත් දාලා දුන්නද? තව මාස දෙක තුනකින් සභාපතිකම ඉවර වෙයි. එවිට නිකම්ම නිමල් නාගොඩවිතාන වෙයි. මේ වැරැදි නිවැරැදි කරගන්න ඔබට කල් තිබුණා. අද මේ මන්ත්‍රීවරු කීදෙනෙක් ඔබට විරුද්ධ ව කතා කළාද? ඔබේම අයගෙන් ඔබට විවේචනයක් තිබ්බා. මොකද එහෙම වුනේ? ඇයි ඕනම දෙයක් නිවැරදිතාවයක් තියෙන්න ඕන. මේ ලංකාවේ කොන්ද පණ තිබෙන එකම මිනිහා රනිල් මහත්තයා. මොකද මේ වෙලාවේ රට භාරගන්න කිසි කෙනෙක් ඉදිරිපත් වුණේ නැහැ. නමුත් මාස හයකට කලින් ඉඳලා මෙතුමාගේ විෂන් එකක් තිබුණා. මොකක්ද කරන්න තියෙන එක සම්බන්ධව. මීට අවුරුදු 2කට කලින් රනිල් යම් යම් යෝජනා ගෝඨාභයට කලා. ඒත් පිළිගත්තෙ නැහැ. එක්සත් ජාතික පක්ෂය, මහින්දත් එක්ක ඩීල් කියලා සමගි ජන බලවේගය කියනවා. එහෙම වුනානම් තුන් වරකට වැඩිය ජනාධිපති ඉල්ලන්න බෑ කියලා වගන්තියක් දැම්මා. ජනාධිපති කම නැති වුනා. ආපහු ද්විත්ව පුරවැසියන්ට ඡන්දය ඉල්ලන්න බැහැ කියලා වගන්තියක් දැම්මා. බැසිල්ට එන්න බැරි වුණා. රනිල් හරියට ඒ දේවල් කලා. බැසිල් රාජපක්ෂ මහතාට විරුද්ධව නඩු දාහතක් තියෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව නඩු 25 තියෙනවා. නමුත් රනිල් වික්‍රමසිංහ මහතා පලිගත්තෙ නැහැ. මහින්ද මහත්තයා පලිගත්තා.

ඒ වගේම අද දවසේ අපි අපේ අගමැතිතුමාට සුබ පතනවා. කවුරු මොනවා කිව්වත්, 1994 බලය ගත්තේ. එදා ඉඳලා මිනිස්සුන්ගෙ අවලාද අහලා, පක්ෂය ආරක්ෂා කරන්න හිටියා. අපි යමක් ඉල්ලුවට දුන්නේ නැහැ. මොනව හරි බලපෑමක් ඇති ඒකයි නොලැබුනෙ. නමුත් කැරකිලා එයාගේ පිටටම ආවා. ඔබ සැම කියනවා මේ රට ගොඩගන්න පුළුවන්, යමක් කරන්න පුළුවන් ඔහුට විතරයි කියලා. එකවර මේ දේවල් වෙනස් වෙන්නේ නැහැ. අපිට පුළුවන් විදියට අපි වෙනස් වෙමු. රට වෙනස් කරන්න යනවට වඩා හොඳයි තමන්ගේ ගෙදරින් මේ වෙනස ඇති කරළා, ඔබට පුළුවන් දායකත්වය මේ රටට දෙන්න. ඒ වගේම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ ගෙදරට ගියා. ඒ දේවල් දැක්කම පුදුම කලකිරීමක්, වේදනාවක් ඇතිවුණා. ඒවා සිදු කළ පුද්ගලයන් සමග කතා කරන්න පවා අප්පිරියයි. ලක්රුවන් මන්ත්‍රීතුමාගේ දේශපාලනයේ ඇතැම් දේවල් වලට මම එකඟ නැහැ. නමුත් කෙනෙකුට දේශපාලන අයිතියක් තියෙන්න ඕන. ඒ සම්බන්ධව දැඩි අප්‍රසාදය පළ කර සිටිනවා. සුභාෂි මන්ත්‍රීතුමියටත් එහෙමයි. ආරංචි අනුව නාගොඩ අයට වඩා වෙන පිටින් ආපු කොට්ඨාසයක් කියලා තමයි කියන්නෙ. කොච්චර වුවත් අපේ ගෙවල්වලටත් ගැහුවා. මේකේ හිටපු සභාපතිවරුන් ඒ දුක වේදනාව අපි දන්නවා. ගාල්ල දිස්ත්‍රික්කයේ ඔබ වගේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නොසැලකු කිසිදු සභාපතිවරයෙක් නැතිව ඇති. ඇත්තටම ඔබ ගැන අප්‍රසාදය පළ කරනවා වගේම, ඉදිරියේ දී මට නොලැබුනත් මේ අපේ පාක්ෂිකයන් හතර දෙනාට හරි වීදි පහනක්වත් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ලේකම්තුමිය හා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි. මම මුලින්ම අද සභාවට නවක මන්ත්‍රීවරියක් ලෙස පත්ව සිටින, මගේ සහෘද මිත්‍රයාගේ නෝනා මහත්මියට සුබ පතනවා. හැබැයි ඔබතුමිය පැමිණියේ අවසන් සභා කාලයක. මම හිතනවා. ඔබතුමියට මාසයක් දෙකක් හරි අපිත් එක්ක ඉන්න පුළුවන් වෙයි කියලා. ඉදිරියේදී ඒ කටයුතු කරන්න අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපි සිහිපත් කරන්න

ඕන. අපට සතුටුදායකයි. එක්සත් ජාතික පක්ෂ නායක අපේ පැරණි පක්ෂ නායකතුමා වත්මන් අගමැති ලෙස දිවුරුම් දුන්නා. මේ රට වැටිච්ච ආගාධයෙන් ගොඩ ගැනීම සඳහා ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා පෞද්ගලිකව මගේ සුබපැතුම් මේ අවස්ථාවේ පුදකර සිටිනවා.

ඒ වගේම සඳහන් කරන්න ඕන. පහුගිය 09 වෙනිදා ඇතිවූ මේ අරගල භූමියට පහරදීමත් එක්ක, අපේ සභාවේ ලක්රුවන් මන්ත්‍රිතුමාටත්, සුභාෂි මන්ත්‍රීතුමියටත්, ඒ වගේම අපේ උනන්විටිය එම්.එම්. දිසානායක මන්ත්‍රීතුමාගේ නිවෙසටත් සිදු වූ හානිය පිළිබඳව, අපි දැඩි සේ කනගාටුවට පත් වෙනවා. දේශපාලන මතිමතාන්තර මොනවා තිබුනත්, අපි එකා මෙන් මේ සභාවේ කටයුතු කළේ. අපි ඒවා අනුමත කරන්නේ නැහැ. කොයි කවුරු කළත් ඒව විනාශකාරී ක්‍රියා. ඒවට අපි සම්බන්ධ වෙන්නෙත් නැහැ. අපි උද්ඝෝෂණයකට ගියා විතරයි. හැබැයි ඕවා පුරුදු කළේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන්. ගහන, පොඩි කරන, පෙළපාලි, අපි ඒවා අනුමත කරන්නේ නැහැ. ඒ අය බලයේ රැඳී සිටීමට පාවිච්චි කරපු යම් යම් ආයුධ.

සභාපතිතුමනි, වත්මන් ආණ්ඩුව දිවුරුම් දීම පිළිබඳව, දීර්ඝව අපේ විපක්ෂ නායකතුමා කතා කළා. මේ රටේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව ගෝඨාභය මහත්තයා දිවුරුම් දුන් දවසෙ ඉඳලම කතා කලා. මම කිව්වා එතුමා මේ රටට ගේන්නේ සෞභාග්‍යය දැක්ම නෙවෙයි. අභාග්‍යය දැක්ම කියලා. අද එක ඔබතුමාලට සක්සුදක්සේ පැහැදිලි වෙලා තියෙනවා. එයා දක්ෂ පාලකයෙක් නොවන බව අපි එදා දැක්කා. ඒ වගේම ගිය සභාවේදි මම කිව්වා. පොහොට්ටුවේ ගෙරිහැම දාගෙන ඉන්නෙ නැතුව, දැන්වත් ජනමතයට කන්දීලා වැඩ කරන්න කියලා. නැත්නම් ඔබතුමාටත් නරක ප්‍රතිවිපාක වලට මුහුණ දෙන්න සිද්ධ වෙයි කියලා. මගේ දේශපාලන ගමන තුළ මම ලබපු අත්දැකීම් එක්ක තමයි එහෙම කිව්වේ. මොකද මේ පාලකයෝ රට පාලනය කළේ ඔවුන්ට ඕන විදිහට. ජනතාවගේ මතයෙ සිට නෙවෙයි. ඒක තමයි අපේ විපක්ෂ නායකතුමා, ආණ්ඩු පක්ෂය සමග එකට ඉඳලත් දොස් කිව්වේ. හැබැයි විපක්ෂනායක තුමනි, මේ රාජපක්ෂලා විශ්වාස කරන්න එපා. ඔබතුමා හොඳට හිතේ තියාගන්න. මම තව දෙයක් කියනවා. මේ රාජපක්ෂලා කවදාවත් බලය අතහැරලා යන්නේ නැහැ. ඒක තමයි අපේ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට ජනාධිපති ආරාධනා කළා. අගමැතිකම භාරගන්න කියලා. නමුත් බැහැ කිවුවා. ආණ්ඩුවේ පොහොට්ටුවට 2/3 බලයක් තියෙනවා. මේකේ ස්ථාවර පැවැත්මක් නැහැ කියලා. නමුත් පස්සේ සියලු දෙනා සමඟ සාකච්ඡා කරලා මේ දේට කැමතියි කිව්වා. නමුත් බොරු කියලා අපට ජනතාව මුලා කරන්න බැහැ. මොකද රාජපක්ෂලා අපට විශ්වාස නැහැ. නමුත් මම එකක් කියනවා. තව නොබෝ කලකින් අගමැති හරහා මේ ගෝඨාභය රාජපක්ෂ නැවතත් මහින්දව අගමැති හැටියට පත් කරනවා. පාර්ලිමේන්තුවේ බලය තියෙනවා. මේකට වර්තමාන අගමැති අහුවුණා. මොකද එක මන්ත්‍රීවරයෙක් විදිහට ඉඳගෙන, අනෙක් සියලු දෙනාම පොහොට්ටුවේ. පොහොට්ටුවේ අය එයාලත් එක්ක තමයි මේ ආණ්ඩුව කරන්න ඕන. මේ රට මේ තියෙන අගාධයෙන් බැලන්ස් කරගන්න තමයි ඔවුන්ගේ අදහස. ඒක කරගන්න තමයි රනිල් වික්‍රමසිංහ මහත්තයා ආණ්ඩුවට ගෙනාවෙ. නැත්නම් කවුද සභාපතිතුමනි, හැන්දෑවේ හයට අගමැති දිවුරුම් දෙන්නේ. ඒකත් කලා. මේ සභාවේ මම කතා කරපු දේවල් බොරු නෙමෙයි ඇත්ත වෙලා තියෙනවා. ඒවා එකක්වත් බොරු වෙලා නැහැ. මම දැන් එක්සත් ජාතික පක්ෂයෙන් නෙරපලා ඉන්නේ. සමගි ජන බලවේගය විදිහට අපි ශක්තිමත්ව ඉදිරියට යනවා. ජනතාව කොතනද ඉන්නේ, ඒ මතයට අපි යනවා. අද ජනතාවගේ අදහස අනුව තමයි සමගි ජන බලවේගය කටයුතු කරන්නේ. ඔබතුමා මේ අගමැතිකම ගන්න කියලා, ජනතා මතය වෙනස් කරන්න අමාරුයි. මුළු රටේම ජනතාව අද එක ස්ථාවරයක ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ යම් මට්ටමක ජනතාවත් එක්ක ඉන්නවා. අද ජනතාව නොවිදිනා දුක් විදිනවා. බඩවියත ගැටගහගන්න. අපේ දේශපාලඥයන්ට, තමන්ගේ බලය වෙනුවෙන් මිනිස්සු මැරුනත් කමක් නැහැ. ඒක තමයි ඇත්ත කතාව.

අවසාන වශයෙන් සභාපතිතුමනි, මැලිබන් එකට වැටෙන, අර දොරණුවිල පාරේ බෝක්කුවක් දාන්න කානුවක් කපල තියෙනවා. මේ කානුවේ මේ වන විට තුන් දෙනෙක් වැටිලා තියෙනවා. බයිසිකල්කාරයෝ වැටිලා. කොරිපස් හෝ පස් ටිකක්වත් දාලා, ඒවා ගොඩ කරලා දෙන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා**

ගරු මන්ත්‍රීවරුනි, මම මුලින්ම සුබ පතනවා. අද අලුතින් පත් වී ආ මන්ත්‍රීතුමියට. නවක මන්ත්‍රීතුමියක් වශයෙන් දිවුරුම් දීලා, සභාවෙ අසුන්ගෙන සිටිනවා. ඒ වගේම ගිය සභා වාරයේදී, එතුමියගේ ස්වාමිපුරුෂයා ගරු මන්ත්‍රීවරුන්ට එරෙහිව, පාලනයට එරෙහිව, පාරෙ ඉඳගෙන, අපි හොඳ නැහැ. සභාවෙ පාලනය හොඳ නැහැ. ක්‍රමය වැරදියි. ගෝඨා ගෝ හෝම්, මහින්ද ගෝ හෝම් කියලා උද්ඝෝෂණය කරලා, අද දෛවයේ සරදමකට හෝ සුභාෂි මන්ත්‍රීතුමිය නියෝජනය කරන ප්‍රදේශය නියෝජනය කරමින්, ගරු මන්ත්‍රීවරියක් වශයෙන් පත්වීම පිළිබඳව, අපි එතුමාට සිහි කැඳවන්න ඕන. ඒ වගේම දීරස දේශපාලන ගමනක් යන්න තරඟයට ඉදිරිපත් වෙලා, ඡන්දයෙන් දිනලා, කොට්ඨාස මන්ත්‍රීතුමිය වෙන්න. ඒ වගේම ඉන් එහාට පළාත් සභා මන්ත්‍රීවරියක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් වෙන්න එතුමියට ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියලා සුභාශිංෂණ මේ අවස්ථාවේ පුද කරනු ලබනවා.

ඒ වගේම අද සභාවට නොපැමිණි දිසානායක මහතා, පතිනායක මන්ත්‍රිතුමා වනිගරත්න මන්ත්‍රීතුමාගේ නොපැමිණීම පිළිබඳව අපට දැනුම් දීමක් කරලා තියෙනවා. ඒ සියලු දෙනාට නිවාඩු අනුමත කර දෙන්න කියලා, මම ගරු සභාපතිතුමාට සිහිපත් කරනවා.

ඊළඟට විශේෂ කාරණය වන්නේ, සභාව නියෝජනය කරමින්, අපේ සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමියටත්, ලක්රුවන් මන්ත්‍රීතුමාටත්, දිසානායක මන්ත්‍රීතුමාටත්, ඒ ප්‍රදේශවල අපේ ගම්වල ජීවත් වන අහිංසක දේශපාලන නායකයින්ට ඇති වූ අපහසුතාවය පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ වගේම ඒ සිදු වූ අලාභය පිළිබඳව අපට කියලා නිම කරන්න බැහැ. මුළු ජීවිත කාලයක් තමන් රැක ගත්ත ඒ දේ, ඉතා දුක්මහන්සියෙන් ගොඩනගාගත් ඒ දේ තමයි විනාශ කළේ. සුභාෂි මන්ත්‍රීතුමිය, තම සහෝදරයන් සමග ජීවත් වෙලා හිටියෙ ඒ ගෙදර. ඒ වගේම, ලක්රුවන් මන්ත්‍රීතුමා පුද්ගලිකව, ඒ පවුල, දරුවන් සමග ජීවත් වුණේ තමන්ගේ නිවස. තමන්ගේ වටපිටාව, තමන්ගේ පවුල් සංස්ථාව ගොඩනඟන්න ඉතාමත් මහන්සි වෙච්ච මන්ත්‍රීවරයෙක්. ඒ වගේම බොහෝ කාලයක් තිස්සේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දූෂිතයි , හොරු , වංචනිකයි කිව්වට, අපි දන්නවා. ඒවා වාචික ප්‍රකාශ විතරයි. එහෙම දේවල් මේ සභාවල කරන්න බැහැ. ඒක මේ පරිපාලන සේවාව දන්න අය දන්නවා. මේ හිටපු සභාපතිවරු දෙපලක් මෙතන ඉන්නවා. ඒ අයත් දන්නවා. කෙනෙක්ගෙන් පුද්ගලික ඉල්ලීමක් ඉල්ලුවොත් මිසක්, හොරට බිල් දාලා හොරට චෙක් දාලා මුදල් ගනුදෙනු කරන්න හැකියාවක් නැහැ. මේ ක්ෂේත්‍රය තුළ කෙනෙක් දුක් මහන්සියෙන් හම්බ කරපු දේවල් නැතිවුණා. ඉතා කෙටි කලක් තුළ, ක්ෂණයක් තුළ ඒවාට සම්බන්ධ වූ අයත් ඒවාට අනුගත වෙච්ච අයත්, ඒවට අනුකූලතාවය දක්වපු අයත්, සම්බන්ධයෙන් මම හෙලා දකිනවා. අපේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා කිහිපදෙනෙක් කොළඹ ගියා. මට අත්‍යවශ්‍ය කාරණයක් නිසා සහභාගි වෙන්න බැරි වුණා. ඉතිහාසයේ මට මේ වගේ අවස්ථාවන් දෙකකටයි යන්න බැරි වුනේ. හැම දේශපාලන ක්‍රියාවකටම, උත්සව සංවිධානවලට 1991 අපි පාසලෙන් අවුට් වෙච්ච ගමන් ඉඳලම, හැම දේශපාලන ක්‍රියාවකටම මට කොළඹ එන්න කිව්වා නම්, අපේ දේශපාලන නායකත්වයෙන්, ඒක දේශපාලන රැස්වීමක්ද, එහෙම නැත්නම් මැයි දින පෙලපාලියක්ද අපි හැමදේටම සම්බන්ධ වෙලා තියෙනවා. අපේ මන්ත්‍රීවරු වෘත්තිය සමිති රැස්වීමක් තියෙනවා කියලා මට ආරාධනා කළා. මගේ අසනීප තත්ත්වයක් නිසා මට එදා සහභාගි වෙන්න බැරි වුණා. ඒ වගේම පසුගිය නම වැනිදා ළඟම ඉන්න තරුණයෙක්ගේ විවාහ මංගල උත්සවයක් නිසා, දාලා එන්න විදිහක් නැති නිසා, මම නොගියේ. නැත්නම් මමත් අනිවාර් යෙන්

ඔතනට යනවා. හැබැයි අපි ගියාට, මැර ක්‍රියාවලට සම්බන්ධ වෙන්නේ නැහැ. කොළඹට ගිහිල්ලා අපි කෙනෙක් අපහසුතාවයට පත් කරලා, අරගලයකට ගහලා, අපට ගමට එන්න බැහැ. කොහේදි හරි අපි කොටු වෙනවා. දැන් කාටත් අවබෝධ වෙච්ච ආකාරයට යම් පිරිසක් මේ දේ කලා. ඒ අවට අය ඉඳගෙන කලින් සංවිධානය, කතාබහ කරගන්න ඇති. ඒ අවස්ථාවේ දී කතාබහ කරගන්න ඇති. විවිධ සංග්‍රහ කරන්නත් ඇති. අපේ මන්ත්‍රීවරුන්ට දේශපාලන නායකයෙක් නිසා අපහසුතාවය විඳින්න අපට හැකි වුණේ. ඒ තත්ත්වය නිසා තමයි මන්ත්‍රීවරුන්ගේ ගෙවල් අසූවක් විතර විනාශ කරල තිබෙනවා. සාමාන්‍ය නිවස එකසිය ගානක් විනාශ කරළා තියෙනවා. රාජ්‍ය සම්පත් විනාශ කරලා තියෙනවා. රජයේ කාර්යාලවලට ගහලා තියෙනවා. ඒ වගේ විවිධ දේවල් මේ අය කලා. ජනතා විමුක්ති පෙරමුණ, පෙරටුගාමී පක්ෂය හිතනවා නම් මේක නමවෙනි ද වෙච්ච සිදුවීමත් එක්ක වුනයි කියන එක, ප්‍රතික්ෂේප කරනවා. මම දන්නවා අප්‍රේල් මාසේ අරගලය පටන් ගත්තට පස්සේ, මගේ ගමේම හතරදෙනෙක් FB හරහා තාමත් තරජනය කරනවා. මගේ එකවුන්ට් එකක් නැහැ. මම ළඟ සාමාන්‍ය ෆෝන් එකක් තියෙන්නේ. මගේ හිතවත් පුතෙක් මගේ නමින් එකවුන්ට් එකක් පවත්වාගෙන යනවා. ජනතා විමුක්ති පෙරමුණ සහ ප්‍රබලම එක්සත් ජාතික පක්ෂ සාමාජිකයෙක් දෙන්නෙක් සම්බන්ධයි. මේ හතර දෙනා මීට මාස දෙකකට කලින් ඉඳලා, මගේ ගෙට ගහන්න ඕන, මරන්න ඕන, කියලා කියනවා. මේක 09 වෙනිදා නෙවෙයි. ඊට කලින් ගම් වල ඉන්න පුද්ගලයා පටන් ගත්තා. දැන් සුහාෂි මන්ත්‍රීතුමියට යම් තරජනයක් තියෙන විත්තිය, ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීවරයාට ගමේ තරජනයක් තිබෙන බව, මම මේ අජිත් මහත්තයත් එක්ක දිගින් දිගටම කතා කළා. සුහාෂි මන්ත්‍රීතුමියට මේ ප්‍රශ්නය 09 වෙනි දා පටන් ගත් එකක් නෙවෙයි. එදා මෙතනට පෙළපාලි ගෙන්නුවා. ඒකට වක්‍රව ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ වුණා 9.00 වෙනකොටම ඔබතුමා කියනවා. ඔන්න ගහන්න එනවා. මෙතුමන්ලා දෙපළ සැරින් සැරේ ගිහින් මේක මෙහෙව්වා. මේකෙ අතුරු ප්‍රතිපල තමයි මේ ලැබුණේ. අපි එදා කිව්වා. ඒකෙ නායකත්වය ගන්න එපා කියලා. නමුත් මේ නායකත්වය ගැනීමෙන් තමයි මේ සියල්ල සිදු වුනේ. ඉතින් අද 88 89 යුගයට අපි ආවා. මේ යුගය නොදැක්කා තරුණයින්, තරුණියන් මේක දැක්කා. ගොඩක් තරුණයින් 88, 89 භීෂණය දන්නෙ නැහැ. 1971 කැරැල්ල ද දන්නේ නැහැ. චන්ද්‍ර සහබන්දු මන්ත්‍රිතුමා වගේම අපිත් පිටිපස්සේ දොරෙන් ගිහිල්ලා, හේන් වල, මඩු වල හිටියේ. අපේ ගේ ගාවින් එකොළොස් දෙනෙක් ගිහිල්ලා, ස්වාමීන් වහන්සේ කෙනෙකුත් ඝාතනය කරලා, ගෙවල් දෙකකට පැනලා, ඒ අයත් උස්සගෙන ගිහිල්ලා, තවමත් සොයා ගත නොහැකි ලෙස තුන්දෙනෙක් අතුරුදහන් කලා. නමුත් ඒ අවස්ථාවේ අපේ ග්‍රාමෝදය සභාපතිට පන්සලෙ ඉඳලා, ගමේ ප්‍රජා සේවාවක් කරපු හැම කෙනෙක්ම නැති කළා. මේ අවස්ථාවේ රට විනාශ වෙලා තියෙන්නෙ. නමුත් ඒ ක්‍රියාවලියයි, මේ ක්‍රියාවලියයි දෙක වෙනස්. අපි ඡන්දය එයාලට දීලා මේ පසුගිය කාලය තිස්සේම දැඩි අපහසුතාවයක් වින්දා. මහින්ද රාජපක්ෂ මහතාට අගමැතිකම දීලා, ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපතිකම දීලා, මේ රට හදන්න කටයුතු කළා. ඒ කටයුත්තේ දී අපි විශාල කාර්යයක් කළා. ඒක බලන් ඉන්න බැරි පිරිසක් හිටියා. ගෝඨා ගෝ හෝම් කියන බොහෝ අය බේරුණේ කොරෝනා එන්නත් දෙක ලබා දීම නිසා. අද පාරට බහින්න පණ තිබුණා. ඒ නිසා මෙරට මිනී ගොඩක් කරන්න හිතපු අයට, කියන්න තියෙන්නේ, මේ එන්නත් නුදුන්න නම්, රටක් නැහැ. මිනිස්සු නැහැ. නමුත් අපට හැකියාවක් තිබුණේ නැහැ. මිනිස්සුන්ට අවශ්‍ය කලමනා ටික ලබා දෙන්න. කරුණු හතරක් නිසා අපේ ආණ්ඩුව ෆේල් වුණා. අපි කිව්ව දිගින් දිගටම, අපට ගමට මුහුණ දෙන්න බෑ. ගමේ ජනතාවට මුහුණ දෙන්න බැහැ කියලා. වහාම මේ ආණ්ඩුවෙන් මහින්ද රාජපක්ෂ ඉවත් කරන්න කියලා මතයක් අපේ ගම්වල ජනතාවට තිබුණා. සමූහ ආණ්ඩුවක් හදලා මේ රට ගොඩනගන්න අනුබල දෙන්න ඕන. ඒකට නායකත්වය, සහයෝගය දෙන්න ඕන කියන මතයේ අදත් හෙටත්, අපි තාමත් ඉන්නවා. ඒ නිසා මේ නව රජයක් බිහි වෙලා තියෙන්නේ. ඒ වගේම තනි පුද්ගලයෙක් වශයෙන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, අගමැති වීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා අපි එතුමගේ කකුලෙන් අදින්නේ නැහැ. අනිකුත් පක්ෂවල නායකයෝ අරගලයට පාරට බැස්සට සත පහකට ගණන් ගත්තේ නැහැ.

කවුරුත් හිතෙනවනම්, මේ පාරට බැස්සේ රට ගොඩනගන්න කියලා. නමුත් අද රටේ මතයක් තියෙනවා 225ට ම රට කරන්න දෙන්නේ නැහැ කියලා. විවිධ පක්ෂ වල සියලු දෙනාට අවස්ථාව දෙන්න. මාස තුන හය දෙකහමාරක් මේ සියලු දෙනාගේ ආණ්ඩුවට සියලුදෙනාම සහයෝගය දිය යුතුයි. එනිසා අපි මතයක ඉන්නවා අනිවාර්යයෙන්ම පොහොට්ටුව නියෝජනය කරන මන්ත්‍රීවරු වශයෙන් මේකට සහයෝගය දෙන්න ඕන. අපි මේ දේශපාලන නායකයින්ට කියන්නේ කකුලෙන් අදින්න යන්න එපා. අද පෝලිම් වල ඉන්න අයට, අපි කියන්නේ ඔවුන්ට අවස්ථාවක් දෙන්න කියලා. ගමට ගියහම වැඩි දෙනාගේ මතය නියෝජනය කරමින්, මේ අපහසුතාවය විඳගන්න, මේ දුක් විඳගන්න කාලයක් දීලා, මේ කරල බලමු යන මතයේ අපි තාමත් ඉන්නවා. ඉතින් ඒ සඳහා ඔබේ සුභ පැතුම් එක් කරමින්, අපේ ශක්තිය ධෛර්යය අපේ දේශපාලනය වශයෙන් අරගෙන අපි කටයුතු කරමු. මේ ආණ්ඩුව රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු සියලු දෙනා එක්ව කළොත්, ඒ ප්‍රශංසාව ඇති වෙයි. පාට පක්ෂ භේදයක් අමතක කරලා, හැමෝම එක්ක රට ගොඩ නඟා නගා සිටිමු. අද පත්වූ නව කැබිනට් මණ්ඩලයට ඒ අපහසුතා විඳගෙන, රට කරගෙන යාමට හැකියාව ලැබේවායි කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, මෙම උප සභාපතිතුමා කිව්වා එදා මෙතැන තිබුණු උද්ඝෝෂණයට, අපි සහයෝගය දැක්වුවා කියලා. මෙතැනට ආවේ නාගොඩ මිනිස්සු. අපි අඳුරන අය. අපට සම්බන්ධ වුණේ මේ සභාවේ මන්ත්‍රීවරුන්ට යම් හානියක් කරදරයක් කරන්න එපා කියලයි. අපි ඒ උද්ඝෝෂණවලට හවුල් වෙලා සටන්පාඨ කිව්වේ නැහැ. මම පහලට බැහැලා කිව්වා. ඒ අයට මේකෙ ඇතුලට එන්න එපා. පාරෙ ඉඳගෙන ඕනම දෙයක් කියන්න කියලා. ඒකයි මමයි, ජයවීර මන්ත්‍රීතුමයි සම්බන්ධ වුණේ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

සභාපතිතුමනි, මටත් මෙතුමා නම සඳහන් කරලම කිව්වා. අපි දන්නවා ඒ වැඩ කරන්නත්. හැබැයි එවැනි තුප්පහි වැඩ අපි කරන්නේ නැහැ. ඇත්තටම මෙතුමා කිව්ව වගේ මෙතැනට ආවේ නාගොඩ අවට කට්ටිය. එනිසා ඔබතුමා එය ඉල්ලා අස්කර ගන්නා ලෙසත්, මෙය වාර්තාගත කරන ලෙසත්, මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, සභා ඉතිහාසයේ දීර්ඝවම ඇදීගිය සභා වාරයක් හැටියට අද සභාවාරය හඳුන්වා දෙන්න කැමතියි. මේකට හේතුව වන්නට ඇත්තේ පසුගිය දිනවල රටේ ඇති වූ දේශපාලනික වූ කලහාකාරීන් කළ විනාශයක් නිසා යැයි මම සිතමි. ගරු මන්ත්‍රීවරුනි, මැයි මාසය කිව්වම මට දැනෙන්නේ බෞද්ධයන් හැටියට, වෙසඟේ අසිරිය. නමුත් මෙදා අපට දැනුනේ වෛරයේ අසිරිය. බුදුහාමුදුරුවන් දේශනා කළේ, ඉරිසියාව, ක්‍රෝධය, වෛරය නැති කිරීම පිළිබඳව. දේශපාලකයෝ කරන්නේ ඉරිසියාව, ක්‍රෝධය, වෛරය වැපිරීම. මෙන්න මෙතන තමයි අපට වැරදිච්ච තැන.

අපේ රටට තවත් වැදගත් කරුණු තමයි 2003 මැයි, 2009 මැයි, 2012 මැයි ගංවතුර තත්වය. ඒ අතරින් 2003 හා 2017 අපේ රටට මහා විපත් ගෙන දුන් ගංවතුර උවදුර වුණේ මැයි මාසයේ. ඒ වගේම 2019 මැයි, (දැන් සියල්ලට අමතක වුනාට) ලෝකෙම භයානක ත්‍රස්ත සංවිධානය වූ එල්ටීටීඊ කොටි සංවිධානය විනාශ කර, රට නිදහස් කර ගත් මාසය, මැයි මාසය. එයට නායකත්වය දුන් වර්තමාන අගමැති, මහින්ද රාජපක්ෂ මැතිතුමා, වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. ඔවුන් දරන තනතුරුවලින් ඉවත්වන්න යැයි රටේ පිරිසක් අරගල කරන මාසය. මෙවැනි වටපිටාවක තමයි අද දින සභාව පැවැත්වෙන්නේ.

ඒ වගේම තමයි ගරු මන්ත්‍රීවරුනි, අපි කිසිවකු නොසිතූ සහ බලාපොරොත්තු නොවූ, කිසිදු සිතක් ඇති මිනිසුන් අනුමත නොකරන, ම්ලේච්ඡ ක්‍රියා මෙන්ම, දේපල විනාශ කිරීමක් සිදු වුණෙත් මේ මාසයේ. එය මෙම සභාවටත් විශේෂත්වයක් වනවා. ඒ තමයි අපගේ ගරු මන්ත්‍රීවරු දෙපළක් වන, ලක්රුවන් මන්ත්‍රීතුමාත්, සුභාෂි මන්ත්‍රීතුමියගේ දෙමව්පියන් ජීවත්වන නිවසත් යම් පිරිසක් විසින් විනාශ කිරීම. මෙහිදී මෙම මන්ත්‍රීවරුන්ගේ දේපළ මෙන්ම එතුමන්ලාගේ පවුල් වලට වූ දේපළ හානිය මෙන්ම මානසික හානිය මෙතෙකැයි කියා මිල කිරීමක් අපට කරන්න බැහැ. ඒ පිළිබඳව අපි සභාවක් හැටියට සහෝදර මන්ත්‍රී දෙපලට හා පවුල්වල අයට කනගාටුව ප්‍රකාශ කරන ගමන්, මේ පිළිබඳව ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වූ වගකීමක් ගන්නා බවත් සඳහන් කරනවා. පෞද්ගලිකව මට හිතුනා. අපි ඉන්න ලෝකය මොකක්ද කියලා. අපි මොනවද කරන්නේ කියලා. මේ මන්ත්‍රීවරු මොන වැරැද්ද ද? රටට ගමට කරල තියෙන්නෙ කියලා. ඒවායේ එම ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගේ හිතවත් පාක්ෂිකයින් කිහිපදෙනෙක් නිවාස වලට දැඩි අලාභහානි කරල තියෙනවා. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් විය යුතුමයි.

ගරු මන්ත්‍රීවරුනි, මේ දේ වුනේ අපි පසුගිය 09 වන දින අරලියගහ මැදුරේදී අපිව කැඳවා තිබුන, රැස්වීමට ගියා. එහිදී ඇයි අපට එහෙම යන්න බැරිද? ගරු මන්ත්‍රීවරුනි, රටේ ඕනෑම තැනක යෑමට අයිතිය මෙන්ම, කෙනෙකුට තමන් කැමති දේශපාලන මතිමතාන්තර දරන්න අයිතියක් තිබිය යුතුයි. එක්සත් ජාතික පක්ෂ මතවාදය, සමගි ජන බලවේගයේ මතය ඒ අයට තිබිය යුතුයි. ජනතා විමුක්ති පෙරමුණ මතය, ඒ අයට තිබිය යුතුයි. පෙරටුගාමීන්ගේ මතය ඒ අයට තිබිය යුතුයි. පොදුජන පෙරමුණේ මතය ඒ අයට තිබිය යුතුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය ඒ අයට තිබිය යුතුයි. මේ මතවාදවල්, සමහර අයට නොගැලපෙනවා ඇති. නමුත් මේ හැම පක්ෂයකම මතය වන්නේ රටේ යහපතට මිසක් අයහපත් නොවන බව අපි කවුරුත් දන්නවා. නමුත් බලයට ආපසු තමයි තේරෙන්නේ අපි කියපුවා කරන්න බැරි බව. මේ සභාවේ එහෙම මමත් පළමුවෙන්ම මන්ත්‍රී වුනහම හිතුනා. ලොකු දේවල් කරන්න. නමුත් බැරි වුණා. ඊළඟට හිතුවා සභාපති වුනානම් පුළුවන් කියලා. අද දින අපේ මන්ත්‍රීවරු කිහිපපළක් පෙර සේම අසාර්ථක සභාපති කෙනෙක් කියලා මට දෝෂාරෝපණය කළා. මම වැඩිය ඒ ගැන කියන්න යන්නේ නැහැ. මෙම සභාවේත් ඉන්නවා හිටපු සභාපතිලා දෙන්නෙක්. ඒ අයත් සාක්ෂි දරාවි. ඇත්ත නැත්ත මොකක්ද කියලා. වර්තමාන උප සභාපතිතුමත් දන්නවා. එතුමා සභාපතිවරු 4 දෙනෙක් සමග කටයුතු කරපු නිසා. ළිඳේ ඉන්න මැඩියා දන්නෙ ළිඳ ඇතුල විතරයි. අවට ළිංවල තත්ත්වය දන්නේ නැහැ. ඒ වගේම තමයි අපේ සමහර මන්ත්‍රීවරුන් වටේ පිටේ සභාවලින් අහල බලන්න තත්වය. වර්තමානයේ මේ සිදුවන ඛේදවාචක වලට මේ දේශපාලන ක්‍රමයත් වග කියන්න ඕන. පත්වන සෑම රජයක්ම කරන්නේ තමන්ගේ අනන්‍යතාවය රැකගන්න උත්සාහ කරන එක. රාජ්‍ය ප්‍රතිපත්තියක් නැහැ. බලන්න දියුණු රටවල් දිහා. ඒවායේ රජයන් වෙනස් වුණාට, ප්‍රතිපත්ති වෙනස් වෙන්නේ නැහැ. පෙර රජය නවත්තපු තැන සිට, ඉදිරියට සංවර්ධන ක්‍රියාදාමයන් කරගෙන යනවා. මේ රටේ ඊට හාත්පසින් වෙනස් දේ වෙන්නේ. නායකයො වෙනස් වන විට ප්‍රතිපත්තීන් වෙනස් වෙනවා. බලන්න අපේ ඡන්ද ක්‍රමය. අදත් මන්ත්‍රීවරු කිහිප දෙනෙකු ප්‍රකාශ කළා. සභාවෙන් විය යුතු දෙය ඉටු නොවුන කියලා. හිටපු සභාපතිලා නම් කෙරුවා කියලා. ගරු මන්ත්‍රීවරුනි, මමත් 2002 ඉඳලා මේ සභාව පිළිබඳව හොඳ වැටහීමක් තියෙනවා. මමත් සභාපතිවරු තුන්දෙනෙක් යටතේ මන්ත්‍රීකම් දැරුවත්, අපි සභාවෙන් කරනකන් හිටියේ නැහැ. දේශපාලන නායකයින්ගෙන් මූලා ප්‍රතිපාදන ලබාගෙන, ගමට වැඩ කළා. අහන්න මේ ඉන්න හිටපු සභාපතිවරුන්ගෙන් අපට දුන්නේ මොනවද කියලා. නමුත් අපි එම සභාපතිවරු විවේචනය කරලා නැහැ. අපි දන්නවා ඇතුළාන්තය. නන්දන මන්ත්‍රිතුමා කියනවා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට බල්බ් එකක්වත් දාගන්න දෙන්න කියලා. අලුතින් වීදි ලාම්පු සවි කරන විට, මම කියලා තියෙන්නේ, බල ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගේ අධීක්ෂණයෙන් සහ ඉල්ලීම් වලට අනුව කටයුතු කරන්න කියලා. සමහර මන්ත්‍රීවරු තම තමන්ගේ හදවතට තට්ටු කරල බැලුවොත්, මෙතනදී ප්‍රකාශ කරන ඒවත්, මා සමග පෞද්ගලිකව කතා කරන ඒවත් අතර වෙනස. මම කිසිවෙක් පාවා නොදීම, යටගියාව හාරා

ඇවිස්සීම නොකිරීම. නමුත් ඒකත් මගේ අඩුපාඩුවක් දැයි කියා සිතෙන වාර අනන්තයි. මේ හැම දේටම මුල ප්‍රාදේශීය සභාව දරාගන්න බැරි නියෝජිතයන් පිරිසක් පත්වීම. සභාවේ සම්පත් බෙදී යන්නේ මන්ත්‍රීවරු අටක් දහයක් වැනි ප්‍රමාණයකට. අද විසි හත් දෙනෙක් ඉන්නවා. නමුත් සභාවේ ආදායම පෙර සේමයි. ඒ අනුව තමයි මේ කියන අඩුපාඩු සිදු වන්නේ. මන්ත්‍රීවරුනි, මේ සභාව හෙට වුනත් විසුරුවනවා නම් මමත් කැමතියි. දුක, මා බලාපොරොත්තු වුණ සහ සභා බල ප්‍රදේශයට අත්‍යවශ්‍යම අංගයක් වුණ ආදාහනාගාරයේ වැඩ කටයුතු නිම කිරීමට නොහැකිවීම පිළිබඳව. කෙසේ නමුත් අපි මෙහි මන්ත්‍රීධුර දැරුවත්, නොදැරුවත් එහි ඉතිරි වැඩකටයුතු අවසන් කර, ජනතා අයිතියට පත් කරන්න, මූලිකත්වය ගෙන කටයුතු කරන්න, පැකිලෙන්නේ නැහැ. ඒ වගේම සහබන්දු මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ කරුණක් වන, ඇප්තොප්වත්ත අක්කර පහ ඉඩමේ කුරුඳු වගා කිරීම ඉදිරි මාසයේ සිදු කිරීමට උත්සාහ ගන්නවා. මන්ද මේ දිනවල කුරුඳු පැල වල හිගයක් පවතින බව, ඒ සම්බන්ධ නිලධාරීන් පැවැසුවා.

ඒ වගේම මේ නවක මන්ත්‍රීවරිය, මා ඉදිරියේ දිවුරුම්දී, සභාවේ අසුන්ගෙන ඉන්නේ. පළමුව මම එතුමියට සුබ පතනවා. එතුමියගෙ පක්ෂය හැටියෙන් නියෝජනය වන්නේ ,මම සභාවේ ගම් සභාපතිවරයෙකු හැටියට මෙන්ම, රජයේ හිටපු වෙළෙඳ හා නාවික ඇමැති, දකුණු පළාත් ආණ්ඩුකාරවර එම්.එස්.අමරසිරි ඇමැතිතුමාගේ පුතණුවන් වන උපාලි අමරසිරි මැතිතුමා නායකත්වය දරණ, එක්සත් ජාතික නිදහස් පෙරමුණයි. මෙම මන්ත්‍රීතුමිය නියෝජනය කරන්නේ ගම්මැද්දේගොඩ බල ප්‍රදේශය. එම ප්‍රදේශයේ මන්ත්‍රීවරිය වන සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමියගේ ඥාතිවරියක්, සේම අල්ලපු නිවාස වල පදිංචි අය. ඔබ දෙපල සහයෝගයෙන් සමාජ සේවාවන් වල නිරත වෙනවා දැකීම තමයි අපේ බලාපොරොත්තුව. මම හිතනවා මෙතුමිය මීට මාසෙකට කලින් මන්ත්‍රීතුමිය වූවානම්, සුභාෂි මන්ත්‍රීතුමියගේ දෙමවුපියන්ගේ නිවසට හානි කිරීම වළක්වා ගන්න තිබුන කියලා. මොකද මෙතුමිය ගිහිල්ලා හරි පැමිණි පිරිසට විරෝධය දක්වාවි. ඒ සියළු දේවල් දැන්වී හමාරයි. අපට කණගාටුවක්, දුකක් පමණයි ඉතිරි. කොහොම නමුත් මේ අර්බුද මැද වුවත් අද දින සභාව සාර්ථකව කර ගෙන යාමට සහය දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වෙමින්, සභාව මෙසේ අවසන් කරමි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:-